ISSN 1391-0000

# පුස්තකාල ප්‍රවෘත්ති

## LIBRARY NEWS நூலகச் செய்திகள்

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ ප්‍රවෘත්ති ප්‍රකාශනය

தேசிய நூலக, ஆவணவாக்கல் சேவைகள் சபையின் செய்திப் பிரசுரம்

The Newsletter of the National Library of Sri Lanka



ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
33 වන සංවත්සරය
தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபை
33 ஆவது ஆண்டு நிறைவு விழா
National Library and Documentation Services Board
33rd Anniversary
1970-2003

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය
13 වන සංවත්සරය
தேசிய நூலக ஆவணவாக்கல் மத்திய நிலையம
13 ஆவது ஆண்டு நிறைவு விழா
National Library and Documentation Centre
13th Anniversary
1990-2003

විශේෂ කලාපය
விசேட வெளியீடு
Special Issue

23 වන වෙළුම 4 කලාපය හා 24 වන වෙළුම 1 කලාපය
2002 ඔක්තෝබර් - දෙසැම්බර් හා 2003 ජනවාරි - මාර්තු
மலர் 23 இதழ் 4 - மலர் 24 இதழ் 1
ஒக்ரோபர் - டிசெம்பர் 2002 - ஜனவரி - மார்ச் 2003
Volume 23 No. 4 & Volume 24 No.1
October - December 2002 & January - March 2003

# පුස්තකාල ප්‍රවෘත්ති

## LIBRARY NEWS நூலகச் செய்திகள்

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ ප්‍රවෘත්ති ප්‍රකාශනය

தேசிய நூலக, ஆவணவாக்கல் சேவைகள் சபையின் செய்திப் பிரசுரம்

THE NEWSLETTER OF THE NATIONAL LIBRARY OF SRI LANKA

ආරම්භය 1973 - Commenced 1973 - ஆரம்பம் 1973



23 වන වෙළුම 4 කලාපය හා
24 වන වෙළුම 1 කලාපය
2002 ඔක්තෝබර් - දෙසැම්බර්
2003 ජනවාරි - මාර්තු



සංස්කාරක උපදේශක මණ්ඩලය

මහාචාර්ය තිස්ස කාරියවසම
**සභාපති**

එම්. එස්. යූ අමරසිරි
අධ්‍යක්ෂ ජනරාල්

ඩබ්.එස්.පුන්‍යවර්ධන
නියෝජ්‍ය අධ්‍යක්ෂ

සංස්කාරක මණ්ඩලය
එම්.ඩී.වැවලආරච්චි
පද්මා බණ්ඩාරනායක
උදිත අලහකෝන්
සුජීව හීන්කෙන්ද

සහාය සංස්කාරක
පී.එල්.උපුල් ජයන්ත

පරිගණක අක්ෂර සංයෝජනය
පී.එස්.කේ.ලියනගේ
එස්. වානි

මුද්‍රණය
පියසිරි ප්‍රින්ටින් සිස්ටම්ස්



**ප්‍රකාශනය**
ප්‍රකාශන අංශය
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
අංක 14, නිදහස් මාවත, කොළඹ 07
ශ්‍රී ලංකාව



දුරකථනය : 2687583
2698847- දිගුව 261
ෆැක්ස් : 94- 011 - 2685201
ඊ මේල් : pub@mail.natlib.lk
වෙබ් අඩවිය : www.natlib.lk



ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
2003



කලාපයක මිල රුපියල් 25.00
US $ 2.50
වසරක දායක මුදල රුපියල්
100.00

චෙක්පත් හා මුදල් ඇණවුම "සභාපති, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය" නමට යොමුකරන්න



மலர் 23 இதழ் 4
மலர் 24, இதழ் 1
ஒக்ரோபர் - டிசெம்பர் 2002
ஜனவரி - மார்ச் 2003



பதிப்பாசிரியர் ஆலோசனைக்குழு

பேராசிரியர் திஸ்ஸ காரியவசம்
தலைவர்

எம்.எஸ்.யு. அமரசிறி
பணிப்பாளர் நாயகம்

டபிள்யு. எஸ். புண்ணியவர்தன
பிரதிப் பணிப்பாளர்

பதிப்பாசிரியர் குழு
எம்.டி வேவல ஆராய்ச்சி
பத்மா பண்டாரநாயக்க
உதித்த அழகக்கோன்
சுஜீவ ஹீன்ஹெந்த

உதவிப் பதிப்பாசிரியர்
பி. எல். உபுள் ஜயந்த

கணினி வடிவம்
பீ.எஸ்.கே. லியனகே
எஸ். வாணி



அச்சிட்டு வெளியிடல்
வெளியீட்டுப் பிரிவு
சிறீ லங்கா தேசிய நூலகம்
தேசிய, நூலக ஆவணவாக்கல் சேவைகள் சபை, சுதந்திர வழி, கொழும்பு 07, சிறீ லங்கா



தொலைபேசி : 2687583
2698847- 261
பெக்ஸ் : 94-011-2685201
இ.மெயில் : pub@mail.natlib.lk
வெப் தளம் : www.natlib.lk



தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபை



பிரதியின் விலை ரூபா
25.00 $2.50
ஆண்டுச் சந்தா ரூபா. 100.00
சகல காசோலைகளும், தபால் கட்டளைகளும் தலைவர்
தேசிய நூலக, ஆவணவாக்கல் சேவைகள் சபையின் பெயருக்கு எழுதப்பட வேண்டும்.



Volume 23 No. 4 &
Volume 24 No. 1
October - Desember 2002 &
January - March 2003



**Editorial Advisory Board**

Prof. Tissa Kariyawasam
**Chairman**

M.S.U. Amarasiri
**Director General**

W.S.Punyawardana
**Deputy Director**

**Editorial Board**
M.D.Wewalaarachchi
Padma Bandaranayake
Uditha Alahakoon
Sujeewa Heenkenda

**Asst. Editor**
P.L.Upul Jayantha

**Computer Typesetting**
P.S.K. Liyanage
S. Vani

**Printed by**
Piyasiri Printing Sistems



**Published by**
Publication Division
National Library and Documentation Services Board
No. 14, Independence Avenue
Colombo 07
Sri Lanka



Tel : 2687583
26 98847 - Ext. 261
Fax : 94 -011 - 2685201
e mail : pub@mail.natlib.lk
web page : www.natlib.lk



National Library and Documentation Services Board
2003



**Price Rs. 25.00 and US $2.50**
Annual Subscription Rs.100
All Cheques and Money Orders should be forwarded to
**Chairman**
**National Library and Documentation Services Board**

# පටුන


- කතුවැකිය — 04
- ගරු මානව සම්පත් සංවර්ධන, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගේ පණිවිඩය — 05
- ගරු පාසල් අධ්‍යාපන අමාත්‍යතුමාගේ පණිවිඩය — 06
- මානව සම්පත් සංවර්ධන අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ පණිවිඩය — 07
- ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ සභාපතිතුමාගේ පණිවිඩය — 08
- Awakening National Library Services
  M S Upali Amarasiri, Director General
  National Library and Documentation Services Board — 9-12, 20
- ප්‍රතිග්‍රහණ අංශය
  අමරා නානායක්කාර — 14-17
- පාඨක සේවා අංශය
  එම්.බී.ජේ.සෙනෙවිරත්න — 18-20
- සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපන අංශය
  වරුණි ගහබඩආරච්චි — 21-22
- තොරතුරු තාක්ෂණ අංශය
  චමින්ද හිමේෂ් ද සිල්වා — 23, 35
- ග්‍රන්ථ විඥාපන අංශය
  යූ.පී.අලහකෝන් — 24-26
- ප්‍රලේඛන සේවා අංශය
  නාලනී මල්ලවආරච්චි — 27-30
- Library Development Division
  C. Dushyanthi Daniel — 32-34

- Education & Training Division
  Padma Bandaranayake — 36
- ප්‍රකාශන හා ග්‍රන්ථ සංවර්ධන අංශය
  මුදිතා වැවලආරච්චි — 37-38
- இலங்கைத் தேசிய நூலகமானது அதனது பிரதான இலக்கினை அடைந்துள்ளதா? ஒரு விமர்சன நோக்கு
  எம். பீ. எம். பைரூஸ். பிரதான நூலகர், தொகைமதிப்பு புள்ளிவிபரவியல் திணைக்களம். — 39-44
- ජාතික පුස්තකාල පුවත් — 45-47
- වෙනත් පුස්තකාල පුවත් — 47-49
- தேசிய நூலகச் செய்திகள் — 50-52
- திகதி பேருரை விரிவுரையாளர் — 52
- National Library News — 53-54
- Other Library News — 55
- ප්‍රායෝගික පුස්කොල ලේඛන කලාවේ දුර්ලභ ශිල්ප ක්‍රම
  (ජාතික කෞතුකාගාර පුස්තකාලයේ උපාලි ඕ.ප්‍රනාන්දු මහතා විසින් පවත්වන ලද දේශනයක් ඇසුරෙනි) — 56-57

කතුවැකිය

# ජාතියට නැණ නුවණ බෙදන මහා පොත්ගුල

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය තම 33 වන සංවත්සරය සහ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය තම 13 වන සංවත්සරය සමරන මේ මොහොත පොත පත කියවීම අගයන ශ්‍රී ලාංකිකයන් හට ඉතා වැදගත් මෙන් ම අභිමානවත් අවස්ථාවකි.

ශ්‍රී ලංකාවේ සංවර්ධන ක්‍රියාවලියෙහි අභිවෘද්ධිය උදෙසා අවශ්‍ය තොරතුරු සැපයීම මෙන් ම ජාතික ග්‍රන්ථ එක්තැන් කිරීම, සංරක්ෂණය හා ග්‍රන්ථ විඥාපන පාලනය ආදී කාර්යයන් සඳහා ජාතික මට්ටමින් ඇප කැප වූ ආයතනයක් ලෙස ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය හඳුන්වා දිය හැකිය. එමෙන් ම, දේශීය හා විදේශීය තොරතුරු ජාලවලට සම්බන්ධව රටපුරා තොරතුරු බෙදා හැරීමේ කාර්ය භාරයට උර දී ඇති ආයතනයකි.

ජාතික මට්ටමින් ඉටු කෙරෙන්නා වූ පුස්තකාල කාර්ය මණ්ඩල පුහුණු කිරීම හා පුස්තකාල සංවර්ධන කටයුතු මගින් රටෙහි පුස්තකාල උසස් මට්ටමකට ගෙන ඒමට මෙම ආයතනය කටයුතු කරමින් සිටී. පුස්තකාල තුළත්, රටෙහි සාමාන්‍ය පාඨකයා අතරත් ගුණාත්මක බවින් යුතු පොත පත බිහි කිරීම උදෙසා ද ව්‍යාපෘතින් රැසක් පවත්වාගෙන යන අතර, අන්තර්ජාතික ප්‍රමිති අංක ලබා දීමේ ජාතික ආයතනය ලෙස ද කටයුතු කරමින් ප්‍රකාශන ක්ෂේත්‍රයෙහි අභිවෘද්ධිය උදෙසා ද කටයුතු කරයි.

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයත්, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයත් මෙවැනි වූ මහඟු සේවාවන් රැසක් ඉටු කළ ද, වර්තමානයෙහි රටෙහි පවතින ආර්ථික අර්බුදය මෙහි සේවාවන් පවත්වාගෙන යාමට බාධාවක් වී ඇත. අවශ්‍ය ප්‍රමාණයට මුදල් ප්‍රතිපාදන නොලැබීම නිසා ප්‍රකාශන ව්‍යාපෘති ගණනාවක් අත්හිටුවීමට සිදු වීම මෙම ආයතනය මුහුණ දී ඇති ප්‍රධාන ගැටළුවකි. දේශීය ග්‍රන්ථ කතුවරුන් වෙත මූල්‍යමය වශයෙන් හා උපදේශාත්මක වශයෙන් ආධාර සැපයූ ග්‍රන්ථ ප්‍රකාශන ව්‍යාපෘති හා පුස්තකාල සංවර්ධන ව්‍යාපෘති ගණනාවක් මේ අතර වේ.

කෙසේ වෙතත්, පවතින සම්පත් උපයෝගී කොට ගෙන, හැකි උපරිම මට්ටමින් ශ්‍රී ලංකාවේ පුස්තකාල සංවර්ධනය සඳහා මෙන් ම පාඨකයාගේ සුබ සිද්ධිය උදෙසා ද ඇප කැප වී සිටින ආයතනයක් ලෙස ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයත්, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මධ්‍යස්ථානයත් හඳුන්වා දිය හැකිය.

**සංස්කාරක මණ්ඩලය**

# අධ්‍යාපන හා සංස්කෘතික සංවර්ධනයේ දී පුස්තකාල වැදගත් කාර්යභාරයක් ඉටු කරයි




**ආචාර්ය කරුණාසේන කොඩිතුවක්කු**
**මානව සම්පත් සංවර්ධන, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍ය**


රටක අධ්‍යාපන හා සංස්කෘතික සංවර්ධනයේ දී පුස්තකාල වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. 1970 දී ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය පිහිටුවීම හා 1990 දී ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය පිහිටුවීම ශ්‍රී ලංකාවේ අධ්‍යාපන හා සංස්කෘතික ක්ෂේත්‍රයේ වැදගත් සන්ධිස්ථාන වේ.

ශ්‍රී ලංකාවේ විවිධ අංශවල පුස්තකාල පහසුකම් වර්ධනය කිරීමෙහිලා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය පසුගිය දශක තුන තුළ විශිෂ්ට සේවයක් ඉටු කර ඇත. පළාත් පාලන ආයතන, පාසල්, කාර්මික ආයතන, පර්යේෂණ ආයතන, පිරිවෙන් හා රජයේ දෙපාර්තමේන්තුවල පුස්තකාල සේවා සංවර්ධනය කිරීමේ දී එහි කාර්යභාරය අගය කළ යුතු වේ. උපදේශක සේවා පුහුණු වැඩසටහන්, පුස්තකාල ප්‍රමිති සම්පාදනය, පොත් ආධාර ලබා දීම, පුස්තකාල නීති රීති හඳුන්වා දීම, ප්‍රකාශන ආධාර ව්‍යාපෘති, පුස්තකාල ක්ෂේත්‍රය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හඳුන්වා දීම, පුස්තකාල වෘත්තීමය ප්‍රකාශන පළ කිරීම හා වෙනත් ව්‍යාපෘති ගණනාවක් මගින් රටේ පුස්තකාල හා තොරතුරු ක්ෂේත්‍රය නවීකරණය කිරීම සඳහා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය පුළුල් ලෙස දායක වී ඇත. ග්‍රන්ථ විඥාපන, ප්‍රලේඛන හා තොරතුරු බෙදා හැරීම යන ක්ෂේත්‍රවලට අදාළ වැදගත් ව්‍යාපෘති ගණනාවක් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය ක්‍රියාත්මක කරයි. ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය, පූර්වකාලීන ජාතික ග්‍රන්ථ නාමාවලිය, වාර සඟරා ලිපි අනුක්‍රමණිකාව, පශ්චාත් උපාධි නිබන්ධන අනුක්‍රමණිකාව, ජාතික ඒකාබද්ධ සූචිය ආදිය සම්පාදනය කිරීම ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයේ වැදගත් ජයග්‍රහණ කිහිපයකි. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ සහ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයේ කටයුතු සාර්ථක වේවායි ප්‍රාර්ථනා කරමි. !



# මෙම ආයතන දෙක කෙටි කාලයක් තුළ විශාල ප්‍රගතියක් ලබා ගෙන ඇති බව පැහැදිලියි

සුරනිමල රාජපක්ෂ
පාසල් අධ්‍යාපන අමාත්‍ය

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ හා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයෙ සංවත්සර සැමරීමේ අවස්ථාවේ දී පණිවුඩයක් නිකුත් කිරීමට ලැබීම පිළිබඳව අතිශයින් සතුටු වෙමි.

කෙටි කාලයක් තුළ මෙම ආයතන දෙක විශාල ප්‍රගතියක් ලබාගෙන ඇති බව පැහැදිලි කරුණකි. ශ්‍රී ලංකාවේ පාසල්, මහජන, දෙපාර්තමේන්තු හා අනෙකුත් පුස්තකාල ක්ෂේත්‍ර සංවර්ධනය කිරීමේ දී ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය වැදගත් කාර්ය භාරයක් ඉටු කර ඇත. ප්‍රකාශන ක්ෂේත්‍රය, පුස්තකාල ස්වයංක්‍රියකරණය, පුස්තකාල අධ්‍යාපන හා පුස්තකාල ප්‍රමිති යන ක්ෂේත්‍ර සඳහා එහි දායකත්වය ඉතා විශාලය. ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක කරන ලද පාසල් පුස්තකාල සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කිරීමේ දී ප්‍රධාන කාර්යභාරයක් ඉටු කිරීම සම්බන්ධයෙන් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයට මගේ විශේෂ ස්තූතිය පුද කරමි. මෙම ව්‍යාපෘතිය මගින් දැනට පාසල් පුස්තකාල 4000 ක් සංවර්ධනය කෙරේ. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මධ්‍යස්ථානය රටේ ප්‍රධාන පුස්තකාලය වශයෙන් ශ්‍රී ලංකාවේ පර්යේෂකයින් සඳහා අගනා ග්‍රන්ථ විඥාපන හා ප්‍රලේඛන ව්‍යාපෘති රාශියක් ක්‍රියාත්මක කර ඇත. මෙම සුබදායක අවස්ථාවේ දී ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයටත් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයටත් මගේ සුබ පැතුම් පිරිනමමි.



# මෙම ආයතනය පුස්තකාල ක්ෂේත්‍රයේ කේන්ද්‍රස්ථානයයි

වී.කේ.නානායක්කාර
මානව සම්පත් සංවර්ධන අධ්‍යාපන හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය හා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය ශ්‍රී ලංකාවේ පුස්තකාල ක්ෂේත්‍රයේ කේන්ද්‍රස්ථානය වේ. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය යටතේ පිහිටුවා ඇති ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය ලංකාවේ ප්‍රධානතම පර්යේෂණ පුස්තකාලය වේ. මේ මගින් පර්යේෂකයන්ටත් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ටත් සාමාන්‍ය පාඨකයන්ටත් සේවාවන් ගණනාවක් සලසා තිබීම සතුටට කරුණකි. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන සංවර්ධනයේ නියැලී සිටින අප අමාත්‍යාංශයට ද ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයේ සහ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ කාර්යභාරය ඉමහත් රැකුලක් බව කිව යුතු ය. 1990 වර්ෂයේ ආරම්භ කිරීමෙන් පසු, පසුගිය වසර 13 තුළ ප්‍රධාන පෙළේ ග්‍රන්ථ විඥාපන, ප්‍රලේඛන හා තොරතුරු සේවා ගණනාවක් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය විසින් ආරම්භ කර පවත්වා ගෙන යනු ලබයි. ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය, ශ්‍රී ලංකා පුවත්පත් ලිපි අනුක්‍රමණිකාව, රජයේ ප්‍රකාශන නාමාවලිය, පශ්චාත් උපාධි නිබන්ධන අනුක්‍රමණිකාව මෙම ග්‍රන්ථ විඥාපන හා ප්‍රලේඛන සේවා අතර ප්‍රධාන වේ. 1970 වර්ෂයේ දී පිහිටුවන ලද ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය ද පසුගිය වසර 33 තුළ ශ්‍රී ලංකාවේ පුස්තකාල සංවර්ධනය සඳහා විශාල මෙහෙවරක් ඉටු කර ඇත. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයේ 13 වන සංවත්සරය සහ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ 33 සංවත්සරය සමරන අවස්ථාවේ එම ආයතනවල සියලු කාර්යයන් සාර්ථක වේවායි ප්‍රාර්ථනා කරමි.



# ජාතික සංවර්ධනය සඳහා අපගේ සේවයට තවදුරටත් කැප වෙමු

**මහාචාර්ය තිස්ස කාරියවසම**
**සභාපති**
**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය**

1970 වර්ෂයේ ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය පිහිටුවීමෙන් පසු එහි ප්‍රධානතම අරමුණ වූයේ ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය පිහිටු වීමයි. 1970 සිට 1990 දක්වා ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය ආරම්භ කිරීමේ මූලික කටයුතු සිදු කෙරිණි. ජාතික පුස්තකාල ගොඩනැගිල්ල ඉදි කිරීම, පුස්තකාල එකතුව ගොඩනැගීම ආදී කටයුතු මෙම කාලය තුළ සිදු විය. 1990 අප්‍රේල් මාසයේ දී ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය ආරම්භ කිරීමට හැකි විය.

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය ආරම්භ කර වසර 13 ක් ද, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය ආරම්භ කර වසර 33 ක් ද සම්පූර්ණ වී ඇත. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය හා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය ආරම්භයේ සිට ම එහි වගකීම හා කාර්යභාරය මැනවින් හඳුනා ගෙන එහි පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා විශාල උත්සාහයක් දරා ඇති බව කිව යුතුය. රටක ජාතික පුස්තකාලයක් මගින් ඉටු කළ යුතුයයි ජාත්‍යන්තර වශයෙන් පිළිගත් කාර්යභාරයන් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය මගින් ද ඉටු කිරීමට උත්සාහ දරා ඇති අතර එම උත්සාහය තුළින් සැලකිය යුතු ජයග්‍රහණ ලබා ගැනීමට හැකි වී ඇත. 1998 අංක 51 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල නව පනත යටතේ ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය ලෙසත්, ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය ලෙසත් නම් කෙරුණි. නව පනත යටතේ මෙම ආයතනයෙහි නීතිමය පදනම වඩාත් ශක්තිමත් වූ අතර, එහි බලතල හා කාර්ය භාරය ද වඩාත් පුළුල් විය. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ 13 වන සංවත්සරය හා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ 33 වන සංවත්සරය සමරන මේ අවස්ථාවේ දී මණ්ඩලයේ සභාපති වශයෙන් එහි කාර්ය මණ්ඩලයට ස්තුති කිරීමට මෙය අවස්ථාව කොට ගනිමි. අනාගතයේ දී ජාතික සංවර්ධනය සඳහා මෙම සේවයට තවදුරටත් කැපවීම අපගේ අපේක්ෂාවයි.

# Awakening National Library Services

M S Upali Amarasiri
Director General
National Library and Documentation Services Board

This year the National Library and Documentation Services Board (NLDSB), formerly known as the Sri Lanka National Library Services Board (est. 1970), completes 33 years of service to the nation. The National Library and Documentation Centre (NLDC) inaugurated in 1990 under the NLDSB, celebrates its 13th anniversary this year. Both the NLDSB and the NLDC are considered apex institutions in the library and information field in Sri Lanka.

At the time of establishment the main objectives of the National Library Services Board were to assist various institutions, authorities and departments to improve their library and information services, to extend a helping hand to authors and publishers and to establish the National Library of Sri Lanka, which was considered to be long overdue at the time.

Looking back at the last three decades, one can be proud of the achievements of the NLDSB in these spheres. Without doubt the library and information services in the country are in much better shape compared to a few decades ago. It is true that Sri Lanka still has a long way to go in establishing a fully-fledged modern library and information service covering the entire country with special emphasis on various sub sectors and special areas. With the rapid developments in information and communication technology (ICT) and the unprecedented expansion of human knowledge, providing successful library and information services is a serious challenge even to developed countries.

Due to the initiatives taken by a large number of institutions and persons, with the support of the respective authorities and the government, library service has moved forward in Sri Lanka. Universities and other higher educational institutions, research institutes and local authorities have improved their library facilities considerably in the recent past. Through improvements in the country's telecommunication sector the government has indirectly lent a helping hand to develop the library sector. As a result of the liberal economic policy of successive governments and special concessions given the IT sector, usage of computers and other IT peripherals in the library field has become a common feature. Today most of the leading libraries have been automated and they also use ICT for a better service. These libraries are engaged in web-based activities more actively and most of them have On-line Public Access Catalogues (OPACs). This trend is gradually being expanded to the public and school library sectors as well.

## Human Resource Development

Human resource development in the field has improved tremendously during the last few years. The Department of Library Studies of the Kelaniya University offers both degree and postgraduate programmes while the Colombo University offers postgraduate programmes in library and information science. The recently established National Institute of Library and Information Science offers a number of training programmes while the Sri Lanka Library Association conducts courses for both professional and para-professional staff engaged in this field. The NLDSB conducts continuing educational programmes for working librarians. Other institutions such as the National Science Foundation, American Information Resource Centre, British Council, National Institute of Education, School Library Development Unit

of the Ministry of Education and provincial councils undertake training of library personnel in various forms.

In addition to these local programmes librarians are afforded opportunities to follow postgraduate courses and short courses at universities and other institutions overseas in time to time. During the last few years a number of senior professionals obtained postgraduate qualifications from leading universities in the UK, Australia, New Zealand, India, Malaysia, USA and Canada. The NLDSB while being engaged in continuing educational activities of its own also assists other institutions to maintain the required standards and to avoid repetitions in the programmes conducted by such institutions. Being the institution with the largest number of professional librarians, the staff of NLDSB serves as resource persons to all other institutions in their training programmes.

## Standards and Advisory Services

The NLDSB also formulates standards for library services. Presently standards for public, school and department libraries have been published. Guidelines provided by UNESCO and the International Federations of Library Associations and Institutions (IFLA) have been taken into consideration in formulating these standards. The standards are revised periodically. It is a responsibility of the NLDSB to upgrade libraries and in this exercise the main criteria for upgrading is adherence to the required standards.

The library advisory service conducted by the NLDSB helps improve the library services in the country. Advisory services are provided in every sphere of the library field including planning of library buildings, interior planning/designing, furniture and equipment, collection development, organisation of library material, library automation, information retrieval, bibliographic and documentation services, conservation and preservation and extension services. Though the advisory services were provided free of charge earlier, presently a nominal fee is charged for the service. Small and economically weak institutions/libraries can still receive the service free of charge.

## Publication Assistance

Assistance rendered towards writers and publishers to publish books through the Book Development Project is one of the major achievements of the NLDSB. As pointed out by a writer recently, through this project the NLDSB has revolutionised the local publishing field during the last two decades. The project has helped almost 1,000 writers-both young and upcoming as well as established writers - to publish their new creations. A considerable number of prominent writers have come to the limelight through this project of the NLDSB. Nearly 2,000 new publications, running to a millions of copies have been published through the project. Not only writers, but printers, publishers, cover designers and numerous others associated with the publishing industry have benefited from the project.

Parallel to the Book Development Project, a number of small-scale publication assistance projects were also undertaken by the NLDSB. Reprinting of out of print books was one of such project. Under this scheme, assistance was provided to reprint a number of important works of prominent writers. Editing and publishing of well known classics of Sri Lanka, e.g. Pansiya Panas Jatakaya, Pujavaliya, Mahawansa is another noteworthy contribution in the field. Emerson Tenant's Ceylon and a number of other important literary works were translated and published.

## Quality improvement

Purchasing books from authors, facilitating to sell and display the work of author-publishers at the National Library bookshop, providing ISBN, ISSN and ISMN and Cataloguing in Publications (CIP) data are some of the other services available through the NLDSB. Due to the sustained efforts of the NLDSB, presently the International Standard Book Number (ISBN) has become an essential part of a book. These numbers are given free of charge. The printing standards introduced by the NLDSB have impacted significantly towards improving the quality of local publishing. Usage of quality paper, section binding, high quality covers, fol-

lowing of internationally accepted book designs, etc have become accepted norms today. These standards were first introduced by the NLDSB through its Book Development Project.

The role played by the Sri Lanka Book Publishers Association in this sphere is also acknowledged. The NLDSB continuously maintains a close rapport with local, regional and international publishers and associations and this is of mutual benefit to all parties. Seminars, training programmes and workshops are regularly conducted for authors, publishers and others engaged in the publishing field. Undoubtedly this is of immense help to improve the standards of the local publishing industry. Today authors, author- publishers and small time publishers are well versed with the required printing and publishing standards and one can see the results in the high quality printed books that have come out in recent times. Today bulk of the book sales is for libraries and local publishers and booksellers heavily depend on the library purchases. Through implementing library standards including substantial annual allocation for new purchases the NLDSB indirectly helps the local publishing industry from yet another front.

## School Libraries

Special interest has been taken for the development of school library services in the country. The World Bank funded GEP-2 project currently being implemented has a special component for school library development. Under this project a number of programmes such as the development of 4,000 school libraries, creation of a school librarians service, building and equipping of new libraries, conducting of training programmes, provision of books for schools, establishment of the National Institute of Library and Information Sciences as the training centre for school librarians and teachers and the introduction of information technology have been implemented. The NLDSB played a key role in the formulation of the project at its initial stage and also helped the Ministry of Education in implementing it.

## National Library

As a result of its recent establishments the collection at the National Library is more contemporary in nature. While having a comprehensive collection of Sri Lankan publications published during the past 25 years, it also possesses a considerable amount of old and rare Sri Lankan material acquired from personal collections of scholars and other sources. The National Library collection comprises of the following sub collections.

- Basic Reference Collection - encyclopaedias, dictionaries, bibliographies and other reference sources
- Sri Lanka Collection - mostly consists of contemporary materials published in Sri Lanka since 1976 as well as a reasonably large collection of old Sri Lankan material
- Palm Leaf Collection
- Periodical Collection - comprehensive collection of current periodicals
- Newspaper Collection - newspapers from 1976 to date
- Theses Collection - collection of the theses of M.Phil and Ph.D degrees conferred by Sri Lankan universities and foreign universities to Sri Lankan nationals
- Library and Information Science Collection
- Special Collections - collections of eminent scholars e.g. Martin Wickramasinghe, Professors D E Hettiarachchi, Tikiri Abeysinghe and M H Peter Silva, Ms Theja Gunawardana and Dr P B Sannasgala
- Map Collection
- Gazette Collection - complete collection of gazettes from 1888 to date
- Data bases
- Report Collection
- Folklore Collection including Mr Peter Wijesinghe collection

## Reader Services

The Reader Services Division facilitates the use of the resources of the library. The three reading rooms provide facilities for over 300 readers. A special information desk is located close to the entrance to facilitate the users and

would be users of the library. Any person with proven identity is eligible to obtain the membership of the National Library and library staff is available to entertain readers' requests and queries. Members are entitled to use all facilities of the library and extra payment is levied only for the use of the Internet and photocopy facilities. Both card catalogue and the computerised catalogue are available for users. Also users could access the collection of more than 70 libraries through the National Library Union Catalogue. All these catalogues are available on-line on the Internet. The NLDC has inter-library loan facilities with all major libraries in the country and a number of leading libraries in the world. Users of the National Library can access many online databases including a number of full text databases. The Reader Services Division is open to the public from Tuesday to Saturday, except on public holidays.

## Bibliographic Services

One of the objectives of a National Library is to ensure establishment of an orderly bibliographic control mechanism of the country's publications. The NLDC compiles and publishes the current, cumulative, and retrospective national bibliographies on Sri Lankan publications. The Sri Lanka National Bibliography (SLNB) is published monthly and contains information on publications published during the previous month. Publications on Sri Lanka and to some extent publications by Sri Lankans published outside the country are also included in the bibliography. Being a multi-lingual country, publications in Sinhala, Tamil and English are included in the national bibliography. In addition first edition of periodicals and newspapers and information on maps and audio-visual materials are also included. Based on its extensive coverage, timeliness, and structure, the Sri Lanka National Bibliography is considered one of the best national bibliographies in the world. Since April 2003 the SLNB is also published in disk format.

The publication of the Retrospective National Bibliography is another successful project carried out by the NLDC. The objective of the project is to introduce bibliographic control of publications published during a period of 226 years, from 1737, when printing was introduced to the country to 1963, when the publication of the National Bibliography commenced. To date the period of 1737 to 1910 has been covered.

The Sri Lanka Periodical Article Index is a quarterly publication that provides information on articles appearing in periodicals published in the country. To some extent it also covers the articles pertaining to Sri Lanka published in foreign journals.


## Documentation Services


The NLDC engages in a large number of documentation services projects at the national level. The National Union Catalogue contains bibliographic information of collections of 70 major libraries in the country. The Sri Lanka Newspaper Article Index provides information on articles that appear in the national newspapers. The Sri Lanka Conference Index carries information on conferences and seminars held in Sri Lanka during the last three decades. Index to Postgraduate Theses provides bibliographic information and location of the theses submitted for higher degrees in the universities of Sri Lanka and to the foreign universities by Sri Lankans. The two volumes of the index covering 1981-2000 period published recently, provides information on 2,310 such theses. The Directory of Government Publications, database on the ethnic problem in Sri Lanka, publication of the catalogue of the Peradeniya University and Directory of Social Scientists in Sri Lanka are some of the major documentation projects presently carried out by the NLDC. While reducing the number of copies in paper form the NLDC will keep them as databases in the future which can be searched online.

The National Library also acts as the centre of the country's library networks. There are a number of library networks operating in different fields e.g. Sri Lanka Scientific and Technical Information Network (SLSTINET), Health Library and Information Network


Continued ⇨ 20


# ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය
# தேசிய நூலக ஆவணவாக்கல் மத்திய நிலையம்
# National Library and Documentation Centre





- ☆ ප්‍රතිග්‍රහණ අංශය
- ☆ පාඨක සේවා අංශය
- ☆ සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපන අංශය
- ☆ තොරතුරු තාක්ෂණ අංශය
- ☆ ග්‍රන්ථ විද්‍යාපන සේවා අංශය
- ☆ ප්‍රලේඛන සේවා අංශය





# ප්‍රතිග්‍රහණ අංශය

අංශ ප්‍රධාන
අමරා නානායක්කාර

1970 අංක 17 දරන පාර්ලිමේන්තු පනත මගින් 1970 දී පිහිටුවන ලද ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය 1998 අංක 51 දරන පනතින් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය ලෙස නම් කරනු ලැබීය. මෙම මණ්ඩලයෙහි ප්‍රධාන වගකීම හා කාර්යභාරය වන්නේ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය පිහිටුවීම හා පවත්වාගෙන යාමයි. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යභාරය වන්නේ වර්තමාන හා අනාගත පරම්පරාවගේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකාව හා ශ්‍රී ලාංකිකයන් පිළිබඳ ප්‍රකාශයට පත්ව ඇති සියලුම වර්ගයේ ප්‍රකාශන පිළිබඳ පූර්ණ එකතුවක් ගොඩ නැගීම, පවත්වා ගෙන යාම හා සංවර්ධනය කිරීමයි. ඒ අනුව පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයේ කාර්ය භාරය අතුරින් ප්‍රතිග්‍රහණ අංශයට අදාළ කර්තව්‍යයන් වන්නේ,

(අ) සියලුම ජනකොටස්වල භාවිතය සඳහා, ඔවුන්ගේ අවශ්‍යතාවන්ට උචිත පුස්තකාල හා ප්‍රලේඛන සම්පත් පිළිබඳ ජාතික සංචිතයක් ලබාදීම

(ආ) ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ප්‍රකාශයට පත්කරන ලද පුස්තකාල හා ප්‍රලේඛන ද්‍රව්‍ය සංචිතයක් පිහිටුවීම, වැඩි දියුණු කිරීම හා පවත්වාගෙන යාම මගින් ශ්‍රී ලංකාවේ ජාතික සංස්කෘතික උරුමය සංරක්ෂණය කිරීම

(ඇ) මුද්‍රණකරුවන්ගේ හා ප්‍රකාශකයන්ගේ ආඥාපනත යටතේ ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ තැන්පත් කරන ලද ශ්‍රී ලාංකීය ප්‍රකාශනවල පිටපත් ලබා ගැනීම

(ඈ) ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ප්‍රකාශයට පත් කරන ලද ප්‍රකාශනවල හෝ ශ්‍රී ලංකාවේ අවශ්‍යතාවලට අදාළ විදේශීය ප්‍රකාශනවල පිටපත් මිලට ගැනීම හෝ අන්‍යාකාරයකින් ලබා ගැනීම

(ඉ) පුස්තකාල ද්‍රව්‍ය හුවමාරු කර ගැනීම ඇතුළුව ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථාන අතර සහයෝගිතාව හා සම්පත් බෙදාහදා ගැනීම

ක්‍රමානුකූලව ගොඩනගන ලද ග්‍රන්ථ එකතුව ඕනෑම පුස්තකාලයක කොඳු නාරටිය ලෙස සඳහන් කළ හැකිය. එම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා ජාතික පුස්තකාල ප්‍රතිග්‍රහණ ප්‍රතිපත්තියට අදාළව විශේෂයෙන් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පළවන පොත් හා පොත් නොවන සියලුම වර්ගයේ ප්‍රකාශන මෙම පර්යේෂණ හා විමර්ශන පුස්තකාලය සඳහා අත්පත් කර ගැනේ.

## ආරම්භය

ජාතික පුස්තකාලය සඳහා ප්‍රකාශන අත්පත් කර ගැනීමේ කාර්යභාරය ක්‍රමානුකූලව ආරම්භ කරන ලද්දේ 1976 වසරේදීය. විශේෂයෙන් 1885 මුද්‍රණකරුවන්ගේ හා ප්‍රකාශකයන්ගේ ආඥාපනතේ 1976 සංශෝධනය මගින් ජාතික පුස්තකාලය තැන්පතු පුස්තකාලයක් වීම සමඟ ලංකාවේ පළවන සෑම ප්‍රකාශනයක ම පිටපතක් ශ්‍රී ලංකා ජාතික පුස්තකාල එකතුව සඳහා නිත්‍යානුකූලව හිමි වීම, ජාතික එකතුව ගොඩනැගීමේ කාර්යයේ දී ලත් විශිෂ්ට ජයග්‍රහණයකි. ඒ සමගින් ජාතික පුස්තකාලය සඳහා පොත් මිල දී ගැනීමේ කටයුතු ආරම්භ කරනු ලැබූ අතර, 1970 සිට ම පරිත්‍යාග ලෙස ලැබුණු ප්‍රකාශනවලින් ජාතික එකතුව ගොඩනැගෙමින් තිබිණ. 1982 වසරේ දී ප්‍රතිග්‍රහණ අංශය ජාතික පුස්තකාලයේ ප්‍රතිෂ්ඨාපනය කිරීමත් සමඟ, වඩාත් ක්‍රමානුකූලව ප්‍රතිග්‍රහණ කටයුතු අරඹනු ලැබීය. විවිධ වූ මාධ්‍යයන්ගෙන් පුස්තකාල සම්පත් රැස් කිරීමටත්, ජාතික පුස්තකාලය සඳහා සුදුසු ප්‍රතිග්‍රහණ ප්‍රතිපත්තියක් නිර්මාණය කිරීමට හා ප්‍රතිග්‍රහණ කටයුතු සඳහා නව තාක්ෂණය හඳුන්වා දී ප්‍රතිග්‍රහණ කාර්ය නව මාවතකට යොමු කිරීමට මේ වන විට හැකි වී ඇත.

## පුස්තකාල සම්පත්

ජාතික පුස්තකාලය සඳහා මුද්‍රිත මාධ්‍ය ලෙස සැලකෙන පොත්, ප්‍රධාන විමර්ශන ග්‍රන්ථ, සඟරා,



අත්පිටපත්, පුස්කොළ පොත්, උපාධි නිබන්ධන, සිතියම්, විවිධ වාර්තා හා පුවත්පත් ද, ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය ලෙස සැලකෙන ශ්‍රව්‍ය පට,

දෘශ්‍ය කැසට්පට, සූක්ෂම රූපනද; විද්‍යුත් මාධ්‍ය ලෙස සැලකෙන, සංයුක්ත තැටි, විද්‍යුත් වාර සඟරා, මාර්ගගත දත්ත පදනම් ආදිය අත්පත් කරගනු ලැබේ. ප්‍රධාන මාර්ග පහක් ඔස්සේ මෙම සම්පත් ජාතික පුස්තකාලයට හිමිකර ගනී. එනම්,

* මිල දී ගැනීම්
* ත්‍යාග හා පරිත්‍යාග
* දේශීය හා ජාත්‍යන්තර හුවමාරුව
* නීත්‍යානුකුල තැන්පතු
* ප්‍රමිති අංක හා පුස්තකාල ව්‍යාපෘති යටතේ ලැබෙන තැන්පතු පිටපත්

වශයෙනි.

## මිල දී ගැනීම

ජාතික පුස්තකාලය සඳහා පොත් මිල දී ගැනීමේ දී පහත දැක්වෙන කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

* ශ්‍රී ලංකාවේ පළ වූ ප්‍රකාශන
* විදේශ රටවල ශ්‍රී ලංකාව ගැන පළ වූ ප්‍රකාශන
* විදේශ රටවල සිටින ශ්‍රී ලාංකිකයන්ගේ ප්‍රකාශන
* ප්‍රධාන විමර්ශන මූලාශ්‍ර
* වෙනත් පුස්තකාලවලට ලබා ගැනීමට අපහසු පර්යේෂණවලට අවශ්‍ය විමර්ශන මූලාශ්‍ර
* පුස්තකාල හා විඥාපන විද්‍යාවට අදාළ ප්‍රකාශන
* ආයතනයේ අරමුණුවලට ගැළපෙන වෙනත් පුස්තකාල ද්‍රව්‍ය

## ත්‍යාග හා පරිත්‍යාග

ආරම්භයේ සිට ම දේශීය හා විදේශීය පරිත්‍යාගවලින් ජාතික එකතුව විශාල වශයෙන් වර්ධනය වී ඇත. පුද්ගලයන් මෙන් ම ආයතන මගින් ද කරනු ලබන පරිත්‍යාග නිරන්තරයෙන් ජාතික පුස්තකාලය වෙත ලැබේ. ජාතික පුස්තකාලයට පරිත්‍යාග ලෙස ලැබුණු වටිනා එකතු අතුරින් ඩී.ඒ.හෙට්ටිආරච්චි, ටිකිරි අබේසිංහ, රැල්ෆ් පීරිස්, මාර්ටින් වික්‍රමසිංහ, පී.බී. සන්නස්ගල, මර්වින් කාසිචෙට්ටි, වැනි විද්වතුන්ගේ එකතු මෙහිලා විශේෂයෙන් සඳහන් කළ හැකිය. මෙම එකතු සිංහල භාෂා ශාස්ත්‍ර, නීතිය, සමාජ, ආර්ථික විද්‍යා වැනි ක්ෂේත්‍රයන්හි පළ වී ඇති වටිනා එමෙන්ම දුර්ලභ ග්‍රන්ථවලින් සමන්විත වන අතර, සමහර එකතු මිල කළ නොහැකි වටිනාකමකින් යුක්ත වේ. එමෙන්ම ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලය මගින් ලැබෙන නාට්‍ය අත්පිටපත් එකතුව, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවෙන් ලැබුණු පැරණි ගැසට් එකතුව (1888 සිට වර්තමානය දක්වා) ශ්‍රී ලංකාවේ විවිධ සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ දේශීය හා විදේශීය විශේෂඥයන් විසින් සපයා ඇති වාර්තා එකතුව ආදිය ජාතික පුස්තකාලය වෙත පරිත්‍යාග ලෙස ලැබී ඇති මිල කළ නොහැකි සම්පත් ලෙස සඳහන් කළ හැකිය.

## දේශීය හා ජාත්‍යන්තර හුවමාරුව

ජාතික පුස්තකාලයේ සම්පත් සංවර්ධනයේ තවත් ප්‍රධාන මාවතක් වන්නේ දේශීය හා ජාත්‍යන්තර හුවමාරු කටයුතුය. 1990 දී පමණ ජාතික පුස්තකාලයේ ආරම්භ කරන ලද විදේශීය ග්‍රන්ථ එකතුව පෝෂණය සඳහා හුවමාරු කටයුතු මගින් මාහැඟි සේවයක් ඉටු විය.

මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වන්නේ ශ්‍රී ලාංකීය සාහිත්‍යය ලොව වෙනත් රටවල පුස්තකාල හරහා පර්යේෂණ කාර්යයන් සඳහා භාවිතයට අවස්ථාව සලසා දීමත්, විදේශීය වශයෙන් විවිධ පුස්තකාල අතර මිත්‍රශීලී සබඳතා ගොඩනැගීමත්ය. දේශීය වශයෙන් ජාතික පුස්තකාල ප්‍රකාශන, වෙනත් ආයතන ප්‍රකාශන හා හුවමාරු කර ගැනීමෙන් සුහදශීලී පරිසරයක සිට විවිධ ක්ෂේත්‍රයන්හි එකතුන් සංවර්ධනය කිරීමට මග පෑදී ඇත.

මේ ආකාරයෙන් විදේශීය රටවල් 23ක පුස්තකාල 51 ක් සහ දේශීය පුස්තකාල 20 ක් පමණ හුවමාරු කටයුතු පවත්වාගෙන යනු ලැබේ.

## නීත්‍යානුකූල තැන්පතු එකතුව

1885 මුද්‍රණකරුවන්ගේ හා ප්‍රකාශකයන්ගේ ආඥාපනතේ 1976 සංශෝධන මගින් හා 1998 ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල පනතට අනුව ශ්‍රී ලංකාවේ පළවන සෑම ප්‍රකාශනයක ම පිටපතක් ජාතික පුස්තකාලයේ තැන්පත් විය යුතු වේ. ඒ අනුව 1976 න් පසු ශ්‍රී ලංකාවේ ප්‍රකාශයට පත් වූ ප්‍රකාශන දළ වශයෙන් 1,65,000ක පමණ එකතුවක් ගොඩනැගී ඇත. මෙම එකතුව 2000 වසර දක්වා වෙන ම එකතුවක් ලෙස පැවතුන ද, 2001 වසරේ සිට ශාස්ත්‍රීය වටිනාකමකින් යුත් ප්‍රකාශන, දේශීය වාරසඟරා සහ රජයේ ප්‍රකාශන, ප්‍රධාන එකතුව වන ශ්‍රී ලංකා එකතුවට අනුයුක්ත කෙරේ. මේ නිසා දේශීය වශයෙන් ප්‍රකාශයට පත්වන ප්‍රකාශන මිල දී ගැනීම සීමා කිරීමෙන් ඒ සඳහා වැය වන මුදල් සෑහෙන ප්‍රමාණයක් ඉතිරි කර ගැනීමට හැකි වී තිබේ.

1976 සිට දේශීය වශයෙන් ප්‍රකාශයට පත්වී ඇති ජාතික මෙන්ම ජාතික නොවන සෑම පුවත්පතක්ම මෙම නීතිය යටතේ ජාතික පුස්තකාලයේ තැන්පත් වේ. 1970 දශකයේ අග භාගයේ සිට ජාතික පුවත්පත් සූක්ෂම ඡායාරූප ගත කිරීමේ කටයුතු නොකඩවා කරගෙන යනු ලැබේ. තවද ජාතික පුවත්පත් ගණනාවක සාහිත්‍ය වටිනාකමකින් යුත් ලිපි ඇතුළත් පුවත්පත් කැපුම් එකතුවක් ද, 2001 සිට "News"

නමින් ජාතික පුවත්පත්වල ලිපි ඇතුළත් පරිගණක දත්ත පදනමක් ද සම්පාදනය කර පවත්වාගෙන යනු ලැබේ.

## ප්‍රමිති අංක ව්‍යාපෘති තැන්පතු හා ප්‍රකාශන ආධාර ව්‍යාපෘති තැන්පතු

ජාතික පුස්තකාලය මගින් ක්‍රියාත්මක කරනු ලබන අන්තර්ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක ව්‍යාපෘතිය, මාලික අංක ව්‍යාපෘතිය හා සංගීත අංක ව්‍යාපෘතිය යටතේ ප්‍රකාශකයන් විසින් ජාතික පුස්තකාලයේ තැන්පත් කිරීම සඳහා පරිත්‍යාග කරනු ලබන දේශීය ප්‍රකාශන ද ජාතික එකතුව සඳහා ඇතුළත් කෙරේ. මේ නිසා ජාතික එකතුව විශාල වශයෙන් පෝෂණය වේ. එමෙන්ම ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ ප්‍රකාශන ආධාර ව්‍යාපෘතිය යටතේ ප්‍රකාශයට පත් කරන ලද සෑම ප්‍රකාශනයක ම පිටපතක් ජාතික එකතුවට ඇතුළත් කරනු ලැබේ. නීත්‍යානුකූල තැන්පතු නීතිය ක්‍රියාත්මක වීමේ දී සිදුවන ප්‍රමාද දෝෂයන් නිසා දේශීය ප්‍රකාශන ආවරණයේ දී සිදුවන අඩුපාඩු මඟහැරීමට මෙම ව්‍යාපෘති මගින් හැකි වේ.

## දුර්ලභ ග්‍රන්ථ

1985 පමණ සිට දුර්ලභ පොත් මිල දී ගැනීමේ කටයුතු ආරම්භ කරන ලද අතර, පරිත්‍යාග ලෙස ද සැලකිය යුතු ග්‍රන්ථ සංඛ්‍යාවක් ලැබී ඇත. අත්පිටපත්, පුස්කොළ පොත්, බටහිර ජාතීන්ගේ පාලන කාලය තුළ ශ්‍රී ලංකාව සම්බන්ධව පළ කරන ලද ග්‍රන්ථ සැලකිය යුතු සංඛ්‍යාවක් අත්පත් කර ගෙන ඇත. 1737 දී ශ්‍රී ලංකාවේ ප්‍රකාශයට පත් ප්‍රථම සිංහල ග්‍රන්ථය වන Singaleesch belydenis book (ක්‍රිස්තියානි සිංහල යාඥා පොත) යන ග්‍රන්ථය ද ජාතික පුස්තකාලය සතුව ඇත.

## ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය එකතුව

ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය එකතුව සඳහා ශ්‍රව්‍ය කැසට්පට, ශ්‍රව්‍ය දෘශ්‍ය කැසට්, සූක්ෂම රූපන ලෙස ගැනෙන සූක්ෂම සේයාපට හා සූක්ෂම සේයාපත්‍ර සැලකිය යුතු සංඛ්‍යාවක් ජාතික පුස්තකාලය සතුව ඇත. ශ්‍රී ලාංකීය ගීත, නාට්‍ය මෙන් ම සූක්ෂම රූපන ලෙස දේශීය මෙන්ම විදේශීය සඟරා හා වෙනත් ප්‍රකාශන ගණනාවක් ද ජාතික පුවත්පත් කිහිපයක් ද මීට ඇතුළත් වේ.

## විද්‍යුත් මාධ්‍ය එකතුව

විද්‍යා හා තාක්ෂණ මෙන් ම සමාජ විද්‍යා ක්ෂේත්‍රයට අදාළ විද්‍යුත් මාධ්‍ය එකතුවක් ජාතික පුස්තකාලය සතුව ඇත. ඊට අමතරව ප්‍රධාන විමර්ශන මූලාශ්‍ර කිහිපයක් ද විද්‍යුත් මාධ්‍ය ලෙස අත්පත්කරගෙන ඇත. බොහෝමයක් ද්විතීයික මූලාශ්‍ර මිල අධික බැවින්, ඒවා මිල දී ගැනීම සහයෝගිතා වැඩ පිළිවෙළක් ලෙස ක්‍රියාත්මක කෙරේ.



* Current Contents on CD
* Science Citation Index
* Social Science Citation Index
* Library and Information Science Abstract (LISA)
* Encyclopaedia Britannica
* Encarta 2003

සංයුක්ත තැටි දත්ත පදනම් ලෙස මෙවා මිල දී ගැනේ. 2003 වසරේ සිට LISA දත්ත පදනමේ අන්තර්ජාල සංස්කරණ (IDS version) ලබාගැනීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

## වාරසඟරා එකතුව

දේශීය වශයෙන් පළවන බොහොමයක් වාර සඟරා ජාතික පුස්තකාලය මිල දී ගන්නා අතර, නීත්‍යානුකූල තැන්පතු එකතුව යටතේ ලැබෙන වාරසඟරා ද ඊට ඇතුළත් කිරීමෙන් බොහෝ දුරට පරිපූර්ණ දේශීය වාරසඟරා එකතුවක් ජාතික පුස්තකාලයේ ගොඩනැගී ඇත.

විදේශීය වශයෙන් සමාජ හා මානව විද්‍යා, විද්‍යා හා තාක්ෂණ හා පුස්තකාල හා තොරතුරු විද්‍යා ක්ෂේත්‍රයේ ජනප්‍රිය වාරසඟරා සැලකිය යුතු සංඛ්‍යාවක් සඳහා දායක මුදල් ගෙවනු ලැබේ. Nature, New Scientist, Library Development, Alexandria ඉන් කිහිපයකි. කෙසේ වෙතත් වර්තමානයේ පවතින මූල්‍යමය අර්බුදය නිසා විදේශීය වාරසඟරා මිලදී ගැනීම සීමා කිරීමට සිදු වී ඇත.

2002 වසරේදී INASP නමින් විද්‍යාත්මක ක්ෂේත්‍රයේ මාර්ගගත තොරතුරු ජාලයකට සම්බන්ධ වීමේ අවස්ථාව ජාතික පුස්තකාලයට ලැබීම අධ්‍යාපනික මෙන් ම පර්යේෂණ ක්ෂේත්‍රයේ නියැලී සිටින ජාතික පුස්තකාල පාඨකයන් ලද ඉමහත් භාග්‍යයකි.

## INASP/PERI වැඩ සටහන්

(Internation of Network for the Availability of Scientific Publication) INASP මෙය ජාත්‍යන්තර වශයෙන් විවිධ රටවල් අතර ක්‍රියාත්මක වන සහයෝගිතා තොරතුරු ජාලයකි. මෙහි ප්‍රධාන අරමුණ පර්යේෂකයන් සඳහා විද්‍යුත් මාධ්‍ය ඔස්සේ විවිධ ක්ෂේත්‍රයන්හි තොරතුරු බෙදා හැරීමයි. විශේෂයෙන් සංවර්ධනය වන රටවල් සඳහා ගෙවීමකින් තොරව

මාර්ගගත පූර්ණ පෙළ සහිත විවිධ විෂය ක්ෂේත්‍රයන්ට අයත් විශාල වාරසඟරා එකතුවක් පරිශීලනය කිරීමටත්, Black wells, Ebsco - Host, Cochrane Library යන මාර්ග ගත දත්ත පදනම්වලට ප්‍රවිෂ්ට වී දහස් ගණනක් සඟරා පරිශීලනය කිරීමටත්, පිටපත් මුද්‍රණය කර ගැනීමටත් හැකියාව ලැබී ඇත. ජාත්‍යන්තර මට්ටමේ තොරතුරු සම්පතක් වන මෙහි සම්බන්ධීකරණ කටයුතු කරනුයේ කොළඹ විශ්ව විද්‍යාල පුස්තකාලය මගිනි. විදේශීය වාර සඟරා සඳහා ගෙවන විශාල මුදලක් මේ නිසා ඉතිරි කර ගැනීමට අවස්ථාව ලැබී ඇත.

## ආයතනික සාමාජිකත්වය

ජාතික පුස්තකාලය, අන්තර් ජාතික පුස්තකාල සංගම් සංවිධානය(IFLA), යුනෙස්කෝ ආසියානු සංස්කෘතික මධ්‍යස්ථානය (ACCU), ඇමෙරිකානු පුස්තකාල සංගමය වැනි ජාත්‍යන්තර ආයතන ගණනාවක් හා රාජකීය ආසියාතික සමිතිය (ලංකා ශාඛාව), ශ්‍රී ලංකා පුස්තකාල සංගමය වැනි දේශීය ආයතන කිහිපයක ආයතනික සාමාජිකත්වය ලබා ඇත. සාමාජිකත්වය වෙනුවෙන් සඟරා, වාර්ෂික වාර්තා, ප්‍රවෘත්ති පත්‍රිකා වැනි ප්‍රකාශන නොමිලේ ලැබෙන අතර එම ආයතනවල ප්‍රකාශන මිල දී ගැනීම වෙනුවෙන් විශේෂ වට්ටමක් ද ලැබෙනු ඇත.

## ප්‍රතිග්‍රහණ කටයුතු ස්වයංක්‍රීයකරණය

ජාතික පුස්තකාල ප්‍රතිග්‍රහණ කටයුතු 2001 වසරේ සිට පූර්ණ වශයෙන් ස්වයංක්‍රීයකරණය කිරීමට අවස්ථාව ලැබීම අප ලැබූ විශිෂ්ට ජයග්‍රහනයකි. Alice for Windows මෘදුකාංගය මේ සඳහා භාවිත කරනු ලබන අතර, පොත් ඇනවුම් කටයුතු, සඟරා පාලනය, පරිග්‍රහණ ලේඛන සම්පාදන කටයුතු ආදිය ස්වයංක්‍රීයකරණය කර ඇත. ප්‍රතිග්‍රහණ ලැයිස්තු මාසිකව ස්වයංක්‍රීයව නිර්මාණය කිරීමට ද අවස්ථාව ලැබී ඇත.

## ගැටළු

මුදල් ප්‍රතිපාදන විශාල වශයෙන් කපා හැරීම නිසා 2002 වසරේ සිට පොත් මිලදී ගැනීම් කටයුතුවල අඩුවීමක් දක්නට ඇත. විදේශීය ප්‍රකාශන මෙන් ම, විමර්ශන ග්‍රන්ථ එකතුව ගොඩනැගීමේ දී සැලකිය යුතු පසුබෑම්වලට ලක් වී ඇත. දේශීය වශයෙන් විවිධ ව්‍යාපෘති යටතේ නොමිලයේ ප්‍රකාශන ලැබෙන බැවින් දේශීය එකතුව ගොඩනැගීමේ දී විශාල ගැටළුවකට මුහුණ පෑමට සිදු වී නොමැත.

එමෙන්ම ජාතික මට්ටමේ විද්‍යුත් හා ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍ය එකතුවක් ගොඩනගා ගැනීමට හැකිවන පරිදි නීති රීති හෝ ජාතික මට්ටමේ ප්‍රතිපත්තියක් සකස් නොවීම නිසා එවන් එකතූන්ගේ ක්‍රමික සංවර්ධනයක් සිදු වී නොමැත.

හුවමාරු සේවාව හා පරිත්‍යාග යටතේ දේශීය මෙන් ම විදේශීය වශයෙන් ද ජාතික පුස්තකාලය සඳහා ලැබෙන අනවශ්‍ය පොත් ප්‍රතිග්‍රහණ අංශයේ ගොඩ ගැසෙන අතර, ඒවා නැවත බෙදා හැරීම ප්‍රතිග්‍රහණ අංශය හමුවේ ඇති තවත් ගැටළුවකි.

විශේෂයෙන්ම නීත්‍යානුකූල තැන්පතු නීතිය යටතේ ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය ආවරණය නොවීම නිසා දේශීය වශයෙන් ප්‍රකාශයට පත්වන එවන් ප්‍රකාශන ජාතික මට්ටමින් එක්රැස් කිරීම විශාල ගැටළුවක් වී ඇත. මැලේසියාව, සිංගප්පූරුව වැනි රටවල ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය නීත්‍යානුකූල තැන්පතුව යටතේ ලබා ගැනීමට හැකිවන පරිදි තැන්පතු නීති සංශෝධනය කර ඇත. එබැවින් ශ්‍රී ලංකාවේ ද එවැනි නීති සංශෝධනය කිරීමේ ක්ෂණික අවශ්‍යතාව පැන නැගී ඇත.

ජාතික පුස්තකාලයේ ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය එකතුව ක්‍රමානුකූලව නඩත්තු කිරීම හා සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් ඉඩ පහසුකම් මෙන් ම ශිල්පීය ඥානය නොමැති නිසා ඒවා තැන්පත් කිරීම සඳහා සුදුසු ජාතික ආයතනයක් නම් කිරීමේ අවශ්‍යතාව ද පැන නැගී ඇත.

## සමාප්තිය

19 වන සියවස අගභාගයේ සිට ම ජාතික එකතු ගොඩනැගුණු ආයතන ලෙස ජාතික කෞතුකාගාරය, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව විශේෂයෙන් සඳහන් කළ හැකිය. ජාතික කෞතුකාගාරයේ එක් අංශයක් ලෙස පුස්තකාලය පවත්වාගෙන යන අතර, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යය වන්නේ රාජ්‍ය ලේඛන ආරක්ෂණය හා කළමනාකරණයයි. ජාතික පුස්තකාල එකතුව ගොඩනැගීම ආරම්භ කර දැනට වසර 25 ක පමණ කාලයක් ගත වී ඇත. ලක්ෂ තුනක පමණ විවිධ ප්‍රකාශන එකතුවකින් ද, දේශීය හා විදේශීය වාර සඟරා එකතුවක් හා 1976 සිට සියලුම ශ්‍රී ලාංකීය පුවත්පත් එකතුවකින් මෙම ඥාණ කෝෂ්ඨාගාරය සමන්විත වී ඇත. පුස්තකාල 70ක පමණ සහභාගීත්වයෙන් නිර්මාණය කර ඇති ජාතික ඒකාබද්ධ සූචිය මගින් එම පුස්තකාලවල ඇති එකතුවල ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු ගවේෂණය කිරීමේ පහසුකම සලසා ඇත. මේ අනුව ජාතික පුස්තකාලය ශ්‍රී ලංකාවාසී ජනතාවගේ තොරතුරු අවශ්‍යතා සපුරාලීමේ අවසාන නැවතුම ලෙසත්, ජාතියේ ප්‍රධානත ම විමර්ශන පුස්තකාලය ලෙසත් කටයුතු කරන අතර, අනාගත පරම්පරාව සඳහා එම දැනුම ආරක්ෂාකර තැබීම ද, එහි ප්‍රධාන වගකීමකි. මෙම කාර්යභාරය ඉටුකිරීම සඳහා ජාතික එකතුව ගොඩනැගීම පිණිස පසුගිය දහතුන් වසර තුළ ප්‍රතිග්‍රහණ අංශය මගින් අති මහත් පරිශ්‍රමයක් දරන ලද බව සඳහන් කළ හැකිය.

# පාඨක සේවා අංශය

එම්.බී.ජේ.සෙනෙවිරත්න
අංශ ප්‍රධාන

ශ්‍රී ලංකාවේ සංස්කෘතික, අධ්‍යාපනික, සාහිත්‍යමය සම්ප්‍රදායන් ආරක්ෂා කර ගැනීමේ හා පුස්තකාල හා තොරතුරු සම්පත් සමස්ත ශ්‍රී ලාංකික ජනතාවට සැපයීමේ මූලික අරමුණින් ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ පාඨක සේවා අංශය 1990 අප්‍රේල් 27 දින ආරම්භ විය. එතැන් සිට මේ දක්වා ලංකාවේ ප්‍රධාන විමර්ශන හා පර්යේෂණ පුස්තකාලය ලෙස කිසිදු සීමාවකින් තොරව පුළුල් පාඨක පිරිසක් වෙත සිය සේවා සැපයීමට පාඨක සේවා අංශය සමත් ව සිටී.

ජාතික පුස්තකාලයේ තැන්පත් කර ඇති පොත්පත් හා අනෙකුත් පුස්තකාල ද්‍රව්‍ය පරිශීලනය කිරීමට පාඨකයන්ට අවස්ථාව සලසාදීමත්, එමගින් රටේ සංවර්ධනයට අවශ්‍ය බුද්ධිමය සහ සංස්කෘතික මාවත සකසා ගැනීමට සහායවීමත් මෙම අංශයේ ප්‍රධාන කාර්ය භාරයයි.

මහල් පහකින් සමන්විත ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය වර්ග මීටර 11,250ක් පුරා පැතිර පවතී. විමර්ශන හා පර්යේෂණ කටයුතු සඳහා පැමිණෙන පාඨකයන්හට, දැනට මහල් තුනක සංවිධානය වී ඇති ලක්ෂ 3කට අධික ග්‍රන්ථ සම්භාරයකින් හා පුවත්පත්, සඟරා, ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය ඇතුළු විද්‍යුත් මාධ්‍ය මගින් ද සිය පර්යේෂණ හා විමර්ශන කටයුතු සඳහා ඉඩකඩ සලසා ඇත.

පාඨකයන් 320 දෙනෙකුට එක්වර සම්පත් පරිශීලනයට පහසුවන අන්දමේ ප්‍රධාන කියවීම් ශාලා 03කින් ද ඒ හා සම්බන්ධ සේවා කවුන්ටර 3කින් හා අධ්‍යයන කාමර ගණනාවකින් ද පාඨක සේවා අංශය සමන්විත වේ.

පාඨකසේවා අංශයට පිවිසෙන බිම් මහලේ ඇති තොරතුරු මේසයෙන් පාඨක අවශ්‍යතා ඔස්සේ නිසි මග පෙන්වීම කරනු ලැබේ.

ප්‍රධාන එකතු කිහිපයක් යටතේ සංවිධානය කර ඇති ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සම්පත් මිල දී ගැනීම, දේශීය හා විදේශීය හුවමාරු, පරිත්‍යාග, නීත්‍යානුකූල තැන්පතු පිටපත් අත්කර ගැනීම යන ක්‍රම මගින් පෝෂණය ලබයි. මෙම පුස්තකාල ද්‍රව්‍ය සම්භාරය පර්යේෂකයන් හා අනෙකුත් පාඨකයන් සඳහා ක්‍රමානුකූලව සංවිධානය කිරීම හා විවිධ වූ සංරක්ෂණ ක්‍රම මගින් ඒවා මතු පරපුර සඳහා ආරක්ෂා කර සේවා සැපයීම සිදුකරනු ලබයි.

ප්‍රධාන විමර්ශන ග්‍රන්ථ එකතුව, පුවත්පත් හා වාර සඟරා එකතුව, සූක්ෂම සේයා පට එකතුව හා පුවත්පත් කැපීම් එකතුව බිම් මහලේ ද; ශ්‍රී ලංකා එකතුව, විදේශ එකතුව, නීත්‍යානුකූල තැන්පත් පිටපත් එකතුව, රජයේ ප්‍රකාශන එකතුව, සිතියම් එකතුව, විද්‍යා හා තාක්ෂණ එකතුව, පුස්කොළ පොත් එකතුව, ශ්‍රව්‍ය දෘශ්‍ය එකතුව හා පශ්චාත් උපාධි නිබන්ධ එකතුව පළමු මහලේ ද පවත්වාගෙන යනු ලබයි. පුස්තකාල හා විඥාපන විද්‍යා එකතුව, යුනෙස්කෝ එකතුව, ජනසාහිත්‍ය එකතුව යන එකතු මෙන් ම විශේෂ එකතු වශයෙන් සංවිධානය කර ඇති ප්‍රමිති ග්‍රන්ථ අංක තැන්පතු එකතුව, ග්‍රන්ථ සංවර්ධන ව්‍යාපෘති යටතේ ලැබෙන පිටපත් එකතුව, බ්‍රේල් ප්‍රකාශන එකතුව, නාට්‍ය අත්පිටපත් එකතුව දෙවන මහලේ විමර්ශනය සඳහා සංවිධානය කර ඇත. මීට අමතරව දෙවන මහලේ විශේෂ එකතුවක් ලෙස සංවිධානය කර ඇති මාර්ටින් වික්‍රමසිංහ එකතුව එතුමා විසින් රචිත හා රැස්කළ ග්‍රන්ථ 5000ට අධික සංඛ්‍යාවකින් යුක්ත වන අතර එතුමා විසින් පරිහරණය කරන ලද භාණ්ඩ ඇතුළත් ලේඛක කෞතුකාගාරයකින් ද සමන්විත වේ.

එක් එක් මහලේ මෙම එකතු වෙන් වෙන් වශයෙන් තැන්පත් කොට ඇති අතර ඒ ඒ මහලට ඇති කියවීම් ශාලා තුළ දී අදාළ එකතුව සම්බන්ධයෙන් විමර්ශන කටයුතුවල යෙදීමට පහසුකම් සලසා ඇත. පුස්තකාල ද්‍රව්‍ය බැහැරදීමක් සිදු නොවන අතර පුස්තකාල ද්‍රව්‍ය සංවෘත ප්‍රවේශ (Closed Access) යටතේ පවතී. මූලික විමර්ශන ග්‍රන්ථ පමණක් විවෘත ප්‍රවේශයේ (Open Access) පවතී. පාඨකයන්ට කෙලින් ම පොත් කරා ළඟාවීමේ හැකියාවක් නොමැති වුවත් ඒ සඳහා කර්තෘ, ග්‍රන්ථ නාමය, පරිවර්තක, සංස්කාරක, විෂය, වර්ග අංක ආදී තොරතුරු ඔස්සේ පරිගණක සූචියෙන් හා පත්‍රිකා සූචියෙන් තොරතුරු ලබාගෙන කැඳවීම් පතක් මගින් අවශ්‍ය පුස්තකාල ද්‍රව්‍ය ඉල්ලුම් කළ හැක. මේ හැර ග්‍රන්ථ නාමාවලි, අනුක්‍රමණිකා වැනි ද්විතීක මූලාශ්‍ර ඔස්සේත් තොරතුරු කරා ළඟා වීමේ හැකියාව ඇත.

ජාතික පුස්තකාලය විමර්ශන පුස්තකාලයක් වශයෙන් කටයුතු කරන අතර, මෙහි සම්පත් පරිශීලනය සඳහා සාමාජිකත්වය ලබා ගැනීම ඉතා සරල හා පහසු කටයුත්තක් වන අතර ඒ සඳහා තම අනන්‍යතාව තහවුරු කිරීම පමණක් ප්‍රමාණවත් වේ. ශ්‍රී ලංකාවේ කුමන ප්‍රදේශයක පදිංචි කෙනෙකුට වුවත් කිසිම සීමාවකින්

තොරව ජාතික පුස්තකාලයේ සාමාජිකත්වය ලබාගැනීමේ හැකියාව ඇත. ජාතික පුස්තකාලයේ 13 වසරක සේවා කාලය දෙස බැලීමේ දී 1990 දශකයට වඩා 2000 දශකයේ ආරම්භයත් සමඟ සාමාජික සංඛ්‍යාවේ වර්ධනයක් දැකිය හැකිය. පර්යේෂණ හෝ අධ්‍යයන කාර්යයේ නියැලෙන අය සඳහා වසරක, හය මසක හා තුන් මසක ආදී වශයෙන් ස්ථිර සාමාජිකත්වය ලබා ගත හැකිය. මේ හැර කෙටිකාලීන අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා දෛනික හා සතියක සාමාජිකත්වය හඳුන්වා දී ඇත. මීට අමතරව ආයතන සාමාජිකත්වය ලැබීමෙන් ජාතික පුස්තකාලයේ සියලු සම්පත් එකී ආයතනයේ සියලු දෙනාට ලබා ගත හැකිය. 2003 මැයි මස පළමු දින වනවිට ස්ථිර සාමාජිකයන් 6452 හා තාවකාලික සාමාජිකයන් 31,295ක් ජාතික පුස්තකාලයේ සම්පත් ප්‍රයෝජනයට ගෙන ඇත.

1993 සිට පරිගණකගත සූචිය පාඨක පරිහරණය සඳහා විවෘතව පවතින අතර එමගින් කඩිනම් හා කාර්යක්ෂම සේවාවක් සැලසීමට හැකි වී ඇත. ආරම්භයේ පුස්තකාල එකතු පරිගණකගත කිරීම සඳහා CDS/ISIS මෘදුකාංග පද්ධතිය උපයෝගි කර ගනු ලැබූ අතර, 2000 සැප්තැම්බර් මස සිට පුස්තකාල කටයුතු පරිගණක ගත කිරීම සඳහා Alice for Windows මෘදුකාංග පද්ධතිය භාවිත කරනු ලැබේ. 1998 වසරේ ජාතික පුස්තකාල එකතුව අන්තර්ජාලයේ වෙබ් අඩවියට සම්බන්ධ වූ අතර, ඒ ඔස්සේ පුස්තකාලයට නොපැමිණ වුව ද එය පරිශීලනය කිරීමේ හැකියාව ඇති අතර, සමස්ත ලෝකයට ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ එකතු හඳුනා ගැනීමේ අවස්ථාව ලැබුණි. ඊට අමතරව පරිගණකගත ජාතික ඒකාබද්ධ සූචිය මගින් පුස්තකාල 72ක ඇති එකතු පිළිබඳ ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු පාඨකයාට ලබා ගැනීමේ හැකියාව ඇත. එමගින් ජාතික පුස්තකාලයේ නොමැති පොත් සඳහා අදාළ පුස්තකාලය වෙත පාඨකයා යොමු කිරීමේ හැකියාව ඇත.

ජාතික පුස්තකාලය සිය තොරතුරු සේවාවේ දී නවීන තාක්ෂණ උපක්‍රම වෙත නැඹුරු වෙමින් විවිධ විෂයයන්ට අයත් සංයුක්ත තැටි එකතුවක් පවත්වාගෙන යනු ලබයි. 1994 සිට පුස්තකාල විද්‍යා, විද්‍යා, සමාජ විද්‍යා, කෘෂිකර්මය ආදී විෂයයන් හයක් අඩංගු කාලීන තොරතුරු ඇතුළත් අනුක්‍රමණිකා, බ්‍රිටනිකා, එන්කාටා, විශ්ව කෝෂ, ත්‍රිපිටකය, භූගෝල විද්‍යා යන සංයුක්ත තැටි පාඨක පරිහරණය සඳහා ලබා දුණි. ජගත් තොරතුරු තාක්ෂණයේ නවතම මෙවලම වූ අන්තර්ජාලය හා සම්බන්ධ වීමට 1998 දී ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයට අවස්ථාව ලැබුණු අතර එමගින් මහල් තුනෙහි දීම පාඨකයන්ට සේවා සැපයීමට හැකි විය.

ජාතික පුස්තකාලය පර්යේෂණ හා විමර්ශන පුස්තකාලයක් ලෙස බැහැර දීමේ සේවාවක් ක්‍රියාත්මක නොවුවත් අන්තර්පුස්තකාල පිරුළු සේවාව මගින් පුස්තකාල අතර පොත් බැහැර දීමක් සිදු කරනු ලබයි. අන්තර්පුස්තකාල පිරුළු සේවාව ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පවත්වා ගෙන යනු ලබන අතර, දේශීය පුස්තකාල 26 ක් සමඟ 2001 වසරේ දී අත්සන් කරන ලද අන්තර්පුස්තකාල පිරුළු සේවා ගිවිසුම් ක්‍රමය දේශීය වශයෙන් ක්‍රියාත්මක කරගෙන යනු ලබයි. අන්තර්ජාතික වශයෙන් මෙම සේවාව පවත්වා ගෙන යාමේ දී ලෝකයේ පුස්තකාල අතර ක්‍රියාත්මක වන ඉෆ්ලා වවුචර් ක්‍රමය මගින් සේවා සැපයීම 1995 වසරේ සිට ජාතික පුස්තකාලය ක්‍රියාත්මක කරනු ලබයි.

ජාතික පුස්තකාලය විසින් පවත්වාගෙන යනු ලබන සේවාවන් අතුරින් විමසීම් සේවය මගින් පුස්තකාලයට නොපැමිණ වුවත් අවශ්‍ය තොරතුරු ලිපි මගින්, දුරකථන, ෆැක්ස් හෝ විද්‍යුත් තැපැල යන මාධ්‍ය තුළින් ලබා ගැනීමේ හැකියාව ඇත. යොමුගත සේවාව මගින් පාඨකයන් විසින් විමසනු ලබන කිසියම් තොරතුරක් ජාතික පුස්තකාලයේ නොමැති අවස්ථාවක දී ඒකාබද්ධ සූචිය උපයෝගී කර ගනිමින් අදාළ පුස්තකාල වෙත යොමු කිරීමක් කරනු ලබයි. මේ හැර නාමාවලි සැකසීම, අනුක්‍රමණිකාකරණය, පටුන පිටු සේවාව මගින් පාඨකයන්ගේ අවශ්‍යතා ඉක්මණින් ඉටුකර දීමට කටයුතු කරයි.

පාඨක සේවා අංශය විවිධ තේමා යටතේ ප්‍රදර්ශන, සම්මන්ත්‍රණ, වැඩමුළු, පුස්තකාල චාරිකා සංවිධානය කිරීම වැනි විවිධ ක්‍රියාවලින් මගින් පාඨකයා වෙත සහාය වේ.

ජාතික පුස්තකාලය පිහිටුවා වසර 13 ඉක්ම ගොස් ඇතත් ජාතික පුස්තකාල සංකල්පය ජනතාව අතරට ගමන් කරනුයේ මන්දගාමී ස්වරූපයකිනි. ඊට පිළියමක් ලෙස ජාතික පුස්තකාලය ප්‍රචලිත කිරීමේ අරමුණින් විවිධ පත්‍රිකා, සමරු කලාප, පෝස්ටර්, බැනර් සකස් කිරීම, ගුවන්විදුලි රූපවාහිනී වැඩ සටහන්වලට දායක වීම හා ජාතික පුස්තකාලය පිළිබඳ ප්‍රචාරාත්මක වීඩියෝ චිත්‍රපටියක් සකස් කිරීම පසුගිය කාලය තුළ ඉටුකළ කාර්ය අතර ප්‍රමුඛ වේ.

විමර්ශන පුස්තකාලයක් වශයෙන් ජාතික පුස්තකාලය පුස්තකාල ද්‍රව්‍ය බැහැර දීමක් සිදු නොකරන අතර මෙමගින් පාඨකයාට සිදුවන සීමාව අවම කිරීම සඳහා කාර්යක්ෂම ජායාපිටපත් සේවාවක් පවත්වාගෙන යනු ලබයි.

ජාතික පුස්තකාලයේ පවතින පුවත්පත් එකතුව හා රජයේ ප්‍රකාශන එකතුව පාඨක අවශ්‍යතා බහුල වශයෙන් ඉටුකිරීමට දායක වී ඇත. නීතිමය පිටපත් එකතුව මගින් ශ්‍රී ලාංකික ප්‍රකාශන බොහෝ දුරට ආවරණය වීමට අධාර වී ඇත. එමෙන්ම 1888 සිට වර්තමානය දක්වා ශ්‍රී ලංකාවේ පළ වූ සම්පූර්ණ ගැසට් එකතුවක් ජාතික පුස්තකාලය සතුවීම අතිශයින්



වැදගත් වෙයි. ජාතික පුස්තකාලය විසින් 1998 ආරම්භ කරන ලද විද්වතුන්ගේ සිතුවම් ඇඳීමේ ව්‍යාපෘතිය මගින් ජනප්‍රිය අංගයක් පාඨක සේවාවට එක්කළා මෙන්ම එය අනාගතයේදී ලේඛක කෞතුකාගාරයක් ආරම්භ කිරීමට දරන ලද මූලික අඩිතාලමක් ද වේ. නමුත් මූල්‍යමය දුෂ්කරතා හේතුවෙන් එය දැනට තාවකාලිකව නවතා දැමීමට සිදු වී ඇත.

ජාතික පුස්තකාලය නැරඹීමට පැමිණෙන පාසල් සිසුන් අතර ජනප්‍රියත්වයට පත්ව ඇති අංගයක් ලෙස දෙවන මහලේ ඇති මාර්ටින් වික්‍රමසිංහ එකතුව දැක්විය හැකිය. එතුමා 60 වසරකට අධික කාලයක් තුළ පරිහරණය කළ මාහැඟි ග්‍රන්ථ අඩංගු පෞද්ගලික පුස්තකාලය, එතුමා විසින් පරිහරණය කරන ලද ද්‍රව්‍ය, අත්පිටපත් හා එතුමා විසින් රැස්කරන ලද සංස්කෘතික භාණ්ඩ නරඹන්නන්ගේ නොමද ආස්වාදයට ලක්ව ඇත. මෙය 1990 දී එතුමාගේ ජන්ම ශත සංවත්සරය නිමිතිකොට මාර්ටින් වික්‍රමසිංහ භාරකාර මණ්ඩලය විසින් ජනතා පරිහරණය පිණිස පරිත්‍යාග කරන ලද්දකි.

ජාතික පුස්තකාලය 1990 දී ආරම්භ වූ බැවින් එය සතු පැරණි එකතුවක් නොමැති වීම අඩුපාඩුවකි. මේ හේතුවෙන් ඇතැම් දුර්ලභ මූලාශ්‍ර සඳහා ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව, ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව වැනි ස්ථාන වෙත යොමු වීමට පාඨකයාට සිදුව ඇත. එමෙන්ම ජාතික පුස්තකාලය පර්යේෂණ පුස්තකාලයක් ලෙස නම් කළ ද, අද දිවයිනේ පර්යේෂණ කටයුතු සීමිත ලෙස සිදුවෙමින් පවතින බැවින් එම ඉලක්කය කරා ළඟාවීමට ජාතික පුස්තකාලයට ඇති ඉඩ ප්‍රස්ථා අල්පය. බොහෝ වියතුන් තම පර්යේෂණ කාර්ය එතෙර දී කිරීමට පෙළඹීම ද මෙම තත්ත්වය තව දුරටත් තීව්‍ර කිරීමට බලපා ඇත.

මෙවැනි දුබලතා හමුවේ වුව ද මෙම වසර 13 ක කාල පරිච්ඡේදය තුළ දී අධ්‍යාපනික හා සංස්කෘතික වශයෙන් ජාතික සංවර්ධනයෙහිලා මාහැඟි කාර්යභාරයක් ඉටු කිරීමට පාඨක සේවා අංශය සමත් වී ඇත. එමෙන්ම අපගේ කාර්ය මණ්ඩලය ද පාඨක අවශ්‍යතා සපුරාලීමට නිබඳ උත්සාහයක යෙදී ඇත. ජාතියේ මහඟු සම්පතක් වූ මෙයින් උපරිම ප්‍රයෝජන ලබා දීමට ඔවුහු ඇප කැප වී සිටිති. ☀

From 12

(HELLIS), Agriculture Information Network (AGRINET), Environmental Library Network (ENLINET) and Trade Information Network in Sri Lanka (TRADENETSL). The NLDC acts as the co-ordinator of the activities of the Asia-Pacific Information Network in Social Sciences (APINESS). The newsletter NATNET LANKA, which contains news of the networks, is published by the NLDC bi-annually.

Today libraries are operating in a rapidly changing environment. Information is considered a commodity and an essential ingredient for national development. The traditional role of libraries too has changed and today libraries do not have the monopoly on information. With the invention of the Internet and other ICT facilities any person is able to retrieve required information without undue problems. Considering the complexity and the vastness of the information resources available, it is always advisable and more productive for the researchers to get the help of library and information professionals in libraries in their quest for knowledge. On the other hand today most of the libraries are faced with a shortage of funds due to the current economic difficulties experienced by Sri Lanka. Hopefully this situation will ease soon and the library and information sector would be able to play a vital role in the development process of Sri Lanka.

# සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපන අංශය

වරුණි ගහබඩආරච්චි
අංශ ප්‍රධාන

## හැඳින්වීම

දශක කිහිපයක් පුරා ජාතික පුස්තකාල එකතුව ප්‍රමාණාත්මකව මෙන් ම විවිධ ස්වරූපයේ පුස්තකාල ද්‍රව්‍යවලින් ද පෝෂණය වෙමින් පවතී. ග්‍රන්ථ, වාර සඟරා, පුවත්පත්, පුස්කොළ පොත්, සූක්ෂම ඡායාපට, සූක්ෂම පත්‍ර, වීඩියෝ පට කැසට් පට හා සංගෘහිත තැටි ආදියෙන් ජාතික පුස්තකාල එකතුව සමන්විත වේ. එමෙන්ම මෙම එකතුවට පැරණි දුර්ලභ කෘති හා පැරණි පුස්කොළ පොත් අයත් වේ. මෙම එකතුව සංරක්ෂණය කර වත්මන් පාඨකයින්ට මෙන් ම අනාගත පරම්පරාවට දායාද කිරීම ජාතික පුස්තකාලයේ ප්‍රධාන වගකීමක් හා කාර්යභාරයක් වේ. මේ නිසා 1982 සිට සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපන අංශය යනුවෙන් වෙන ම අංශයක් ජාතික පුස්තකාලයට අනුබද්ධව පිහිටුවන ලදී.

ජාතික පුස්තකාලය සිය එකතුව සංරක්ෂණය කරනු වස් පුස්තකාල ද්‍රව්‍ය විශේෂිත ආකාරයකට ගබඩා කර ඇත. ගොඩනැගිල්ලෙහි එක් එක් මහලෙහි මධ්‍ය ප්‍රදේශය වෙන්කර වායු සමීකරණය කර පුස්තකාල ද්‍රව්‍ය ගබඩාකරණයට පහසුකම් සලසා ඇති අතර, ගොඩනැගිලි පර්යන්තයෙහි කාර්යාලීය පහසුකම් සලසා ඇත. එමෙන්ම ජාතික පුස්තකාල එකතුවෙහි ඇති තවත් සුවිශේෂී කරුණක් වන්නේ එකතුව බැහැර නොදීමයි. පාඨකයන් සඳහා විමර්ශන පහසුකම් පමණක් සලස්වා ඇත.


ජාතික පුස්තකාලයේ සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපන අංශයෙහි කාර්යභාරය ප්‍රධාන වශයෙන් ද්විත්වාකාර වේ.

* ජාතික පුස්තකාල එකතුව සංරක්ෂණය හා ප්‍රතිෂ්ඨාපන කිරීම
* ජාතික මට්ටමේ සංරක්ෂණ කටයුතු ඉටු කිරීම

## ජාතික පුස්තකාල එකතුවේ සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපන කටයුතු

* පොත් බැඳුම්හල
* සංරක්ෂණ ඒකකය; සහ
* ධූමායන ඒකකය මගින් සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපන කටයුතු සිදු කෙරේ.

මීට අමතරව, ජාතික පුස්තකාල එකතුවේ සංරක්ෂණය සඳහා නොයෙක් ආකාරයේ සංරක්ෂණ කටයුතු දෛනිකව සිදු කරනු ලැබේ. පොත් එකතුව වායු සමීකරණය කරන ලද සංවෘත අවකාශයක ගබඩා කර තැබීම, ස්වාභාවික, පාරිසරික හා ජීව විද්‍යාත්මක වශයෙන් මෙම එකතුවට වන හානි අවම මට්ටමක පවත්වා ගැනීම, ආර්ද්‍රතාවය පාලනය කර ගැනීම සඳහා ආර්ද්‍රතා පාලනමාන ක්‍රියාත්මක කිරීම, පොත් ආශ්‍රිතව සමහර කුඩා කෘමි සතුන්ගෙන් වන හානි වැළැක්වීම සඳහා පොත් අතරට කපුරු බෝල විසුරුවා හැරීම හා ධූමායනය කිරීම මෙන් ම රාක්ක හා කබඩ්වලට බේගෝන් මිශ්‍ර පැහිරි තෙල් ඉසීම හා එකතුවේ තැන්පත් වී ඇති දූවිලි පිස දැමීම වැනි ක්‍රියා නිරතුරුව ම සිදුකර, එකතුවේ සංරක්ෂණය කෙරෙහි මනා අවධානයකින් කටයුතු කරනු ලැබේ.



පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණය පිළිබඳ පුහුණු වැඩමුළුව
2003.03.26 - 28

එසේම කැඩී බිඳී ගිය කඩදාසි ලේඛන, පුස්කොළ පොත් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා සංරක්ෂණ ඒකකයක් පවත්වාගෙන යන අතර ලේඛන නිරාම්ලීකරණය, පැල්ලම් ඉවත් කිරීම, ටිෂ්‍යූ යෙදීම මෙන් ම පුස්කොළ පොත් ප්‍රතිසංස්කරණයේ දී කළු මැදීම, හංගුර වූ පුස්කොළ ප්‍රතිසංස්කරණය කිරීම, කම්බා දැමීම වැනි ක්‍රියාවලීන් මගින් ලේඛන ප්‍රතිෂ්ඨාපන කටයුතු නිරන්තරයෙන් ඉටු කරනු ලැබේ.

පොත් බැඳුම් හලේ ප්‍රධාන කාර්යය ජාතික පුස්තකාල එකතුවට අයත් බැඳිය යුතු තත්වයේ පොත් බැඳීම යි. එමෙන් ම පුස්තකාල භාවිතයට අවශ්‍ය සූචි පත්‍රිකා, පරිග්‍රහණ ලේඛන, පුස්තිකා පෙට්ටි හා විවිධ

කාර්යාලීය ලේඛන බැඳීම ද මීට අමතරව ඉටු කරන අතර සූචි පත්‍රිකා, පරිග්‍රහණ ලේඛන, පුස්තිකා පෙට්ටි ආදිය අළෙවිය සඳහා ද සකස් කෙරේ.

කෘමීන් හා දිලීර වර්ග පොත්වලට හානිදායක ප්‍රධාන ජෛව කාරක වේ. මේ හානි වැලැක්වීම සඳහා විවිධ සංරක්ෂණ ක්‍රියාමාර්ග ඇති අතර, පොත්පත් ධූමායනයට ලක් කිරීම සාර්ථක ප්‍රතිඵල ගෙන දෙන ක්‍රියාමාර්ගයක් ලෙස හැඳින්විය හැකිය. ජාතික පුස්තකාල එකතුවට අයත් කෘමි හානියට ලක් වූ පොත්පත් ධූමායනයට ලක් කරන අතර, සිදුව ඇති හානියේ ස්වභාවය අනුව ධූමායනය ක්‍රම දෙකකට සිදු කරනු ලබයි.

* තයිමෝල් ධූමායනය - (Thymol Fumigation) ප්‍රධාන වශයෙන් දිලීර විනාශ කිරීමට යොදා ගැනේ
* ෆොස්ෆීන් ධූමායනය - (Phosphene Fumigation) දිලීර හා කෘමීන් විනාශ කිරීමට යොදා ගැනේ

දිවයින පුරා විසිරී ඇති පුස්තකාලවල පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණය කිරීම ජාතික අවශ්‍යතාවක් වන හෙයින් සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපන අංශය ජාතික මට්ටමේ සංරක්ෂණ කටයුතු ද සිදු කරයි. මෙහිදී ප්‍රධාන වශයෙන්, ප්‍රාදේශීය මට්ටමින් සංරක්ෂණ මධ්‍යස්ථාන පිහිටුවීම හා තෝරාගත් පුස්තකාල සංරක්ෂණය කරනු ලබයි. දැනට ප්‍රාදේශීය වශයෙන් සංරක්ෂණ මධ්‍යස්ථාන 126 ක් පමණ පිහිටුවා, ක්‍රියාත්මක තත්ත්වයේ පවතී. මෙම සංරක්ෂණ මධ්‍යස්ථාන පිහිටුවීමේ දී පොත් බැඳුම් උපකරණ කට්ටල ලබාදීම හා සංරක්ෂණය පිළිබඳව දින 04 ක පුහුණුවක් ලබාදීම සිදු කරන අතර, මෙම මධ්‍යස්ථාන පිළිබඳව පසු විපරම් නිරීක්ෂණ කටයුතු ද සිදු කරනු ලැබේ. එමෙන් ම සංරක්ෂණය පිළිබඳ උපදෙස් ලබාදීම, උපදෙස් පත්‍රිකා හා පෝස්ටර් නිර්මාණය කිරීම වැනි කාර්යයන් මගින් ද ජාතික මට්ටමේ පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණය සඳහා දායක වේ.

මෙම සියලු කාර්යයන් ඉටු කිරීම සඳහා එකොළොස් දෙනෙකුගෙන් සමන්විත කාර්ය මණ්ඩලයකින් සංරක්ෂණ අංශය සමන්විත වන අතර පොත් බැඳීම් කාර්යයන්හී දී බාහිර සහාය ද ලබා ගනී. මෙහි දී, ඉන්දියාවේ (INTACH ආයතනය) හා මැලේසියාවේ ජාතික ලේඛණාගාරය වැනි ආයතනවල දී සංරක්ෂණය පිළිබඳ විශේෂ පුහුණු පාඨමාලාවන් හදාරා පැමිණි නිලධාරීන් පස් දෙනෙකුගේ සහාය ලැබීම සංරක්ෂණ කටයුතුවලට මහත් පිටිවහලක් වේ.

ප්‍රතිපාදන අඩුවීම, පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණය විධිමත් කිරීම සඳහා ලේඛන සංරක්ෂක තනතුරෙහි පුරප්පාඩුව පිරවීමට නොහැකි වීම සංරක්ෂණ අංශය පවත්වාගෙන යාමේ දී මතු වී ඇති ප්‍රධාන ගැටලුවේ. එමෙන්ම මුදල් ප්‍රතිපාදන අඩුවීම හේතුවෙන් ජාතික පුස්තකාල එකතුව වරින් වර වායු සමීකරණය කිරීම ද ගැටලුවකි. කඩින් කඩ වායු සමීකරණය කිරීම හේතුවෙන් පුස්තකාල ද්‍රව්‍ය උෂ්ණත්ව උච්චාවචනයට නිරන්තරයෙන් භාජනය වේ. එමෙන්ම මෙම තත්ත්ව පුස් වර්ධනයට හේතුවක් විය හැකිය. නවීන සංරක්ෂණ ක්‍රියාමාර්ගයක් වන සූක්ෂම ඡායා පිටපත්කරණය, සංකේතිකරණය වැනි ක්‍රියාවලියක් සිදු කිරීමට නොහැකි වීම හා ලේඛන ප්‍රතිසංස්කරණ කටයුතුවලට අවශ්‍ය උපකරණ, රසායනික ද්‍රව්‍ය මෙන් ම කාර්ය මණ්ඩල හිඟකම ආදී ගැටලු හේතුවෙන් සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපන අංශයේ කටයුතුවලට බාධා ඇති වී ඇත. එසේ වුවද, තිබෙන සම්පත් උපරිම හා කාර්යක්ෂම අන්දමින් ප්‍රයෝජනයට ගෙන ජාතික පුස්තකාල එකතුව ආරක්ෂා කිරීම හා ජාතික මට්ටමේ සංරක්ෂණ කටයුතු ඉටු කිරීම සංරක්ෂණ අංශය විසින් සාර්ථකව කරගෙන යනු ලබන බව සඳහන් කළ හැකිය.


## ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
## පොත් බැඳුම් ද්‍රව්‍ය අළෙවි කිරීමේ ව්‍යාපෘතිය

පුස්තකාල ආශ්‍රිතව පිහිටුවා ඇති සංරක්ෂණ මධ්‍යස්ථාන සඳහා අවශ්‍ය පොත් බැඳුම් ද්‍රව්‍ය සපයා දීම මෙම ව්‍යාපෘතියෙහි අරමුණ වේ.

**පොත් බැඳුම් ද්‍රව්‍ය කට්ටලයක අඩංගු ද්‍රව්‍ය**

- රෙක්සින් මීටර් 07
- කෙම්බ්‍රික්ස් කිලෝ 01
- ටිප් බෝඩ් 25
- සුදු රෙදි මීටර් 02
- කාකි රෙදි මීටර් 01
- නූල් පන්දු 01
- මාබල් කොල 05
- එතුම් කොල 05
- ලෙදරට් කොල 02
- කාට්රිජ් කොළ 20

මිල රු. 3000.00

විමසීම ;

අධ්‍යක්ෂ ජනරාල්
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
අංක 14, නිදහස් මාවත, කොළඹ 07.

# තොරතුරු තාක්ෂණ අංශය

චමින්ද හිමේෂ් ද සිල්වා
අංශ ප්‍රධාන

ජාතික සංවර්ධනය සඳහා පර්යේෂකයන්ට නවතම තොරතුරු කඩිනමින් ලබාදීම අතිශයින් වැදගත්වන බැවින්, එම කාර්යය සඳහා 1993 වසරේ තොරතුරු තාක්ෂණ අංශය ආරම්භ කරන ලදී. තොරතුරු තාක්ෂණ අංශයේ ප්‍රධාන අරමුණ වනුයේ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ සහ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයේ කටයුතු පරිගණකගත කිරීම සහ අනිකුත් පුස්තකාලවල කටයුතු පරිගණකගත කිරීම සඳහා සහාය ලබාදීමය.

ජාතික පුස්තකාලයේ තොරතුරු තාක්ෂණ අංශය ස්ථාපිත කිරීමේ දී බාහිර උපදේශක සේවා ලබා ගැනීමට සිදුවිය. එවකට අන්තර්ජාතික වාරි කළමනාකරීත්ව ආයතනයේ ප්‍රධාන පුස්තකාලයාධිපති එන්.යූ. යාපා මහතාගේ උපදෙස් යටතේ ජාතික පුස්තකාලයට පරිගණක තාක්ෂණය හඳුන්වාදීමේ විශේෂ සැලසුමක් නිර්මාණය කරන ලද අතර, ආරම්භක පියවර ලෙස 1993 වසරේදී ජාතික පුස්තකාල සූචිය පරිගණකගත කිරීම සහ ජාතික ග්‍රන්ථ නාමාවලිය පරිගණකගත කිරීමට සුදුසු දත්ත පදනමක් CDS/ISIS මෘදුකාංගය ඇසුරින් නිර්මාණය කරන ලදී. එමෙන්ම ඒ සඳහා අදාළ කාර්ය මණ්ඩලය පුහුණු කිරීමට ද පියවර ගනු ලැබීය.

මීට අමතරව, ජාතික පුස්තකාලය සඳහා පරිගණකගත ජාතික ඒකාබද්ධ සූචියක් (UCAT) නිර්මාණය කර පරිගණකගත කරන ලද පුස්තකාලවලින් දත්ත ලබාගෙන, ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනයේ මූලික කටයුතු ද ආරම්භ කරන ලදී.

ජාතික පුස්තකාලයේ අභ්‍යන්තරික පරිගණක ජාලය (LAN) නිර්මාණය කිරීම සඳහා ඇමෙරිකානු පුස්තකාල සංගමයේ අධිශිෂ්‍යත්වලාභී ස්ටීවන් කර්වෝෆ් මහතාගෙන් ලද උපදෙස් හා සහාය විශේෂයෙන් සඳහන් කළ යුතුය. ජාතික පුස්තකාලයේ කාර්ය මණ්ඩලය පරිගණක භාවිතය සඳහා පුහුණු කිරීමේ කෙටිකාලීන පාඨමාලා ගණනාවක් ඔහු විසින් පවත්වා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයේ සෑම අංශයකම වෘත්තීය කාර්ය මණ්ඩලයට එම පුහුණු පාඨමාලාවලට සහභාගිවීමට අවස්ථාව ලබාදුනි. ඔහුගෙන් සිදු වූ විශේෂ මෙහෙවර නම් ශ්‍රී ලංකාවේ 50 වන නිදහස් සමරු අවස්ථාව සැමරීම සඳහා ජාතික පුස්තකාල වෙබ් අඩවිය සම්පාදනය කිරීමයි.

ආයතනයේ සියලුම අංශවල පරිගණක කටයුතු අධීක්ෂණය හා සම්බන්ධීකරණය කිරීම, ජාතික පුස්තකාලයේ පිහිටුවා ඇති අභ්‍යන්තර පරිගණක ජාලය (Local Area Network) පවත්වාගෙන යාම සහ අවශ්‍යතාවන් අනුව ව්‍යාප්ත කිරීම, Alice for Windows (AfW) මෘදුකාංග පද්ධතිය පවත්වාගෙන යාම, අන්තර්ජාල සේවා සම්බන්ධීකරණය සහ Internet Leased Line සබඳතාව පවත්වාගෙන යාම, ජාතික පුස්තකාලය සඳහා නිර්මාණය කරන ලද Web Server හා Mail Server පවත්වාගෙන යාම, පුහුණු පාඨමාලා සංවිධානය කිරීම (අධ්‍යාපන අංශය සමඟ), ක්ෂේත්‍රයේ වෙනත් ජාතික ආයතන, සංවිධාන සමඟ සබඳතා පවත්වාගෙන යාම සහ Desktop ප්‍රකාශන කටයුතු, තොරතුරු තාක්ෂණ අංශය ඉටුකරන ප්‍රධාන කාර්යයන් වේ.

1989 වර්ෂයේ දී ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය EPSON වර්ගයේ පරිගණකයක් මිල දී ගන්නා ලද අතර, 1993 වර්ෂයේ තොරතුරු තාක්ෂණ අංශය ආරම්භ කරන අවස්ථාව වනවිට ජාතික පුස්තකාලය සතුව පරිගණක තුනක් තිබිණ. මෙම අංශයේ කටයුතු ක්‍රමයෙන් වර්ධනය වී 1998 වර්ෂය වනවිට ජාතික පුස්තකාලයේ විවිධ අංශ සම්බන්ධ කරමින් අභ්‍යන්තරික පරිගණක ජාලයක් ආරම්භ කරන ලදී. දැනට Pentium I, II, III වර්ග වලට අයත් පරිගණක 31ක් අභ්‍යන්තර පරිගණක ජාලයට සම්බන්ධ කර ඇත.

තොරතුරු තාක්ෂණ අංශය ආරම්භ කළ මුල් අවධියේ දී CDS/ISIS මෘදුකාංගය පුස්තකාල ස්වයංක්‍රියකරණ කටයුතු සඳහා යොදා ගැණිනි. මෙම මෘදුකාංගය ඇසුරින් ජාතික පුස්තකාල සූචිය, ජාතික ඒකාබද්ධ සූචිය, ජාතික ග්‍රන්ථ නාමාවලිය, ISBN ප්‍රකාශකයින්ගේ තොරතුරු ඇතුළත් දත්ත පරිගණකගත කරන ලදී. මෙම ස්වයංක්‍රියකරණය කිරීමේ කාර්යයන් ක්‍රමවත්ව සහ කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා 2000 වර්ෂයේ දී ඉන්දියාවේ Softlink Asia (Pvt) Ltd ආයතනය වෙතින් Alice for Windows නම් අනුකලිත (Integrated) මෘදුකාංගය මිල දී ගන්නා ලදී. පුස්තකාල ප්‍රතිග්‍රහණ කටයුතු, සූචිකරණ කටයුතු,

35 පිටුවට

# ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයේ ග්‍රන්ථ විඥාපන සේවාවන්

යූ.පී.අලහකෝන්
අංශ ප්‍රධාන
ග්‍රන්ථ විඥාපන සේවා අංශය

රටක පළවන පොත පත පිළිබඳ ලේඛනයක් ලෙසින් සැලකෙන ජාතික ග්‍රන්ථ නාමාවලිය සම්පාදනය කිරීම ජාතික පුස්තකාලයක ප්‍රමුඛත ම කාර්යයක් බව කේ.ඩබ්ලිව්.හම්ප්‍රීස්, මොරිස් ලයින්, අබු- අල්නහරි වැනි පුස්තකාල න්‍යායවේදීන් විසින් පැහැදිලිව දක්වා ඇත. මෙයට අමතරව ජාතික මට්ටමේ ග්‍රන්ථ විඥාපන සේවා ව්‍යාපෘති පවත්වාගෙන යාම ද ජාතික පුස්තකාලයක වැදගත් කාර්යයක් හා වගකීමක් වේ. නිදසුනක් ලෙස මැලේසියානු හා සිංගප්පූරු ජාතික පුස්තකාලය විසින් පළ කරනු ලබන වාර සඟරා ලිපි අනුක්‍රමණිකා දැක්විය හැකිය. මෙයට අමතරව විවිධ විෂයයන්ට අදාළ නාමාවලි සහ අනුක්‍රමණිකා මෙන් ම සම්මන්ත්‍රණ අනුක්‍රමණිකා ද ජාතික පුස්තකාල විසින් සම්පාදනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය නිල වශයෙන් විවෘත කරන ලද්දේ 1990 දී වුව ද ජාතික පුස්තකාලයක කාර්යයන් බොහොමයක් 1972 වසරේ සිට ජාතික පුස්තකාල සේවා මණ්ඩලය විසින් පවත්වාගෙන යන ලදී. ශ්‍රී ලංකාවේ ජාතික පුස්තකාලයේ උපත අනෙකුත් ආසියානු රටවලට සාපේක්ෂව ප්‍රමාද වුව ද ජාතික පුස්තකාලයේ කාර්යයන් රැසක් වෙනත් ආයතන විසින් ඉටු කරනු ලැබීම විශේෂ තත්ත්වයක් වේ. ඒ අනුව 1963 සිට 1974 දක්වා ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය පළ කිරීමේ කාර්යයට උර දෙන ලද්දේ ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවය. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය එම වගකීම භාර ගන්නා ලද්දේ 1974 වසරේ දී ය.

පසුගිය වසර 29 තුළ විවිධ අභියෝග, දුෂ්කරතා සහ ජයග්‍රහණ මධ්‍යයේ ජාතික ග්‍රන්ථ නාමාවලිය සම්පාදනය අඛණ්ඩව පවත්වාගෙන යාමට ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයට හැකි වී තිබේ.

## ආවරණය

ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය සම්පාදනය කිරීම ආරම්භයේ දී ඊට ඇතුළත් කර ඇත්තේ රට තුළ ප්‍රකාශිත පොත පත පමණි. එම ප්‍රකාශන පිළිබඳ තොරතුරු ලබා ගැනීම සඳහා ප්‍රධාන වශයෙන් ම ජාතික ලේඛනාරක්ෂකයෙන් ලැබෙන නැන්පතු පිටපත භාවිත කරන ලදී. 1990 දී ජාතික පුස්තකාලය නිල වශයෙන් විවෘත කිරීමත් සමග ජාතික ග්‍රන්ථ නාමාවලියේ තොරතුරු ආවරණය ද පුළුල් කෙරිණි. මෙහි දී ශ්‍රී ලාංකීය ප්‍රකාශන යන්න වඩාත් පුළුල් අර්ථයකින් භාවිත කරන ලදී. ඒ අනුව හුදෙක් රට තුළ මුද්‍රිත ප්‍රකාශන පමණක් නොව ශ්‍රී ලංකාව පිළිබඳව රචිත විදේශයන්හි ප්‍රකාශිත පොත පත ද වෙනත් රටවල වෙසෙන ශ්‍රී ලාංකිකයන් විසින් රචිත පොත පත ද ඊට ඇතුළත් කෙරිණි.

ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලියට තොරතුරු ලබා ගැනීමේ මූලාශ්‍ර සංඛ්‍යාව ද මෙම කාල සීමාව තුළ විවිධත්වයට පත් විය. 1973 දක්වා නීතිමය තැන්පතුව මගින් ලැබෙන පිටපතින් සෑහීමකට පත් වුව ද එමගින් සියලුම ශ්‍රී ලාංකික ප්‍රකාශන ආවරණය නොවන බව පැහැදිලි කරුණකි. මෙහි ප්‍රතිඵලය වන්නේ මෙරට පළවන සියලුම ප්‍රකාශන පිළිබඳ තොරතුරු ජාතික ග්‍රන්ථ නාමාවලියට.ඇතුළත් නොවීමය. ජාතික ග්‍රන්ථ නාමාවලිය සම්පාදනය කිරීම ජාතික පුස්තකාල සේවා මණ්ඩලයට පැවරීමෙන් පසු එයට තොරතුරු ලබා ගැනීමේ මූලාශ්‍ර පුළුල් කිරීමට හැකියාව ලැබිණි. මේ සඳහා මූලික වශයෙන් ම හේතු වූයේ ශ්‍රී ලංකාවේ ග්‍රන්ථ ප්‍රකාශනයට සම්බන්ධ ප්‍රධාන ව්‍යාපෘති දෙකක් ජාතික පුස්තකාල සේවා මණ්ඩලය විසින් ආරම්භ කිරීමය. එනම් ලේඛකාධාර ව්‍යාපෘතිය සහ අන්තර් ජාතික ප්‍රමිත ග්‍රන්ථ අංක ව්‍යාපෘතියයි. නීතිමය තැන්පතුවෙන් ආවරණය නොවන ප්‍රකාශන පිළිබඳ තොරතුරු මෙම ව්‍යාපෘතිවලින් ලබා ගැනීමට හැකියාව ලැබේ. මෙයට අමතරව ජාතික පුස්තකාල එකතුවට මිල දී ගනු ලබන ප්‍රකාශන වලින් ද ජාතික ග්‍රන්ථ නාමාවලිය සම්පාදනයට අවශ්‍ය තොරතුරු ලබා ගැණින.

පසුගිය දශක කිහිපයකට ආසන්න කාලය තුළ දැකිය හැකි තවත් විශේෂ ලක්ෂණයක් වන්නේ ජාතික ග්‍රන්ථ නාමාවලිය පළ කිරීමේ අනුකාලිකතාවෙහි පැවති විවිධත්වයයි. එය වාර්ෂික, අර්ධ වාර්ෂික, ත්‍රෛමාසික සහ මාසික වශයෙන් විවිධ විය. එහෙත් 1994 සිට මේ දක්වා ජාතික ග්‍රන්ථ නාමාවලිය මාසික කලාප ලෙස පළ කෙරේ. මේ අනුව පසුගිය වසර නවය පුරා ජාතික ග්‍රන්ථ නාමාවලිය පළ කිරීමේ අනුකාලිකතාවය ස්ථාවරත්වයට පත්ව ඇති බව පෙනේ. මෙලෙස මාසිකව ජාතික ග්‍රන්ථ නාමාවලිය පළ කිරීම එහි කාලීනත්වය රැක ගැනීමට බෙහෙවින් උපකාරී වී ඇත.

ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලියේ ආවරණය පිළිබඳව වර්තමානයේ සෑහීමකට පත් විය හැකි වුවත් එහි අඩුපාඩු නැත්තේ ම නොවේ. 2001 වසරේ සිට පවත්නා මූල්‍ය අර්බුදය හේතුවෙන් ලේඛකාධාර ව්‍යාපෘතිය අත්හිටුවීමත් ජාතික පුස්තකාල එකතුවට ප්‍රතිග්‍රහණය කරනු ලබන විදේශීය ප්‍රකාශන සීමා කිරීමත් නිසා ජාතික ග්‍රන්ථ නාමාවලිය ආවරණය ප්‍රශස්ථ මට්ටමකට ගෙන ඒමට අපහසු වී ඇත. මෙම අර්බුදකාරී තත්ත්වය ජාතික ග්‍රන්ථ නාමාවලියේ ගුණාත්මකභාවය කෙරෙහි සෘජුව බලපායි. එහෙයින් නැවතත් ජාතික ග්‍රන්ථ නාමාවලිය සම්පාදනයේදී වැඩි වශයෙන් ම නීතිමය තැන්පතු පිටපත් මත යැපීමට සිදු වී ඇත. මෙම නීතිය යටතේ ප්‍රකාශන ලැබීම ද සංගත බවක් නොමැති අතර සමහර වැදගත් ප්‍රකාශන ලැබෙනුයේ බොහෝ ප්‍රමාද වීමෙනි.

ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලියේ ආවරණය වඩාත් පරිපූර්ණ කිරීමට නම් මුද්‍රිත නොවන මාධ්‍යවලින් නිකුත් කරනු ලබන ප්‍රකාශන ද ඇතුළත් කළ යුතුය. නිදසුනක් වශයෙන් ශ්‍රව්‍ය පට, වීඩියෝ පට, චිත්‍රපට, සූක්ෂම ඡායා ස්වරූප, සංයුක්ත තැටි සහ අන්තර්ජාල සම්පත් යනාදිය දැක්විය හැකිය. එහෙත් මෙකී ද්‍රව්‍ය ආවරණය වන ආකාරයට ශ්‍රී ලංකාවේ තැන්පතු නීතිය යාවත් කාලීන වී නොතිබීම ඒ පිළිබඳ තොරතුරු ලබා ගැනීමේ දී මතුවන ප්‍රධානත ම බාධකයකි. එහෙයින් 21 වෙනි සියවසේ තොරතුරු හා දැනුම් ද්‍රව්‍යයන්ගේ නිෂ්පාදිත රටාවට අනුකූල වන ආකාරයට තැන්පතු නීතිය සංශෝධනය කිරීම අත්‍යවශ්‍ය කරුණකි.

ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය සම්පාදනය කිරීම සඳහා ආරම්භයේ සිට ම අනුගමනය කරනු ලබන්නේ දාම හෙවත් පරම්පරා අනුක්‍රමණිකාකරණය වේ. පරිගණක දත්ත පදනමක් ලෙස ජාතික ග්‍රන්ථ නාමාවලිය සකස් කිරීමේ දී මෙකී අනුක්‍රමණිකා ක්‍රමයේ සංකීර්ණත්වය ගැටලුවක් වී ඇත. එමෙන් ම සිංහල අක්ෂරවලින් දත්ත පදනම් සකස් කිරීමේ නොහැකියාව ග්‍රන්ථ නාමාවලිකරණයේ දී මුහුණ දීමට සිදු වී ඇති බරපතල ගැටලුවකි. ජාතික ග්‍රන්ථ නාමාවලිය මුද්‍රිත ප්‍රකාශනයක් ලෙස නොව සංයුක්ත තැටියක් ලෙසින් නිකුත් කිරීම නූතන ප්‍රවණතාව වේ. නිදසුනක් ලෙස බ්‍රිතාන්‍ය ජාතික ග්‍රන්ථ නාමාවලිය, ඔස්ට්‍රේලියානු ජාතික ග්‍රන්ථ නාමාවලිය, සිංගප්පූරු ජාතික ග්‍රන්ථ නාමාවලිය දැක්විය හැකිය. එහෙයින් සිංහල අක්ෂරවලින් දත්ත පදනම් කිරීම සකස් කිරීම පමාවන තාක් ග්‍රන්ථ නාමාවලිකරණයේ තාක්ෂණික අංශයෙන් අපට ගමන් කිරීමට සිදු වනුයේ අනෙකුත් රටවලට වඩා බොහෝ පිටුපසිනි. විශේෂයෙන් වාර්ෂික සමුච්චිත වෙළුම්වල අන්පිටපත් සකස් කිරීමේ දී ගත වන අනවශ්‍ය ප්‍රමාදය ද එමගින් වළක්වා ගත හැකිය.

ශ්‍රී ලංකාවේ ජාතික ග්‍රන්ථ නාමාවලි සම්පාදනය ආරම්භ වූයේ 1963 වුව ද මෙරට මුද්‍රණ කර්මාන්තයේ ඉතිහාසය 1737 දක්වා ඈතට දිව යයි. ඒ අනුව 1737 සිට 1962 දක්වා වූ කාලය ආවරණය වන පරිදි පූර්වකාලීන ජාතික ග්‍රන්ථ නාමාවලිය සම්පාදනය කිරීම ද ග්‍රන්ථ විඥාපන සේවා අංශයේ කාර්යයකි. මේ වන විට 1737 සිට 1884, 1885 සිට 1900 1901 සිට 1910 සහ 1962 යන කාල වකවානුවලට අයත් පූර්වකාලීන ජාතික ග්‍රන්ථ නාමාවලි සම්පාදනය කර ඇත. මෙය බෙහෙවින් දුෂ්කර සහ කල්ගතවන කාර්යයකි. විශේෂයෙන් මෙම කාල වකවානුවට අයත් ප්‍රකාශන දිවයිනේ පුස්තකාල ගණනාවක විසිරී තිබීම, සමහර ප්‍රකාශන රට තුළ නොතිබීම යනාදිය මේ අතරින් ප්‍රධානතම ගැටලුව වේ. විශේෂයෙන් මෙම කාල සීමාව අයත් වැදගත් හා වටිනා ප්‍රකාශන බොහොමයක් තිබෙනුයේ බ්‍රිතාන්‍ය කෞතුකාගාර පුස්තකාලය, නෙදර්ලන්ත රාජකීය පුස්තකාලය, ප්‍රංශ ජාතික පුස්තකාලය යනාදී බටහිර රටවල පුස්තකාලවලය. කෙසේ වෙතත් ශ්‍රී ලංකාවේ ප්‍රකාශන කර්මාන්තයේ මුල් අවධිය පිළිබඳ මනා අවබෝධයක් ලබා ගැනීමට මෙම ග්‍රන්ථ නාමාවලිය බෙහෙවින් උපකාරී වේ.

විවිධ විෂය ක්ෂේත්‍රවයලට අදාළ විශේෂ ග්‍රන්ථ නාමාවලී සම්පාදනය කිරීම ද ග්‍රන්ථ විඥාපන සේවා අංශයේ කාර්යයකි. ළමා ග්‍රන්ථ නාමාවලිය ඒ අතරින් ප්‍රමුඛස්ථානයක් හිමි කර ගනී. ඒ ඒ වර්ෂයන්හි ළමයින් උදෙසා ප්‍රකාශිත පොත පත පිළිබඳ විස්තර මෙහි අන්තර්ගතය. ළමා පුස්තකාල සංවර්ධනය කිරීමේ දී මෙය බෙහෙවින් ප්‍රයෝජනවත් වන මූලාශ්‍රයකි.

දැනුම බෙදා හැරීමේ ප්‍රබල හා කාලීන මාධ්‍යයක් ලෙස වාර සඟරා හැඳින්විය හැකිය. මෙම වාර සඟරාවල පළවන ලිපිවලට ප්‍රවේශය සැපයීම ඕනෑම රටක දැනුම හා පර්යේෂණ ප්‍රවර්ධනයේ තීරණාත්මක සාධකයක් වේ. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයේ ග්‍රන්ථ විඥාපන සේවා අංශය විසින් ශ්‍රී ලංකා වාර සඟරා ලිපි අනුක්‍රමණිකාව පළ කරනුයේ මෙකී අවශ්‍යතාව සපුරාලීම සඳහා ය. 1998 දී ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය පසුගිය වසර කිහිපය තුළ බෙහෙවින් ජනප්‍රියත්වයට පත් ව ඇත. මෙහි දී ද ශ්‍රී ලංකාවේ පළවන වාර සඟරා ලිපි පමණක් නොව ශ්‍රී ලංකාව පිළිබඳ විදේශීය වාර සඟරාවලට රචනා කරන ලද ලිපි ද ඇතුළත් කෙරේ. එමෙන් ම හුදෙක් වාර සඟරා පමණක් නොව විද්වතුන් ශාස්ත්‍රඥයන් හා ප්‍රකට පුද්ගලයන් වෙනුවෙන් පළ කරනු ලබන සමරු කලාපවල අන්තර්ගත ලිපි ද ලිපි එකතු හා සම්මන්ත්‍රණ සැසි වාර්තා ද මෙහි දී අනුක්‍රමණිකාගත කෙරේ. මෙම අනුක්‍රමණිකාව වර්තමානයේ උපාධි අපේක්ෂකයන් විද්වතුන් හා පර්යේෂකයන් විසින් නිරන්තරයෙන් පරිහරණය කරනු ලබන ද්විතීක මූලාශ්‍රයක් බවට පත් ව ඇත. වර්තමානයේ පවත්නා මූල්‍ය අර්බුදය හමුවේ ජාතික පුස්තකාලයට ප්‍රතිග්‍රහණය කරනු ලබන දේශීය හා විදේශීය සඟරා ප්‍රමාණය සීමා කිරීමට සිදු වීම මෙම


අනුක්‍රමණිකාවේ ආවරණයෙහි ගුණාත්මක භාවය හීන වීමට බලපා ඇත. මෙයට විකල්පයක් වශයෙන් මෙරට ප්‍රධාන පුස්තකාල කිහිපයක වාර සඟරා එකතු ගවේෂණයෙන් තොරතුරු ලබා ගැනීම සිදු කෙරේ. එමෙන් ම ඉලෙක්ට්‍රොනික වාර සඟරා ගවේෂණයට ජාතික පුස්තකාලය සතු හැකියාව ද මෙහි දී ප්‍රයෝජනයට ගනු ලැබේ. දෙශීය වාර සඟරා නීතිමය තැන්පතුවෙන් ප්‍රධාන වශයෙන් ආවරණය වුවත් ඒවා නියමිත පරිදි ක්‍රමානුකූල ව නොලැබීම ගැටලුවක් වී ඇත.

ග්‍රන්ථ විඥාපන සේවා අංශය විසින් සම්පාදනය කරනු ලබන විවිධ නාමාවලි සහ අනුක්‍රමණිකාවන්ගේ ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීමට පසුගිය වසර කිහිපය තුළ පියවර රැසක් ගෙන තිබේ. ශ්‍රී ලංකාවේ ජාතික ග්‍රන්ථ නාමාවලිය සම්පාදනයට අදාළ ප්‍රතිපත්ති මාලාවක් ලේඛනගත කිරීම එක් පියවරකි. මෙරට ප්‍රවීන පුස්තකාලයාධිපතීන් රැසකගේ දායකත්වය ඇති ව සකස් කරන ලද මෙම ප්‍රතිපත්ති මාලාව 2002 වර්ෂයේ දී එළි දක්වන ලදී. මෙය සකස් කිරීමේ දී ජාතික ග්‍රන්ථ නාමාවලිකරණය පිළිබඳ විවිධ අන්තර්ජාතික සමුළුවලදී කරන ලද නිර්දේශ මෙන් ම දියුණු පුස්තකාල සේවා පවත්නා රටවල තත්ත්වයන් ද සැලකිල්ලට ගැණිනි.

ශ්‍රී ලංකාවේ ග්‍රන්ථ විඥාපන සේවාවන්ට අදාළව පොදු අඩුපාඩුවක් ලෙස කර්තෘ නාම, ග්‍රන්ථ නාම, සංස්ථා නාම, විෂය නාම පිළිබඳ සාධිකාරී ලේඛනයක් නොමැති වීම දැක්විය හැකිය. මේ පිළිබඳව විශේෂ අවධානය යොමු කළ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය 2001 වර්ෂයේ දී මෙම කාර්ය සඳහා විශේෂ කමිටුවක් පත් කරන ලදි. මේ අනුව ශ්‍රී ලංකාවේ කර්තෘ නාම පිළිබඳ සාධිකාරී ලේඛනය සකස් කිරීමට හැකියාව ලැබී ඇත. එය මෙම වසරේ දී මුද්‍රණ ද්වාරයෙන් නිකුත් කිරීමට කටයුතු යොදා ඇත. මෙය ජාතික මට්ටමේ ග්‍රන්ථ විඥාපන පාලනයක දී පැවතිය යුතු අත්‍යවශ්‍ය මෙවලමකි.

සිංහල අක්ෂරවලින් දත්ත පදනමක් සකස් කිරීමේ අපහසුතාව පැවතිය ද ජාතික ග්‍රන්ථ නාමාවලිය නවීන තාක්ෂණික ලෝකයක් සමග සමාන්තරව ගමන් කිරීමට අදාළ මූලික පියවර දැනටමත් ඇත. මේ අනුව 2000 වසරේ ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලියේ ඉංග්‍රීසි කොටස සංයුක්ත තැටියක් ලෙසින් මෙම වසරේ දී නිකුත් කරනු ඇත. එය මෙරට ග්‍රන්ථ නාමාවලිකරණයේ සුවිශේෂ සන්ධිස්ථානයක් වනු ඇත. මෙලෙස ඉදිරි සෑම වර්ෂයක ම ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලියේ ඉංග්‍රීසි කොටස සංයුක්ත තැටියක් ලෙසින් නිකුත් කෙරේ.

දකුණු ආසියානු කලාපයේ අනෙකුත් රටවල ජාතික ග්‍රන්ථ නාමාවලි හා සැසඳීමේ දී ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලියේ ආවරණය, සැකැස්ම හා කාලීනත්වය පිළිබඳව යම්තාක් දුරකට සෑහීමකට පත් විය හැකිය. එසේ වුවත් මැලේසියාව, ඔස්ට්‍රේලියාව



පූර්වකාලීන ග්‍රන්ථ නාමාවලිය(1901-1910) එළිදැක්වීම

වැනි රටවල් හා සැසඳීමේ දී තාක්ෂණික අංශයෙන් මෙන් ම කාලීනත්වය හා ආවරණය අතින් ද සිටිනුයේ ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලියට වඩා බොහෝ ඉදිරියෙනි. ඔස්ට්‍රේලියානු ජාතික ග්‍රන්ථ නාමාවලියට සූක්ෂම ජායා ස්වරූප හා පරිගණක ගොනු පමණක් නොව මුද්‍රිත සංගීත කෘති ද ඇතුළත් කෙරේ. මැලේසියානු ජාතික ග්‍රන්ථ නාමාවලියට මුද්‍රිත පොත පතට අමතරව 1989 සිට ශ්‍රව්‍ය පට, වීඩියෝපට, ග්‍රැමෆෝන් තැටි හා චිත්‍රපටි පිළිබඳ තොරතුරු ඇතුළත් වේ. ඉන්දීය හා මැලේසියානු ජාතික ග්‍රන්ථ නාමාවලිය සියලුම භාෂාවලට අදාළ තොරතුරු අනුවර්තන සලකුණු යොදා රෝම අක්ෂරවලින් දක්වා තිබේ. එහෙත් මැලේසියානු ජාතික ග්‍රන්ථ නාමාවලියට තොරතුරු ඇතුළත් කරනුයේ ඒ ඒ භාෂාවන්ගේ අක්ෂරවලිනි. එමෙන් ම වර්තමානයේ බොහෝ ජාතික ග්‍රන්ථ නාමාවලි විෂය ශීර්ෂ යෙදීමේ දී භාවිත කරනුයේ කොංග්‍රස් පුස්තකාල විෂය ශීර්ෂ නාමාවලියයි. සංයුක්ත තැටි ලෙසින් නිකුත් කරනු ලබන ඔස්ට්‍රේලියානු ජාතික ග්‍රන්ථ නාමාවලිය තොරතුරු ගවේෂණයේ පහසුව සඳහා එක් කෘතියකට විෂය ශීර්ෂ කිහිපයක් යොදනු ලැබේ. ඉන්දියානු ජාතික ග්‍රන්ථ නාමාවලිය මූලික වශයෙන් ඩිවි දශම වර්ගීකරණයේ ව්‍යුහය අනුගමනය කරන අතර ජාතික අවශ්‍යතාවක් හේතු කොට ගෙන දෙතිත් වර්ගීකරණ අංකය ද සෑම සංලේඛයකට ම ඇතුළත් කරනු ලැබේ. ඔස්ට්‍රේලියානු ජාතික ග්‍රන්ථ නාමාවලි සම්පාදනයේ දී එරටෙහි අනෙකුත් ප්‍රධාන පුස්තකාල සමඟ සාමූහික සූචිකරණ ව්‍යාපෘතියක් පවත්වාගෙන යයි. එය ග්‍රන්ථ නාමාවලියේ ආවරණය පුළුල් කිරීමට බෙහෙවින් උපකාරී වේ. මෙලෙස ඒ ඒ රටවල් විසින් අන්තර්ජාතික මෙන් ම ජාතික වශයෙන් ද පවත්නා තත්ත්වයන් සැලකිල්ලට ගෙන ජාතික ග්‍රන්ථ නාමාවලියේ ව්‍යුහය හා සැකැස්ම යාවත්කාලීන කිරීමට පියවර ගෙන තිබේ.

ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය ද මෙකී තත්ත්වයන්ට අනුකූලව පුස්තකාලයාධිපතීන්ට, පර්යේෂකයන්ට හා සාමාන්‍ය පාඨකයන්ට ද තොරතුරු ගවේෂණයේ දී ප්‍රයෝජනවත් මූලාශ්‍රයක් බවට පත් කිරීමට දශක තුනකට ආසන්න කාලයක් තුළ ගන්නා ලද ප්‍රයත්න කිසියම් දුරකට සාර්ථක වී ඇති බව පැවසිය හැකිය. ★

# ප්‍රලේඛන සේවා අංශය

නාලනී මල්ලවආරච්චි
අංශ ප්‍රධාන

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයේ ප්‍රලේඛන සේවා කටයුතු පවත්වා ගෙන යෑම සඳහා ප්‍රලේඛන සෙවා අංශයෙන් සුවිශේෂී මෙහෙවරක් සිදු වේ. ජාතික පුස්තකාලයේ ඇති තොරතුරු මෙන් ම රටතුළ විසිරී ඇති විවිධ විෂය ක්ෂේත්‍රවල තොරතුරු පාඨකයන් හට ප්‍රයෝජනවත් පරිදි මෙන් ම තොරතුරු ගවේෂණය පහසුවන පරිදි ඉදිරිපත් කිරීම ප්‍රලේඛන සේවාවක අරමුණ වේ. මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීමේ අභිලාෂයෙන් පහත සඳහන් කාර්යයන් ප්‍රලේඛන සේවා අංශය මගින් පවත්වා ගෙන යනු ලැබේ.

1. ජාතික ඒකාබද්ධ සූචිය පවත්වාගෙන යාම
2. සමාජ විද්‍යා ප්‍රලේඛන කටයුතු පවත්වාගෙන යාම
3. ජාතික හා අන්තර්ජාතික පුස්තකාල ජාල සම්බන්ධීකරණ කටයුතු
4. ශ්‍රී ලංකා පුවත්පත් ලිපි අනුක්‍රමණිකාව සම්පාදනය හා ප්‍රකාශනය
5. නාමාවලි, අනුක්‍රමණිකා සහ තොරතුරු සංග්‍රහ සම්පාදනය කිරීම

## 1. ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනය හා පවත්වාගෙන යාම

ශ්‍රී ලංකාවේ ප්‍රධාන පුස්තකාලවල ඇති පොත්පත් සහ පුස්තකාල ද්‍රව්‍ය පිළිබඳ තොරතුරු ජාතික ඒකාබද්ධ සූචියෙහි අන්තර්ගත වේ. ජාතික පුස්තකාලයට පැමිණෙන පාඨකයන්ට අවශ්‍ය පුස්තකාල පුස්තකාල ද්‍රව්‍ය එහි නොමැති නම් ඒවා තිබෙන ස්ථානය පිළිබඳ තොරතුරු ජාතික ඒකාබද්ධ සූචිය මගින් ලබා ගත හැකි වේ.

1986.12.01 දින ජාතික ඒකාබද්ධ සූචිය සඳහා තොරතුරු රැස් කිරීමේ මූලික කටයුතු අරඹන ලදී. ආරම්භයේ දී දායක වූ පුස්තකාල සංඛ්‍යාව 06ක් වුවත්, 2003 වර්ෂය වන විට මෙම සංඛ්‍යාව 75ක් දක්වා වර්ධනය වී ඇත. විශ්ව විද්‍යාල පුස්තකාල, මහජන පුස්තකාල, විශේෂ පුස්තකාල, රාජ්‍ය නොවන ආයතනික පුස්තකාල, කාර්මික විද්‍යාල පුස්තකාල ආදිය ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනයෙහි ලා දායකත්වය ලබා දෙන ආයතන අතර වේ.

| වර්ෂය | දායක වී ඇති පුස්තකාල සංඛ්‍යාව | | පරිගණකගත දත්ත සංඛ්‍යාව |
|---|---|---|---|
| | පරිගණකගත | ශ්‍රමික | |
| 1997 | 25 | 23 | 38610 |
| 1998 | 26 | 27 | 49210 |
| 1999 | 28 | 28 | 67530 |
| 2000 | 35 | 31 | 127208 |
| 2001 | 42 | 26 | 238297 |
| 2002 | 45 | 26 | 264200 |
| 2003 | 48 | 27 | |

දායකත්වය ලැබූ පුස්තකාල මගින් පරිගණකගත ක්‍රමයට සහ ශ්‍රමිකව (සූචි පත්‍රිකා, පරිග්‍රහන ලේඛන, පරිගණකගත මුද්‍රිත ලැයිස්තු) තොරතුරු සැපයීම සිදු කරන අතර, මෙම දත්ත අනුසාරයෙන් පසුගිය වර්ෂවල දී ජාතික ඒකාබද්ධ සූචිය මුද්‍රිත ප්‍රකාශනයක් ලෙස අංක i සිට v දක්වා කොටස් 5ක් ප්‍රකාශනය කරන ලදී. 2002 වර්ෂයේ සිට මෙහි තොරතුරු අන්තර්ජාලය වෙත ප්‍රවිෂ්ට කිරීම අරඹන ලදී. 2003 ජනවාරි දක්වා අන්තර්ජාලය වෙත ප්‍රවිෂ්ට කර තිබෙන දත්ත ප්‍රමාණය 300,000 ඉක්මවා ඇත. ඒ තුළින් ජාතික ඒකාබද්ධ සූචිය වෙත පාඨකයන් හට පහසුවෙන් ප්‍රවිෂ්ට විය හැකි වේ. ජාතික ඒකාබද්ධ සූචියේ කටයුතුවල ප්‍රගතිය පහත සඳහන් පරිදි සාරාංශ කර දැක්විය හැක.

මෙම ව්‍යාපෘතිය පවත්වාගෙන යාමේ දී මුහුණ පෑමට සිදු වී ඇති ගැටළු පහත සඳහන් වේ.

i. දායක වී ඇති පුස්තකාලවලින් අඛණ්ඩව සහ කලට වේලාවට තොරතුරු ලබා නොදීම
ii. දායකත්වලාභීන් සඳහා සම්මන්ත්‍රණ, වැඩමුළු පවත්වා දැනුවත්වීම් සිදු කළ ද, දැනුවත් කළ පරිදි තොරතුරු එවීමට ඔවුන් අපොහොසත් වීම
iii. පරිගණකගත ක්‍රමයට දත්ත එවීමේ දී ඒ ඒ ආයතන විසින් විවිධ මෘදුකාංග භාවිත කිරීම නිසා නියමිත ක්‍රමවේදයකට අනුව දත්ත ලබා නොදීම
iv. දත්ත පදනමට ඇතුළත් විය යුතු අත්‍යවශ්‍ය අංශවල ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු අඩුපාඩු සහිතව දැක්වීම

## 02. සමාජ විද්‍යා ප්‍රලේඛන කටයුතු පවත්වා ගෙන යාම

ශ්‍රී ලංකාවේ සමාජ විද්‍යා තොරතුරු සංවිධානය කිරීමත් සමාජ විද්‍යා පුස්තකාලවල සහ සමාජ විද්‍යා පර්යේෂණවල යෙදෙන පිරිසට සහායවීමත්, සමාජ විද්‍යා ක්ෂේත්‍රයට අදාළ ප්‍රකාශන හා ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු පාලනය කරලීම වැනි අරමුණු ඇතිව විවිධ සමාජ විද්‍යා ප්‍රලේඛන කටයුතු සිදු කරනු ලැබේ. මෙහි කටයුතු පවත්වාගෙන යාම සඳහා සමාජ විද්‍යා විෂය ක්ෂේත්‍රයේ විද්වතුන්ගෙන් සමන්විත ජාතික උපදේශක කමිටුවක සහාය ලබා ගැනේ. ඔවුනගේ උපදෙස් හා මග පෙන්වීම මත අදාළ ව්‍යාපෘති පවත්වාගෙන යාමේ හැකියාව ලැබී ඇත.

එසේ ම ආසියා පැසිපික් කලාපීය සමාජ විද්‍යා විඥාපන ජාලයේ (Asia Pacific Information Network in Social Sciences - APINESS) ශ්‍රී ලංකාවේ නාභික මධ්‍යස්ථානය ලෙස ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මධ්‍යස්ථානය කටයුතු කරයි. මේ යටතේ APINESS Newsletter සඳහා තොරතුරු යොමු කිරීමත් එම ජාලය සමඟ තොරතුරු හුවමාරු කර ගැනීමත් සිදු වේ. මීට අමතරව ශ්‍රී ලංකාවේ සමාජ විද්‍යාඥයන්ගේ නාමාවලිය සකස් කරන ලදී. එහි කොටස් 2 ක් මේ වන විට පළ කර තිබේ. එසේ ම සමාජ විද්‍යා පුස්තකාල, තොරතුරු මධ්‍යස්ථාන සහ දත්ත බැංකු පිළිබඳ නාමාවලිය ද දත්ත පදනමක් සේ පවත්වාගෙන යනු ලැබේ.

## 03. දේශීය පුස්තකාල ජාල සම්බන්ධීකරණය

ශ්‍රී ලංකාවේ ජාතික මට්ටමින් ක්‍රියාත්මක වන වෙනත් පුස්තකාල ජාල සමඟ සමීප සබඳතාවක් පවත්වාගෙන යාම ද ජාතික පුස්තකාල සහ ප්‍රලේඛන


පශ්චාත් උපාධි නිබන්ධන අනුක්‍රමණිකාව II එළිදැක්වීම

මධ්‍යස්ථානය මගින් සිදු කෙරේ. මේ යටතේ ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති ප්‍රධාන පුස්තකාල ජාල 08 ක් සමඟ සබඳතා පවත්වා ගෙන යනු ලැබේ. එම ජාල පහත දැක්වේ.

### 1. SLSTINET
Sri Lanka Scientific and Technical Information Network - ශ්‍රී ලංකාවේ විද්‍යා හා තාක්ෂණ තොරතුරු ජාලය (ජාතික විද්‍යා පදනම මගින් පාලනය වේ.)

### 2. HELLIS
Health Science Library Literature and Information System - සෞඛ්‍ය විද්‍යා පුස්තකාල හා තොරතුරු පද්ධතිය (කොළඹ විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨය මගින් මෙය පාලනය වේ.)

### 3. AGRINET
Agricultural Information Network- කෘෂිකාර්මික තොරතුරු ජාලය (මෙය කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව මගින් පාලනය වේ.)

### 4. ENLINET
Environmental Library Network -පාරිසරික පුස්තකාල තොරතුරු ජාලය (මධ්‍යම පරිසර අධිකාරිය මගින් පාලනය වේ.)

### 5. CINSA
Cultural Information Network in South Asia- දකුණු ආසියානික සංස්කෘතික තොරතුරු ජාලය (මධ්‍යම සංස්කෘතික අරමුදල මගින් පාලනය වේ.)

### 6 . APINMAP
Asia - Pacific Information Network on Medicinal and Aromatic Plants- ආසියා පැසිපික් කලාපීය බෙහෙත් පැලෑටි පිළිබඳ තොරතුරු ජාලය (මෙය කාර්මික තාක්ෂණ ආයතනය මගින් මෙහෙයවනු ලැබේ.)

**7. OSHINET**

Occupational Safty and Health Information Network- වෘත්තීය ආරක්ෂණ හා සෞඛ්‍ය තොරතුරු ජාලය (කම්කරු අමාත්‍යාංශය මෙහි කටයුතු කරගෙන යනු ලැබේ.)

**8. APINESS**

Asia - Pacific Information Network in Social Sciences - ආසියා පැසිපික් කලාපීය සමාජ විද්‍යා විඥාපන ජාලය (මෙහි කලාපීය මධ්‍යස්ථානය ලෙස ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය කටයුතු කරනු ලැබේ.)

9. NATNET LANKA

National Library Network in Sri Lanka- ශ්‍රී ලංකාවේ පුස්තකාල සහ විඥාපන ජාල පිළිබඳ ප්‍රවෘත්ති පත්‍රිකාව සකස් කිරීම ද මෙම අංශය මගින් සිදු කරනු ලබන කාර්යයකි.


## 04. ශ්‍රී ලංකා පුවත්පත් ලිපි අනුක්‍රමණිකාව සම්පාදනය හා ප්‍රකාශනය

පර්යේෂණ කාර්යයෙහි නිරත විද්වතුන් ද, සාමාන්‍ය පාඨකයන් ද, අධ්‍යයන කටයුතුවල නියුතු වූවන් ද ඇතුළු සැම අයෙක් ම පාහේ පුවත්පත් ආශ්‍රයෙන් තොරතුරු ගවේෂණයෙහි නිරත වේ. එම පිරිසගේ පහසුව සඳහා ශ්‍රී ලංකාවේ සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාවලින් පළවන ප්‍රධාන ජාතික පුවත්පත්වල ඇතුළත් විශේෂිත ලිපි අනුසාරයෙන් ශ්‍රී ලංකා පුවත්පත් අනුක්‍රමණිකාව සකස් කරනු ලැබේ. මේ යටතේ 1991, 1992, 1993, 1994, 2000 වර්ෂවලට අදාළ පුවත්පත් ලිපි අනුක්‍රමණිකා කලාප 13 ක් ප්‍රකාශයට පත් කර තිබේ.

## 05. නාමාවලි, අනුක්‍රමණිකා සහ තොරතුරු සංග්‍රහ සම්පාදනය කිරීම

ප්‍රලේඛන සේවා අංශය මගින් ඉටු කරනු ලබන තවත් වැදගත් කාර්යයක් ලෙස මෙය හැඳින්විය හැකිය. විවිධ විෂය ක්ෂේත්‍රවල ඇති ප්‍රකාශනවලට සහ වෙනත් තොරතුරු ගවේෂණයට පහසු ප්‍රවේශයක් ඇති කරලීම මෙමගින් අපේක්ෂා කෙරේ. මේ යටතේ ප්‍රකාශයට පත් වූ නාමාවලි පහත සඳහන් වේ.

### 5.1 පශ්චාත් උපාධි නිබන්ධන නාමාවලිය 1981-2000



උසස් අධ්‍යාපනයේ නියැලි පිරිසට විමර්ශන මූලාශ්‍රයක් ලෙස පශ්චාත් උපාධි නිබන්ධන නිරතුරුව අත්‍යවශ්‍ය වේ. ශ්‍රී ලංකාව පුරා උසස් අධ්‍යාපන ආයතනවල විසිරී පවතින පශ්චාත් උපාධි නිබන්ධන තොරතුරු එක් මූලාශ්‍රයකින් ගවේශනය කිරීමට නොහැකි වීම ගැටලුවක් වී තිබේ. මෙයට පිළියමක් ලෙස ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය මගින් උක්ත අනුක්‍රමණිකාව සකස් කරන ලදී. ශ්‍රී ලංකාවේ විවිධ විශ්ව විද්‍යාලවල විවිධ වූ විෂයයන් අනුව සහ විවිධ භාෂාවලින් පළ වූ පශ්චාත් උපාධි නිබන්ධන රැසක් ඒ ඒ ආයතනවල තිබේ. නමුත් මේ සියල්ලෙහි තොරතුරු ඒ ඒ විශ්ව විද්‍යාලවලට සීමා වී තිබීම නිසා තොරතුරු ව්‍යාප්ත වීමක් හෝ ඇතැම් විශේෂිත මූලාශ්‍ර සොයා ගැනීමේ දුෂ්කරතා පැන නැගී තිබේ. මෙම දුෂ්කරතා මග හැරවීම සඳහා 1981-2000 වර්ෂවල දී ශ්‍රී ලාංකිකයන් විසින් මෙරට විශ්ව විද්‍යාලවලට විදේශී විශ්ව විද්‍යාලවලට සැපයූ පශ්චාත් උපාධි නිබන්ධනවල තොරතුරු ඇතුළත් මෙම අනුක්‍රමණිකාව සම්පාදනය කරන ලදී. මේ සඳහා ශ්‍රී ලංකාවේ සියලුම විශ්ව විද්‍යාල සහ පශ්චාත් උපාධි ආයතනවලින් තොරතුරු ලබා ගන්නා ලදී. විවිධ විෂයයන් යටතේ ලියවුණු පශ්චාත් උපාධි නිබන්ධනවල මාතෘකාවේ අකාරාදී අනුපිළිවෙළ අනුව සූචි ගොනුකර ඇති අතර පද අනුක්‍රමණිකාවක් සහ කර්තෘ අනුක්‍රමණිකාවක් ද සපයා ඇත. එමගින් විවිධ පද යටතේ හෝ කතුවරුන් අනුව නිබන්ධනවල තොරතුරු ක්ෂණිකව ගවේෂණය කිරීමේ හැකියාව තිබේ.

දැනට ප්‍රකාශයට පත් ව ඇති මෙහි පළමු වෙළුම සඳහා පශ්චාත් උපාධි නිබන්ධන 1659 ක තොරතුරු ඇතුළත් ව තිබේ. දෙවන වෙළුම සඳහා පශ්චාත් උපාධි නිබන්ධන 951 ක් ඇතුළත් ව තිබෙන අතර මෙහි තෙවන වෙළුම සම්පාදනය කරමින් පවතී.

මෙය සම්පාදනය කිරීමට පෙර විවිධ ආයතන සහ පුද්ගලයන් විසින් පශ්චාත් උපාධි නිබන්ධන තොරතුරු ඇතුළත් අනුක්‍රමණිකා සම්පාදනය කර තිබේ. ඒවා පිළිබඳ සඳහන් කිරීම ද වැදගත් වේ. ඒ අතර

i. එන්. අමරසිංහ මහතා විසින් සම්පාදනය කරනු ලැබූ ලංකා විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි නිබන්ධන නාමාවලිය 1942-1971. මෙහි සංලේඛ 114 ඇතුළත් ව තිබේ.

ii. උපාලි අමරසිරි මහතා විසින් සම්පාදිත පශ්චාත් උපාධි නිබන්ධන නාමාවලිය 1971-1976. මෙහි සංලේඛ 46 ක් තිබේ.

iii. එම්.ඒ.ගුණපාල මහතා විසින් සම්පාදනය කරනු ලැබූ පශ්චාත් උපාධි නිබන්ධන නාමාවලිය 1976-1981. මෙහි සංලේඛ 97 ක් අන්තර්ගත වී තිබේ.

iv. එන්.ඒ.ඩබ්ලිව්.ඒ.ටී.අල්විස් මහතා විසින් සම්පාදිත පේරාදෙණිය විශ්ව විද්‍යාලයීය නිබන්ධන නාමාවලිය 1942- 1992. මෙහි සංලේඛ 920 ක් අන්තර්ගත වේ.

v. ස්වාභාවික සම්පත්, බලශක්ති සහ විද්‍යා අධිකාරිය මගින් සම්පාදිත පශ්චාත් උපාධි සහ පර්යේෂණ නිබන්ධන පිළිබඳ නාමාවලිය 1965-1983. මෙහි සංලේඛ 437 ක් අන්තර්ගත වේ.

උසස් අධ්‍යාපන කටයුතුවල නිරත විද්වතුනට, පර්යේෂකයන්ට මෙය සුවිශේෂී විමර්ශන මූලාශ්‍රයකි.

## 5.2 ශ්‍රී ලංකා රජයේ ප්‍රකාශන නාමාවලිය

ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව, අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා වෙනත් රජයේ ආයතන මගින් පළ කරනු ලබන ප්‍රකාශන පිළිබඳ තොරතුරු ඇතුළත් ප්‍රකාශනයක් ලෙස මෙය පාඨකයන්ට ඉතා වැදගත් වේ. 1990 වර්ෂයේ සිට 1999 දක්වා වූ රජයේ ප්‍රකාශන නාමාවලි ප්‍රකාශයට පත් කර තිබෙන අතර 2000-2001 වර්ෂවලට අයත් ප්‍රකාශන ඉදිරියේ දී නිකුත් කිරීමට අපේක්ෂා කෙරේ.

## 5.3 ශ්‍රී ලංකා සමුළු අනුක්‍රමණිකාව

පසුගිය වර්ෂ 25 ක් තිස්සේ ශ්‍රී ලංකාවේ පැවැති විවිධ සම්මන්ත්‍රණ, සමුළු, වැඩමුළු පිළිබඳ තොරතුරු අවශ්‍යවන පාඨකයන්ගේ පහසුව සඳහා ශ්‍රී ලංකා සමුළු අනුක්‍රමණිකාව සකස් කර තිබේ.

මෙය සකස් කිරීම සඳහා රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, රාජ්‍ය නොවන සංවිධාන, ජාත්‍යන්තර සංවිධාන හා පුද්ගලික ආයතනවල සහාය ලබා ගෙන තිබෙන අතර, ඒ ඒ ආයතනික මට්ටමින් පැවැති විවිධ සම්මන්ත්‍රණවල තොරතුරු මෙහි ඇතුළත් වේ. සම්මන්ත්‍රණයේ මාතෘකාව, දිනය, ස්ථානය, සංවිධානය කරනු ලැබූ ආයතනය, විෂය ක්ෂේත්‍රය පිළිබඳ තොරතුරු මෙහි අන්තර්ගතව තිබේ. 2000 වර්ෂය දක්වා මෙය මුද්‍රිත ප්‍රකාශනයක් ලෙස නිකුත් වුව ද වර්තමානයේ දත්ත පදනමක් ලෙස පවත්වා ගෙන යනු ලැබේ. ඕනෑම පාඨකයෙකුට මෙම දත්ත පදනම අනුසාරයෙන් ලංකාවේ පැවති සම්මන්ත්‍රණ පිළිබඳ තොරතුරු ගවේෂණය කිරීමේ හැකියාව තිබේ.

මෙම අංශය මගින් පවත්වා ගෙන යනු ලබන පරිගණක දත්ත පදනම් පහත දැක්වේ.

i. ජාතික ඒකාබද්ධ සූචියේ දත්ත පදනම
ii. පශ්චාත් උපාධි නිබන්ධන අනුක්‍රමණිකාව 1981-2000 දත්ත පදනම
iii. ශ්‍රී ලංකා සමුළු අනුක්‍රමණිකාවේ දත්ත පදනම
iv. සමාජ විද්‍යා පුස්තකාල තොරතුරු මධ්‍යස්ථාන පිළිබඳ දත්ත පදනම
v. පුවත්පත් ලිපි අනුක්‍රමණිකාව


# පුස්තකාල සඳහා ලිපි ද්‍රව්‍ය සහ උපකරණ

ලිපි ද්‍රව්‍ය : පාඨක බලපත්‍ර
සූචි පත්‍රිකා
පොත් තුණ්ඩු
දින පත්‍රිකා
පොත් සාක්කු
නියමු ලේබල්
පරිග්‍රහණ ලේඛන (පිටු 150)
පරිග්‍රහණ ලේඛන (පිටු 300)
සාමාජික අයදුම් පත් (සිංහල, දෙමළ, ඉංග්‍රීසි)

ජාතික පුස්තකාල පොත් හල
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
අංක 14, නිදහස් මාවත
කොළඹ 07.

# ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
# தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபை
# National Library and Documentation Services Board








☆ පුස්තකාල සංවර්ධන හා පර්යේෂණ අංශය

☆ අධ්‍යාපන හා පුහුණු අංශය

☆ ප්‍රකාශන හා ග්‍රන්ථ සංවර්ධන අංශය



# The National Library and Library Development Services for the Nation

C. Dushyanthi Daniel
Head/Library Development Division
NLDSB
April 25, 2003

Libraries are considered centres of learning right from the beginning of civilizations and there are a number of famous libraries of old and new, which have helped immensely in the learning and information needs of the people. A few centuries ago, a National Library for a nation too was recognized as an essential need for the development of library system in a country.

The oldest library established at national level in Sri Lanka was the Government Oriental Library, which was set up in 1870. Subsequently there were many developments towards establishing a National Library Service for Sri Lanka and in 1970, the Sri Lanka National Library Services Board (later re-named as the National Library and Documentation Services Board) was established. The main objectives of the Board were to establish a National Library for Sri Lanka, to coordinate, organize and to develop a library system in the country. Accordingly the National Library of Sri Lanka was established in April, 1990. It was renamed as the National Library and Documentation Centre (NLDC) after the new National Library and Documentation Services Board Act No: 51 of 1998. This new act empowered the National Library and Documentation Services Board (NLDSB) to carry out its activities in a better way and it spelled out the functions of the NLDC.

## The NLDSB and NLDC

The National Library and Documentation Centre (NLDC) has many special collections and it is a research and reference library. Collections include bound volumes, periodicals, maps, government publications including gazettes, acts, bills and hanzards, abstracting and indexing journals in CD ROM version and audio visual materials. The NLDSB carries out library development activities in the country and the main functions of the NLDSB is divided into Library development, Library education and training and Publications. In April 2003, the NLDSB celebrates its 33rd and the NLDC its 13th anniversary.

## Library Development activities

The Library Development Division is responsible for carrying out library development activities in the country.



Reading promotion programme in progress

This Division extends its services to all the public, school, departmental and special and other libraries in the country. Planning of library services, advising on such matters, formulating various library standards, by-laws, rules and regulations, carrying out the Provincial library Development Project, assisting libraries by donating books, advising on matters related to recruitment of library personnel, organizing book exhibitions and promoting reading habits specially among the school children are the main

functions of the Library Development Division. Through these functions the Library Development Division. Aims to bring the libraries in the country to excellent information resource centres and thereby serve the nation by satisfying their information needs.

## Provincial Library Development Project

This division started the Provincial Library Development Project in order to involve the Provincial Councils too in the development of libraries in their respective provinces. Under this project it assists Provincial Councils for formulating statutes to initiate library development programmes for their respective provinces. According to these programmes Library Services Boards should be established in each province. Assistance is also given for developing and modernizing library services at provincial level. The Central Province has enacted the legislations and has established the Library Board recently. A number of other provincial councils such as the Western, Southern, North Western and North-Central Provincial Councils have already prepared necessary drafts. Once set up, these Provincial Library Development Boards will be the foundation of the library development of these provinces. With the introduction of this legislation, a new library infrastructure e.g.: Provincial Library Board, Provincial Central Library, District Central Libraries, network of libraries and library training centres will be set up. Special attention will be given to the modernization of library services using Information Communication Technology (ICT). Special attention will be given to school library development at provincial level as well.

## Advisory services

The Library Development Division carries out advisory services, which includes professional advice on library buildings, library furniture, organizing of library material, organizing of library services, applying IT to libraries, conservation of library materials, advice on library staff, library extension services and library management. The Library Development Division, together with the help of the other professional staff at the NLDSB, is in the process of extending its advisory services. Providing detailed as well as summary reports and guidelines for their development activities are part of it. Special visits are made sometimes, to inspect the libraries before giving advice on their development activities. When there is a need for the library staff to be trained in any of these areas, the Library Development Division recommends suitable courses or directs them to the in-service training organized by the Education and Training Division of the NLDSB.

## Grading of libraries

The Library Development Division deals with formulating and updating standards for various types of libraries such as public, school and departmental libraries in the country. An evaluator is appointed to visit the library which requests upgrading of its library and an evaluation report is prepared by the evaluator according to set standards. The specially appointed committee analyses the Evaluation Report and gives its recommendations, which is forwarded to the NLDSB Board for approval. Accordingly, the NLDSB grades these libraries into Supra, Grade 1, Grade 2 and Grade 3. This grading of libraries helps relevant authorities to upgrade their libraries, their librarians and also fill their cadre vacancies. Within the last few years, approximately 475 public libraries, 62 school libraries and 34 departmental libraries have been upgraded by the NLDSB. Standards for evaluation of libraries are updated and edited according to the new developments in the library and information field whenever necessary.

## Reading habit development

Donating books to local libraries is yet another important function of the Library Development Division. Each year, local as well as books that are received from the International Book Aid is donated to needy public, school and some special libraries. The Library Development Division conducts reading promotion programmes in selected less-privileged schools. These schools receive book donations from the NLDSB, and NLDSB organizes lectures and

seminars in these schools.

## National Library Book Shop

The National Library publications and publications of Book Development Projects of the NLDSB are sold at reasonable prices at the National Library Bookshop. Special discounts are given to libraries in their purchases. In addition to books on Social Sciences, Religion, Literature including children's literature and Library Science and library stationery such as catalogue cards, book labels, book cards and acquisition registers are also available in this bookshop.

## Relations with other institutions

This division also assists in the implementation of the library component of the World Bank assisted General Education Project - 2, by serving in various advisory, steering and evaluation committees. The Library Development Division assisted in the formulation of the National School Library Policy, which was declared to the nation in October 2001 by the Ministry of Education and Higher Education, at the International School Librarians' Day celebrations. This division assists in the activities of the newly set up National Institute of Library and Information Sciences (NILIS).

The Library Development Division maintains close relations with professional institutions in the field of library and information science such as the Sri Lanka Library Association (SLLA) and the National Institute of Library and Information Science(NILIS). The NLDSB played a crucial role in establishing NILIS, which was a long felt need for the library profession in this country.

## Book Exhibitions and sale



The other main activity of this division is to organize and conduct book exhibitions at the NLDSB, at provincial and national levels and also participate at national and international book fairs. Special discounts are given in these book exhibitions and a number of public and school libraries benefit annually from these exhibitions.

## Professional support

The Library Development Division also renders professional support to the library personnel in the country. Librarians and institutions contact this division to clarify matters regarding recruitment and appointments. If need arises, it forwards their problems to relevant authorities for consideration. The Library Development Division identifies the shortcomings in the rules and regulations and circulars related to local libraries and assists in revising such documents. The Government Librarians Service Minute was revised recently with the assistance of a special committee and has been submitted to the Ministry of Public Administration. Policy on lost books in libraries too was formulated with the assistance of a special committee.

We also conduct examinations for library recruitment and promotions if requested by any institution.

## International days in the Library and Information field

Celebrating international and national days pertaining to library and information science is yet another activity of this division. At present we coordinate functions to celebrate the International Book and Copyright Day which falls on the 23rd of April , International School Librarians' Day, which is celebrated every fourth Monday in October, National Library Week in April each year and National Literary Month in September. Discussions are being held with other organizations to identify other suitable days in this field.

Life long learning is a must today and efficient library and information services are essential to meet the information challenges of the society. The Library Development Division has many plans for the future, to further improve its services for building up of quality libraries in the nation and is working hard towards achieving its vision. ★

23 පිටුවෙන්


තොරතුරු ගවේශන ආදී පුස්තකාල කාර්යයන් මෙම මෘදුකාංගය මගින් ස්වයංක්‍රියකරණය කර ඇත. එසේම මෙම මෘදුකාංගය මගින් ජාතික පුස්තකාල සූචිය සහ ජාතික ඒකාබද්ධ සූචිය අන්තර්ජාල මගින් ගවේශනය කිරීමට පාඨකයන්ට පහසුකම් සලස්වා ඇත.

පොත්පත්, වාර සඟරා සහ පුවත්පත් යන මුද්‍රිත මාධ්‍යවලට පමණක් සීමා වූ අවධිය අවසන් කරමින් 1997 වර්ෂයේ දී ලෝකයේ ඇති විශාලම තොරතුරු ජාලය වන අන්තර්ජාලයට (Internet) ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය හරහා සම්බන්ධ වීම තොරතුරු තාක්ෂණ අංශයේ කටයුතුවල වැදගත් ඓතිහාසික අවස්ථාවක් ලෙස සැලකිය හැකිය. මීට ප්‍රථම 1995 වර්ෂයේ දී මොරටුව විශ්ව විද්‍යාලයට අනුබද්ධ Lanka Educational Academic and Research Network (LEARN) ආයතනයෙන් විද්‍යුත් තැපැල් (E-Mail) පහසුකම් ජාතික පුස්තකාලයට ලබාගෙන තිබුණි. පාඨකයන්ට අන්තර්ජාලය තුළින් තොරතුරු ලබාදීමෙ කාර්යය වඩාත් කාර්යක්ෂම කිරීම සඳහා 2001 වර්ෂයේ දී කැපවුණු රැහැන් මාර්ගයක් (Dedicated Leased Line) මගින් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය අන්තර්ජාල පහසුකම් ලබාගන්නා ලදී. මෙම කාර්යයන් වඩාත් පුළුල් කිරීම සඳහා මොරටුව විශ්ව විද්‍යාලයේ LEARN ආයතනය හා සම්බන්ධ වී මණ්ඩලය තුළ Web Server එකක් සහ Mail Server ස්ථාපිත කරන ලදී. මේ නිසා ජාතික පුස්තකාලයේ තොරතුරු අන්තර්ජාලයේ පළ කිරීමටත්, අන්තර්ජාලය තුළින් දත්ත පදනම් ගවේශනය කිරීමට හැකිවන සේ සැකසීම, සියලුම පරිගණක සඳහා අන්තර්ජාල පහසුකම් සැලසීම හා මණ්ඩලයේ සහ මධ්‍යස්ථානයේ නිලධාරීන් සහ සියලුම අංශවලට විද්‍යුත් තැපැල් පහසුකම් ලබාදීම වැනි කාර්යයන් සාර්ථකව ඉටු කර ගැනීමට හැකි වී ඇත. ★


## ශ්‍රී ලාංකීය අධ්‍යයනයන්ට අත්වැළක්

### එමර්සන් ටෙනන්ට් ඇසූ දුටු ලංකාව

### Tralations of Sri James Emerson Tennent's "Ceylon"




**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලීය ප්‍රකාශනයකි**

**විමසීම**

**ජාතික පුස්තකාල පොත්හල**
**14, නිදහස් මාවත**
**කොළඹ 07**

# Education & Training Division

Padma Bandaranayake
Head/ Education & Training Division

During the past 33 years of its service to the nation, National Library & Documentation Services Board (NLDSB) has been playing a vital role in providing continuing professional education for the library personnel in various sectors of libraries in Sri Lanka. The NLDSB is considered as the pioneer organisation of professional training for Library & Information Science (LIS) personnel in Sri Lanka.

The vision of the Education & Training Division is to foster & preserve high quality, educationally sound & elaborate training in LIS sector (10th Anniversary, National Library and Documentation Centre, 2000). The NLDSB conducts a continuing professional education programmes for librarians & library staff of public, school, pirivena, special and departmental library sectors in Sri Lanka.

Not only that it conducts public seminars, lectures that are open to any individual with an interest in LIS & other related fields. Our aim is to impart training for librarians in LIS sector & equip them with necessary skills to meet the challenges arising from the technological advancements & to ensure an adequate supply of professionals in the LIS sector in Sri Lanka.

Our basic focus is to prepare librarians & information officers to be "change ready. & well tuned to the need of the times. While working hard towards achieving our vision, various types of short-term training programmes and special seminars are offered on library management for librarians. With the introductioan of the World Bank funded school library development project called GEP-2, special emphasis is given for human resource development that is so essential for the development of school library sector in Sri Lanka. School library sector is the largest but the weakest area in the library sector in Sri Lanka. With the cooperation of Provincial Directors of Education in provinces, school librarian training programmes are conducted in order to facilitate the GEP-2 activities and to ensure achieving its objectives.

Apart from these short term programmes, special seminars and conferences are organised under different themes to celebrate special days and events such as World Book & Copyright Day, International School Library Day, NLDC Anniversaries & the Literary Month. These seminars discuss such topics as library automation, networking & digital development in libraries. Most of the special seminars and workshops are designed on information technology applications in libraries in providing information to users.

In collaboration with the Conservation & Preservation Division, training programmes are organised on conservation of ola leaf manuscripts and book binding under the project called "Establishment of Conservation Centres. of the Conservation & Preservation Division. In-service training is yet another activity done by the Education & Training Division.

As we are aware, most of the important books on LIS are published in English. Some selected LIS publications are translated into vernacular languages for the benefit of students who follow courses on LIS in Sinhala & Tamil. At present we are in the process of identifying resource persons and preparing a database on collected information on resource persons. From time to time further training is given to identified trainers in order to make them up-to-date.

By all these efforts we want our librarians develop to their fullest potential and carry out their duties in an efficient manner to serve the nation. ★

# ප්‍රකාශන හා ග්‍රන්ථ සංවර්ධන අංශය

මුදිතා වැවලආරච්චි
අංශ ප්‍රධාන

දෙස් විදෙස් තොරතුරු එක්රැස් කොට සංවිධානය කර මහජනතාවගේ තොරතුරු අවශ්‍යතා ඉටු කිරීම ජාතික පුස්තකාලය සතු වගකීමක් වේ. නූතන ලෝකයේ දැනුම සන්නිවේදනය කෙරෙන මාධ්‍ය රැසක් තිබුණ ද පොත පතට හිමි ස්ථානය තවම ඉහළ මට්ටමක පවතී. එසේ නම්, කියවීමට සුදුසු ගුණාත්මක බවින් උසස් ග්‍රන්ථ රටතුළ බිහිවිය යුතුව ඇත. මෙම වගකීම මැනවින් අවබෝධ කරගත් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය දේශීය ග්‍රන්ථ ප්‍රකාශනයෙහි ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම උදෙසා ප්‍රකාශන හා ග්‍රන්ථ සංවර්ධන යනුවෙන් අංශයක් ස්ථාපිත කිරීමට කටයුතු කරන ලදී.

## අංශයෙහි ප්‍රධාන ව්‍යාපෘති

### පොත් ප්‍රකාශන ආධාර වැඩපිළිවෙළ

ආධුනික ලේඛකයන් නව නිර්මාණකරණය පිළිබඳව උනන්දු කිරීමත්, රට තුළ ගුණාත්මක ග්‍රන්ථ නිෂ්පාදනයෙහි වර්ධනයක් ඇති කිරීමත් අරමුණු කොට ගෙන මෙම ව්‍යාපෘතිය 1984 දී ආරම්භ කරන ලදී. වර්ෂයක දී ග්‍රන්ථ 100 ක් පමණ මේ යටතේ ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කරන ලදී. 2001 වර්ෂය වන විට එක් කතුවරයෙකු වෙත රු. 75,000.00 ක උපරිමයකට යටත්ව ආධාර මුදල් ලබා දීම සිදුවිය. ආධුනික ලේඛකයන් රැසකට අත දෙමින් නිර්මාණාත්මක හා ගුණාත්මක කෘති රැසක් බිහි කිරීමට මෙම ව්‍යාපෘතිය දායක වී ඇති අතර, මේ වන විට මෙම ව්‍යාපෘතිය යටතේ ප්‍රකාශනය වී ඇති ග්‍රන්ථ නාම සංඛ්‍යාව 1700 ක් පමණ වේ.

### නව ප්‍රකාශන මිල දී ගැනීමේ ව්‍යාපෘතිය

කර්තෘවරුන්හට ඔවුන්ගේ ප්‍රකාශන අළෙවි කර ගැනීමට අත දීමක් වශයෙන් එම ප්‍රකාශනයන් ගෙන් පිටපත් ප්‍රමාණයක් මිල දී ගැනීම මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කරනු ලැබේ. එක් වර්ෂයක දී කතුවරයන් 250 - 300 ත් අතර ප්‍රමාණයකට මේ ආධාර ලබා දී ඇත. රු. 12,000.00 ක උපරිමයකට යටත් ව එක් කතුවරයෙකුගෙන් පිටපත් 25-30 ත් අතර පිටපත් ප්‍රමාණයක් මි දී ගැනීමට කටයුතු කරන ලදී. 2003 වර්ෂය වන විට මේ.යටතේ මිල දී ගන්නා ලද ග්‍රන්ථ නාම සංඛ්‍යාව 4000 ක් පමණ වේ.

### මුද්‍රණයේ නොමැති නව සම්භාව්‍ය කෘති නැවත මුද්‍රණය සඳහා ආධාර ලබා දීමේ ව්‍යාපෘතිය

සාහිත්‍යමය වශයෙන් වැදගත් නමුත් දැනට මුද්‍රණයේ නොමැති ග්‍රන්ථ නැවත මුද්‍රණය සඳහා එම ග්‍රන්ථවල ප්‍රකාශන අයිතිය හිමි ප්‍රකාශකයන් හා කර්තෘ අයිතිය හිමිකරුවන් උනන්දු කරවීම තුළින් එම ග්‍රන්ථ නැවත මුද්‍රණය කිරීමටත්, එවැනි කෘති කියවීමට කැමැත්තක් දක්වන පාඨකයන් හට මුද්‍රිත පිටපත් ලබා ගැනීමට අවස්ථාව සැලසීමත් මෙම ව්‍යාපෘතියෙහි ප්‍රධාන අරමුණු වේ. රු. 75,000.00 ක උපරිම මුදලක් මේ යටතේ එක් ප්‍රකාශකයකු වෙත ලබා දීමට කටයුතු කර ඇති අතර, පාඨකයා හට ඉතා වැදගත් නව සම්භාව්‍ය කෘති රැසක් මෙම ව්‍යාපෘතිය යටතේ නැවත මුද්‍රණය කිරීමට කටයුතු කර ඇත.

උදා:-
- රෝමාගේ වාසනාව
- බටහිර ශ්‍රේෂ්ඨ නව කතා
- සංක්ෂිප්ත ලංකා ඉතිහාසය
- වරකය හා ගොයම් කෙත
- වලව්වක පලහිලව්ව
- ලක්දිව මහායාන අදහස්
- වව්ලුව
- සිංහලයේ ද්‍රවිඩ බලපෑම්

අවශ්‍ය මුදල් ප්‍රතිපාදන නොලැබී යාම නිසා මෙම ව්‍යාපෘති තාවකාලිකව නතර කිරීමට සිදුවීම කණගාටුවට කරුණකි.

### සම්භාව්‍ය කෘති සංස්කරණය/පරිවර්තනය

ශ්‍රී ලංකාවේ ජාතික අනන්‍යතාව ප්‍රකට කරන සම්භාව්‍ය කෘති වත්මන් සහ අනාගත පරපුරෙහි පරිශීලනය උදෙසා සංස්කරණය කොට ප්‍රකාශනය කිරීමත්, විදේශ භාෂාවන්ගෙන් රචිත වැදගත් කෘති

පරිවර්තනය කොට ප්‍රකාශයට පත් කිරීමත් අරමුණු කොට ගෙන මෙම ව්‍යාපෘතිය අරම්භ කරන ලදී. උදාහරණ ලෙස බෞද්ධයන් අතර ඉතා වැදගත් ග්‍රන්ථයක් වන පූජාවලිය මෙම ව්‍යාපෘතිය යටතේ සංස්කරණය කොට ප්‍රකාශයට පත් කරන ලද අතර, ශ්‍රී ලංකාව පිළිබඳව ඉංග්‍රීසි භාෂාවෙන් රචනා වී ඇති වටිනා කෘතියක් වන එමර්සන් ටෙනන්ට්ගේ The Ceylon නම් ග්‍රන්ථය සිංහල භාෂාවට පරිවර්තනය කොට මුද්‍රණය කරන ලදී.

මීට අමතරව පන්සිය පනස් ජාතක පොත හා මහාවංශය ද සංස්කරණය කොට නැවත ප්‍රකාශයට පත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතියි.

## ජාතික පුස්තකාල ප්‍රකාශන මුද්‍රණය කිරීම

පුස්තකාල විද්‍යා හා තොරතුරු තාක්ෂණය යන විෂය ක්ෂේත්‍රයන්ට අදාළව ගුණාත්මක ප්‍රකාශන එළි දැක්වීම මෙම ව්‍යාපෘතියෙහි අරමුණ වේ. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මගින් සම්පාදනය කරනු ලබන නාමාවලී, අනුක්‍රමණිකා හා පුස්තකාල විද්‍යා විෂය ක්ෂේත්‍රයට අදාළ විවිධ ප්‍රකාශන මුද්‍රණය කිරීම මෙම ව්‍යාපෘතිය යටතේ සිදු වේ. ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය, පුවත්පත් ලිපි අනුක්‍රමණිකාව, වාර සඟරා ලිපි අනුක්‍රමණිකාව හා විශේෂ නාමාවලී මේ සඳහා උදාහරණ කිහිපයකි.

තවද, පුස්තකාල විද්‍යා හා තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ පුවත් හා වියතුන්ගේ ලිපි ඇතුළත් පුස්තකාල ප්‍රවෘත්ති ප්‍රකාශනය ත්‍රෛමාසිකව පළ කිරීම ද සිදු කෙරේ. පුස්තකාල ක්ෂේත්‍රයේ කාලීන ප්‍රවෘත්ති සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා තුනෙන් ම රචිත ලිපි ඇතුළත් මෙම සඟරාව පුස්තකාලයාධිපතිවරුන් හට මෙන් ම පුස්තකාල විද්‍යාව හදාරණ සිසුන්ට ද ඉතා වැදගත් ප්‍රකාශනයකි. දේශීය භාෂාවලින් ලියවුණු හෝ දේශීය භාෂාවට පරිවර්තනය කරන ලද පුස්තකාල විද්‍යා හා තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රවල ප්‍රකාශන පළ කිරීම ද මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කෙරෙන වැදගත් කාර්ය භාරයකි.

## අන්තර්ජාතික ප්‍රමිති අංක ව්‍යාපෘතිය

ශ්‍රී ලංකාවේ බිහිවන ප්‍රකාශන සඳහා අන්තර්ජාතික වශයෙන් අනන්‍යතාවක් සහ ප්‍රචාරණයක් ලබා දීම අන්තර්ජාතික ප්‍රමිති අංක ව්‍යාපෘතිය මගින් සිදු වේ. මෙම ව්‍යාපෘතිය 1986 දී ආරම්භ කරන ලදී. ජාත්‍යන්තර ප්‍රමිති සංවිධානයේ ISO 2108 දරන ප්‍රමිති නිර්දේශ අනුව ග්‍රන්ථ සඳහා අන්තර්ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක (ISBN) ත්, වාර ප්‍රකාශන සඳහා අන්තර්ජාතික ප්‍රමිති මාලික අංක (ISSN) ත්, මුද්‍රිත සංගීත ප්‍රකාශන සඳහා අන්තර්ජාතික ප්‍රමිති සංගීත අංක (ISMN) ත් යනුවෙන් වෙන් වෙන් වශයෙන් අංක ලබා දීම සිදු වේ. මේ ආකාරයෙන් ප්‍රකාශන ක්‍රමවත්ව වර්ග කිරීම නිසා එම ප්‍රකාශන නිවැරදිව හඳුනා ගැනීමට හැකි වේ. එමෙන් ම, ප්‍රමිති අංක ලබා ගන්නා ප්‍රකාශකයන්ගේ තොරතුරු හා එම ප්‍රකාශනවල තොරතුරු ද අන්තර්ජාතික ප්‍රමිති අංක තොරතුරු මධ්‍යස්ථානය වෙත යවනු ලබන අතර, එමගින් ලොවෙහි සියලුම පොත් ප්‍රකාශකයින්, පුස්තකාලයාධිපතීන් සහ වෙනත් අදාළ පුද්ගලයන් හට එම තොරතුරු බෙදා හරිනු ලැබේ. ජාතික ප්‍රකාශන හා වෙළඳ කටයුතු සඳහාත්, පුස්තකාල සඳහා ප්‍රකාශන ඇණවුම් කිරීම, සූචිකරණය මෙන් ම තොරතුරු ගවේෂණය වැනි කටයුතුවල දීත් අන්තර්ජාතික ප්‍රමිති අංක බෙහෙවින් වැදගත් වේ. මීට අමතරව, ප්‍රකාශකයන් අතර ප්‍රමිති අංක ක්‍රමය ප්‍රචලිත කිරීම සඳහා වැඩමුළු/ සම්මන්ත්‍රණ සංවිධානය කිරීම මෙන් ම ප්‍රචාරක පත්‍රිකා, පෝස්ටර් නිර්මාණය කිරීම ද මෙම ව්‍යාපෘතිය යටතේ සිදු වේ. වර්තමානයේ ප්‍රකාශකයන් අතර මෙම අංක ක්‍රමය බෙහෙවින් ජනප්‍රිය වී ඇත. එක් වර්ෂයක දී සාමාන්‍යයෙන් අංක 4000 ක් පමණ නිකුත් කෙරේ. 2003 වර්ෂය වන විට මෙම ව්‍යාපෘතිය යටතේ ලියාපදිංචිව ඇති ප්‍රකාශකයන් සංඛ්‍යාව 4720 ක් පමණ වේ.

## ප්‍රකාශනගත සූචිකරණ දත්ත නිකුත් කිරීම

කිසියම් ප්‍රකාශනයකට අදාළ ග්‍රන්ථ විඥාපන තොරතුරු එම කෘතියේ ම මුද්‍රණය කිරීම සඳහා පහසුකම් සලසා දීම මෙම ව්‍යාපෘතියෙහි අරමුණ වේ. දේශීය පුස්තකාල පද්ධතිය තුළ සූචිකරණය මෙන් ම වර්ගීකරණය පිළිබඳව ද ප්‍රමිතියක් ඇති කිරීමට මෙම ව්‍යාපෘතිය බෙහෙවින් ඉවහල් වේ. මෙම ව්‍යාපෘතිය 1998 වර්ෂයේ අග භාගයේ දී ආරම්භ වූ අතර, 2003 වර්ෂය වන විට ප්‍රකාශන 2000 කට පමණ මෙම දත්ත නිකුත් කිරීම සිදු කර ඇත.

## ග්‍රන්ථ ප්‍රකාශනය පිළිබඳ අත්පොත් පළ කිරීම

ග්‍රන්ථ ප්‍රකාශනය පිළිබඳව අන්තර්ජාතික ප්‍රමිතීන් ප්‍රකාශකයන් හා ආධුනික කතුවරයන් වෙත හඳුන්වා දීම සඳහා අත්පොත් පළ කිරීමත් ඒ පිළිබඳ වැඩමුළු පැවැත්වීමත් මෙම ව්‍යාපෘතිය යටතේ සිදු වේ. ග්‍රන්ථ සැකැස්මේ ක්‍රම වේදය නමින් අත්පොතක් 2002 වර්ෂයේ දී එළි දක්වන ලදී.

මෙවැනි ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කිරීම තුළින් නුවණ ලබා දෙන ගුණාත්මක පතපොත පාඨකයා අතරට ගෙන යාම සඳහා ප්‍රකාශන හා ග්‍රන්ථ සංවර්ධන අංශයෙන් සිදුවන මෙහෙය අති මහත්ය. ★

# இலங்கைத் தேசிய நூலகமானது அதனது பிரதான இலக்கினை அடைந்துள்ளதா? ஒரு விமர்சன நோக்கு

எம். பீ. எம். பைரூஸ்.
பிரதான நூலகர்,
தொகைமதிப்பு புள்ளிவிபரவியல் திணைக்களம்.

## அறிமுகம் :

இலங்கையின் நூலகப் பாரம்பரியம் மிகத் தொன்மைமிக்கதொன்றாகும். பௌத்த சமய இலக்கியத்தின் வளர்ச்சியோடு கி.மு மூன்றாம் நூற்றாண்டளவில் பல பௌத்தாலய நூலகங்கள் தோன்றலாயின. இந் நூலகங்கள் "பொத்குல்" என அழைக்கப்பட்டன. இவ்வாறான நூலகங்களில் பௌத்த சமயக் கிரந்தங்கள் ஓலைச் சுவடிகளில் எழுத்தில் வடிக்கப்பட்டு, அவற்றின் பிரதிகள் "பொத்குல்" எனும் நூலகங்களில் வைப்பில் இடப்பட்டன. இவற்றின் பாதுகாவலர்களாக பௌத்தாலய பிரதான பிக்குமார்கள் பணிபுரிந்து வந்தனர் என வரலாறு கூறுகிறது.

ஆரியச் சக்கரவர்த்தி பரம்பரையினர் பதின்மூன்றாம் நூற்றாண்டில், வட இலங்கையில் சமஸ்கிருத புராணங்களையும், ஏனைய சமயக் கிரந்தங்களையும் சேகரித்து "சரஸ்வதி மகாலயம்" என்றழைக்கபட்ட நூலகத்தில் பேணிப் பாதுகாத்து வந்தனர். இலங்கையில் நூலக சேவைகளின் வளர்ச்சிக்கும் பரவலுக்கும் ஏதுவானதோர் அடித்தளம் ஆரம்பம் முதலே இருந்து வந்துள்ளதை நாம் அவதானிக்க வேண்டும். பெருமைப்படத்தக்கதோர் அறிவுப் பாரம்பரியம் எமது நாட்டிற்குண்டு. குறிப்பாக பௌத்த மடாலயங்களிலும், கோயில்களிலும், பள்ளிவாசல்களிலும் அறிவேடுகள் மிகுந்த கவனத்தோடு பேணப்பட்டும், பாதுகாக்கப்பட்டும், பயிலப்பட்டும் வந்துள்ளமையை வரலாற்று ரீதியாகக் காணக்கூடியதாக உள்ளது.

உலகில் 1734 ஆம் ஆண்டில் அச்சியந்திரத்தின் தோற்றத்தோடு அச்சிடுவதற்கான காகிதமும் அறிமுகமாகியது. இக்காலகட்டத்திலேயே நவீன இலக்கியமும், நூலகங்களின் வளர்ச்சியும் முதன்முதலாக அறிமுகமாகியதெனலாம். பத்தொன்பதாம் நூற்றாண்டில் இலங்கை வந்த கிறிஸ்தவ மதப் பிரசாரகர்கள் தமது சொந்த அச்சியந்திரங்களை சமயப் பிரசாரங்களுக்காக நிறுவினார்கள். இதனைத் தொடர்ந்து பெருந்தொகையான நூல்கள் வெளிவந்ததோடு, நூலக வளர்ச்சியும் ஏற்பட்டது. குறிப்பாக இலங்கையைப் பொறுத்த வரையில் 1845ல் றோயல் ஏசியடிக் சொசைடி நூலகம், அரசாங்க கீழைத்தேய நூலகம் (1870), தேசிய நூதனசாலை நூலகம் (1877), வித்தியாலங்கார பிரிவெனா நூலகம் (1875) ஆகியன ஈண்டு குறிப்பிடத்தக்கனவாகும்.

## தேசிய நூலக சேவைகள் சபை

இலங்கையில் நூலக வளர்ச்சிக்கு உந்துகோலாக அமைந்தது சுயாட்சியின் உதயத்தோடு ஏற்பட்ட கலாசார மறுமலர்ச்சியாகும். இந்நிலைக்கான சமூக, அரசியல் மாற்றங்கள் பொதுமக்களிடையே நாட்டின் வளங்கள் பற்றிய விழிப்புணர்ச்சியையும், அவற்றில் பங்கேற்கும் ஆர்வத்தையும் தோற்றுவித்தது. இலங்கையில் 1967 ஆம் ஆண்டில் நடைபெற்ற யுனெஸ்கோ மாநாட்டின் வழியாகத் தோன்றியதுதான் இலங்கைத் தேசிய நூலக சேவைகள் சபை. இதற்கான சட்டம் பாராளுமன்றத்தில் 1970 ஆம் ஆண்டில் 17 ஆம் இலக்க சட்டமாக நிறைவேறியது. இதனடிப்படையில் 1970 ஆம் ஆண்டு மே மாதம் தேசிய நூலக சேவைகள் சபை ஆரம்பிக்கப்பட்டது. தேசிய நூலக சேவைகள் சபை 1998 ஆம் ஆண்டின் 51 ஆம் இலக்கச் சட்டத்தின் மூலம், தேசிய நூலக மற்றும் ஆவணவாக்கல் சேவைகள் சபையாக பெயர் மாற்றம் செய்யப்பட்டுள்ளமை குறிப்பிடத்தக்கது.

## தேசிய நூலக சேவைகள் சபையை உருவாக்கியதன் நோக்கங்கள்:

1) இலங்கையில் ஒரு தேசிய நூலகத்தை உருவாக்குவது.

2) இலங்கை சம்பந்தப்பட்டதும், இலங்கை மக்கள் சம்பந்தப்பட்டதுமான பல தரப்பட்ட சாதனங்களையும் சேகரித்து,

ஒழுங்குபடுத்திப் பாதுகாத்துப் பராமரித்தல்.

3) நாட்டின் பிரதான உசாத்துணை நூலக மாகவும், ஆராய்ச்சி நூலகமாகவும் தொழிற்படுதல்.

4) இலங்கைத் தேசிய நூற்பட்டியலைத் தயாரித்தல்.

5) தேசிய ரீதியிலும், சர்வதேச ரீதியிலும் நூலகங்களுக்கிடையே நூல் இரவல் வழங்கும் திட்டத்திற்கான மத்திய நூலகமாகத் தொழிற்படுதல்.

6) நூல் பரிமாற்றத் திட்டங்களையும், சர்வ தேச வலையமைப்பிலான செயற்திட்டங் களுக்குமான மத்திய நிலையமாக விளங்குதல்.

7) நாட்டின் பாடசாலை, பொதுசன, திணைக்கள,பல்கலைக்கழக, ஆராய்ச்சி ஆகிய சகல நூலகங்களினதும், முன்னேற்றத்திற்கானதுமான உதவிக ளையும், ஒத்துழைப்பையும் வழங்குதல்.

8) நூலகக் கல்வியையும் பயிற்சியையும் வழங்குதல்.

9) நூலகக் கூட்டுறவு நடவடிக்கைகளை ஒருமுகப்படுத்தும் மத்திய நிலையமாகச் செயற்படுதல்.

10) அரசாங்கத்திற்குத் தேவையான ஆலோ சனைகளையும், சேவைகளையும் வழங்குதல்.

## தேசிய நூலகத்தின் அவசியம் :

பொதுவாக உலகில் ஏற்பட்டு வரும் துரித மாற்றத்திற்கு ஏற்ப அறிவுத்துறையும், அதனைத் தேடுகின்ற முறையும் விரிவடைந்து செல்ல வேண்டியது அவசியமாகும். இந் நிலை மையை அனுசரித்தும், கல்வித் தேட்டமென்பது ஒருவரின் சீவிய காலம் முழுவதையும் அவாவி நிற்பதொன்று என்பதையும் உணர்ந்து, நவீன உலகின் சவால்களுக்கு ஏற்ப, அறிவு நிலையில் ஈடுகொடுக்கத்தக்கதாக, நமது நூலகங்களை நெறிப்படுத்தவேண்டிய பொறுப்பு கல்வி உலகுக்கு உண்டு என்பதை நாம் மறுக்க முடியாது. எனவே இலங்கையில் பல்துறை சார்ந்த அறிவினை மேம்படுத்தும் அரிய ஊடகமாக விளங்குவன நூலகங்கள் என்பது தற்போது உணரப்பட்டுள்ளது. இவ்வகையில் ஒரு நாட்டின் அபிவிருத்தி நடவடிக்கைகளுக்கு நூலகங்களின் பங்களிப்பு பற்றி, சர்வதேச நூலக சங்கங்கள் சம்மேளனம் (ஐகுடுயு) வெளியிட் டுள்ள அறிக்கையொன்றில் காணப்படும் கருத்தினை இங்கு குறிப்பிடுவது மிகப் பொருத்தமானதாகும்.

"உலக நாடுகளின் அபிவிருத்திற்கு நூலக தகவல் சேவைகள் மிகவும் முக்கிய மாகும். தொழில்நுட்ப, பொருளாதார முன்னேற் றத்திற்கு விஞ்ஞான ரீதியான தகவலின் இன்றிய மையாத் தன்மை பெருங்காலமாக உணரப் பட்டு வருகின்றது. உண்மையில் தகவல் மிகவும் விலை மதிப்புள்ளதொரு மூலகமாகத் திகழ் கிறது. அதனை நன்கு கையாண்டு உபயோகப் படுத்தும் ஆற்றலிலேயே தற்கால நாடுகளின் தலைவிதி தங்கியுள்ளது. இந்த ஆற்றலை விரைவில் ஏற்படுத்திக் கொள்ளாத நாடுகள், கலாச்சார, விஞ்ஞான, பொருளாதாரத் துறை களில் மேலும் பின்னடைந்து விடுவது மாத்திர மன்றி அவற்றின் முன்னேற்றம் பிற நாடுகளின் மீது தங்கியிருக்கவேண்டிய அவல நிலைக்கும் ஆளாக நேரிடும்."

எனவே ஒரு நாட்டின் எழுதப்பட்ட, அச்சிடப்பட்ட, கட்புல- செவிப்புல சாதனங்களை ஒருங்குதிரட்டி, அந்நாட்டு மக்களுக்கும், அவர்தம் சந்ததியினருக்கும் பயன்படும் வகையில் பேணிப்பாதுகாக்கும் ஒரு நிறுவன மாக தேசிய நூலகத்தைக் குறிப்பிடலாம். பெரும்பாலான வளர்முக நாடுகள் சுதந்திர மடைந்த பின் தமது பின் தங்கிய நிலையி லிருந்து விடுபட்டுச் சமூக, கலாசார, பொருளா தார முன்னேற்றங் காண முற்பட்டுள்ளன. இவ்வகையிலான முயற்சிகளுக்கு நூலக ஆவண சேவைகளின் முக்கியத்துவம் நாம் கூறாமலே விளங்கும். எனினும் ஒரு நாட்டின் அபிவிருத்திக்கான திட்டங்களை உருவாக்கி, அவற்றைப் பயன்மிக்க வகையில் நிறைவேற்று வதற்கு நூலக சேவைகளின் இன்றியமையாத் தன்மை இன்னமும் போதுமான அளவு வளர் முக நாடுகளால் உணரப்படவில்லையென்பது மறுக்க முடியாத உண்மையாகும். எனவே தான், துரிதமான அபிவிருத்தியில் நாட்டங் கொண்டுள்ள எமது நாட்டில் அனைத்துத் துறைகளிலும் வளர்ச்சிக்கான சாதனமான

நூலக சேவைகளில் கூடுதலான கவனஞ் செலுத்தப்படவேண்டியது அத்தியாவசியமாகின்றது. இந்த முயற்சியில்தான் எமது தேசிய நூலகம் தலைமைதாங்கி வழிகாட்டக்கூடியதாயிருக்கும்.

## இலங்கைத் தேசிய நூலகம்

தேசிய நூலக சேவைகள் சபையின் பணிகளில் மிக முக்கியமானது, தேசிய நூலகத்தை நிறுவிப் பராமரிப்பதாகும். இவ்வகையில் 1990 ஆம் ஆண்டு பெப்ரவரி மாதம் 27ஆம் திகதி தேசிய நூலகம் மேதகு ஜனாதிபதி ஆர். பிரேமதாச அவர்களால் அங்குரார்ப்பணம் செய்து வைக்கப்பட்டது.

எமது தேசிய நூலகத்தின் பணிகள் எவ்வாறு நெறிப்படுத்தப்பட வேண்டும் என்பது பற்றி, பேராதனைப் பல்கலைக்கழக முன்னை நாள் நூலகர் காலஞ்சென்ற திரு. இயன் குணத்திலக்க அவர்கள் கூறியவற்றுடன், அதனது தற்போதைய நிலைமையையும், அதனது வளர்ச்சியையும் இங்கு நோக்குவோம்.

- கல்வித் துறையிலும், ஆராய்ச்சித் துறையிலும் பயன்படக்கூடியனவாகிய இலங்கையின் வரலாறு, நாகரிகம் பற்றிய தேசிய அறிவேடுகளோடு, வெளிநாடுகளில் எழுதப்பட்ட அல்லது அச்சிடப்பட்ட அத்தகைய நூல்களையும், கையெழுத்துப் பிரதிகளையும் சேகரித்து, பாதுகாத்து, ஒழுங்குபடுத்தி உபயோகிப்பதற்கு உதவுவது.

மேலே கூறப்பட்ட இப்பணியை செவ்வனே நிறைவேற்றும் வகையில் தேசிய நூலக சேவைகள் சபை ஆரம்பிக்கப்பட்ட நாள் முதலாக, பல இலட்சக்கணக்கான ரூபா பெறுமதியான நிதியினை ஒதுக்கி, நூற் சேகரிப்பை மேற்கொண்டு வருவதுடன் கையெழுத்துப் பிரதிகளையும், பிற சாதனங்களையும் பெற்றுக் கொள்வதற்கு நடவடிக்கை எடுத்துள்ளமையை அவதானிக்கலாம். இதன் காரணமாக தேசிய நூலகத்தின் நூற் சேகரிப்பு சேமிப்பு மிகச் சிறந்த சேகரிப்பாகத் திகழ்ந்து வருவதனைக் காணலாம். அத்துடன் நன்கு ஒழுங்கமைக்கப்பட்டு உடனடியாகத் தகவல்களை பெறத்தக்கவாறும், ஆவணங்களை உசாவப்படக்கூடியவாறும் அமைந்துள்ளமை சிறப்பானது.

தேசிய அறிவேடுகளைச் சேகரித்துப் பாதுகாப்பதோடு தேசிய நூலகங்கள் தம் நாட்டு மக்களின் வாழ்வையும், சுபீட்சத்தையும் வளப்படுத்தக்கூடிய ஏனைய நாட்டவரின் பல் துறைப்பட்ட அறிவாக்கங்களையும் சேகரித்துக் கொள்ளவேண்டிய கடப்பாடுடையனவாகவுள்ளன. எனினும், பிறநாட்டு அறிவேடுகளைச் சேகரிப்பதென்பது எந்தளவுக்குச் சாத்தியமென்பது கேள்விற்குரியதொன்றாகும். இது பற்றி 1958ஆம் ஆண்டில் வியன்னாவில் நடைபெற்ற ஐரோப்பிய தேசிய நூலகங்கள் பற்றிய கருத்தரங்கில் பின்வரும் ஆலோசனை தெரிவிக்கப்பட்டது.

“ஒரு நாட்டினோடு நேரடியான தொடர்பற்ற வெளியீடுகளைப் பொறுத்தமட்டில் சாத்தியமான ஒரே வழி நூலகங்களின் நூலீட்டலை தேசிய மட்டத்தில் ஒருமுகப்படுத்தலேயாகும். தேசிய நூலகங்களும் இம் முறையையே விரும்புகின்றன.” நடைமுறையில் அவசியமான இந்த ஒருமுகப்பாட்டின். மூலம் பாவனையாளர்கள் பயனடைவதோடு தேசிய நூலகங்களின் நூற்றொகையும் வளம்பெறும். மேலும் ஏனைய நூலகங்களின் வளர்ச்சியையும் ஊக்குவிப்பதாகும். இருந்த போதிலும் ஒரு தேசிய நூலகம் தனது நாட்டிற்குத் தேவையான பிறநாட்டு அறிவேடுகளைச் சேகரிக்க வேண்டிய பொறுப்பினை ஏற்கவேண்டுமென்ற கருத்து வற்புறுத்திக் கூறப்பட்டது.

இந்த வகையிலும் கூட தேசிய நூலகங்களுக்கிடையிலான ஒத்துழைப்பு மிகவும் பெறுமதி வாய்ந்ததென்று கூறப்பட்டது. தேசிய நூலகத்தின் சர்வதேச மட்டத்திலான நூல் பரிமாற்றத்தையே இக்கூற்று வலியுறுத்துகின்றது.

இச் சேகரிப்புகளுக்குப் புறம்பாக தேசிய உசாத்துணைச் சாதனங்களாக பின்வரும் சேகரிப்புகளும் தேசிய நூலகத்தில் முக்கிய இடத்தை வகிக்கின்றன.

- பேராசிரியர் டிக்கிரி அபேசிங்க சேகரிப்பு.
- பேராசிரியர் டி. ஈ. ஹெட்டி ஆராய்ச்சி சேகரிப்பு
- கலாநிதி பீட்டர் சில்வா சேகரிப்பு
- கலாநிதி ஈ. எம். விஜேராம சேகரிப்பு
- தேஜா குணவர்த்தன சேகரிப்பு

இவற்றிற்குப் புறம்பாக அரசாங்க வெளியீடுகள், ஓலைச் சுவடிகள், கட்புல-செவிப் புல சாதனங்கள், தேசப்படங்கள், நூலக தகவல் விஞ்ஞான சேகரிப்புகள் என்பனவும் முக்கிய மான சேகரிப்புகளாகக் காணப்படுகின்றன. இலங்கை தேசிய நூலகமானது இலங்கை யரால் எழுதப்பட்ட நூல்களையும் இலங்கை யைப் பற்றிய நூல்களையும் சேகரித்து, ஆராய்ச்சியாளர்களுக்கு அவர்களது தேவைக் கேற்ப வழங்கும் ஒரு மத்திய நிலையமாக திகழ்கின்றதாயினும், கணிசமான அளவு பிறநாட்டு அறிவேடுகளையும் சேகரித்துத் தனது வாசகர்களுக்கு உதவுகின்றது. இப் பிறநாட்டு நூற் சேர்க்கையானது, இலங்கையைப் பற்றிப் பிற நாட்டவராலும் மற்றும் இலங்கையராலும் எழுதப்படும் பிறநாடுகளில் பிரசுரிக்கப்பட்ட நூல்கள் மாத்திரமல்ல, தனது வாசகர்களுக்குத் தேவைப்படும் ஏனைய பல்வேறு துறைகளைச் சார்ந்த நூல்களையும் சஞ்சிகைகளையும் ஏனைய நூல் தவிர்ந்த சாதனங்களையும் அடக்கியதாகவிருக்கும்.

- அரச நிறுவனங்கள், பொது நிறுவனங்கள் ஆகியவற்றுக்கும் ஏனைய அமைப்புகளுக் கும் தேசிய உசாத்துணை நூலகமாகப் பணியாற்றுதல். இச் சேவையின் பிரதான நோக்கம் இறுதி நிலையில் நாடி வருவோருக்கு பூரணத்துவம் வாய்ந்ததோர் உசாத்துணை நூலகமாக செயற்படுவது.

தேசிய உசாத்துணை நூலகமாக பல் வேறுபட்ட மட்டங்களில் இலங்கை தேசிய நூலகமானது இயங்கி வருகின்றமை குறிப்பிடத் தக்கது. குறிப்பாக 1976 ஆம் ஆண்டிலிருந்து 300 தலைப்புகளுக்கு மேற்பட்ட சிங்கள, தமிழ், ஆங்கில செய்திப் பத்திரிகைகளையும், சட்ட வைப்பாகப் பெறப்படும் அனைத்து வெளியீடு களையும் 'இலங்கைச் சேகரிப்பு' என்ற பகுதியில் தனியாக இலங்கையில் வெளியிடப் பட்டதும், வெளிநாடுகளில் வெளியிடப்பட்டது மான, இலங்கை பற்றிய நூல்களையும், ஆவணங்களையும் ஒருங்கு திரட்டி பூரணத்து வம் வாய்ந்த உசாத்துணை நூலகமாகத் திகழ்கின்றது. இலங்கையினதும், பிறநாடுகளின தும் 500க்கு மேற்பட்ட தலைப்புகளைக் கொண்ட பருவவெளியீடுகளும், இச் சேகரிப்பில் இடம்பிடித்து அண்மித்த தகவல்களை பெறத்தக்கதாக உள்ளமை சிறப்பாக நோக்கப் பட வேண்டியதாகும். இதன் காரணமாக அரச திணைக்களங்களுக்கும், பொதுவான அமைப்புகளுக்கும், தனியார் நிறுவனங்களுக் கும் தேசிய உசாவு நூலகமாக இது செயற்படு கின்றது. அத்துடன் தனிநபர், பல்கலைக்கழக மாணவர், ஆசிரியர் சமூகம், ஆராய்ச்சியாளர் கள், வெளிநாட்டு ஆராய்ச்சியாளர்கள், மாண வர்கள் ஆகியோருக்கு அங்கசம்பூர்ணமான உசாத்துணை நூலகமாகச் சிறந்த முறையில் செயற்பட்டு வருகின்றது.

- நாட்டின் அனைத்து நூலகங்களுக்கும் தலையாய நூலகமாகவும், நூல் இரவல் வழங்கும் நூலகமாகவும், பிரதியாக்க சேவைகளை மேற்கொள் ளத்தக்கதாகவும் தேசிய நூலகம் அமைய வேண்டும்.

இலங்கைத் தேசிய நூலகமானது இலங்கையிலுள்ள பொது நூலகங்கள், பல்கலைக்கழக நூலகங்கள், திணைக்கள நூலகங்கள், விசேட நூலகங்கள் என்பனவற் றிற்கு உதவியளித்து, ஆலோசனைகளையும் வழங்கி அவற்றின் வளர்ச்சியில் பங்குகொண்டு அபிவிருத்தி செய்கின்றது. குறிப்பாக ஒவ்வொரு மாவட்டத்தின் பிரதான பொதுசன நூல் நிலையங்களை அபிவிருத்தி செய்வதில் உதவி புரிந்தது, வாசகர்களுக்கு சரியான சேவையை வழங்கி ஊக்குவிக்கிறது. இதனடிப்படையில் தேசிய நூலகத்தால் மேற்கொள்ளப்படுகின்ற 'தேசிய ஒருங்கிணைந்த பட்டியலுக்கு' அந் நூலகத்தின் சேகரிப்புப் பற்றிய தரவுகள் பெற்றுக்கொள்ளப்படுகின்றன. இலங்கையில் பொதுசன நூலகங்கள் மற்றும் பாடசாலை நூலகங்களின் சேவைகளை ஒழுங்குபடுத்த நடவடிக்கை எடுக்கப்பட்டுள்ளமையும் குறிப்பிடத் தக்கது. மேலும் இலங்கையின் பிரதான நூலகங் களுக்கு, தேசிய நூலகத்தின் சேகரிப்பிலிருந்து தேவையான நூல்களையும், ஆவணங்களையும் இரவலாகப் பெற்றுக்கொள்வதற்கும் நடவடிக்கை எடுக்கப்பட்டுள்ளமையும் ஈண்டு குறிப்பிடத் தக்கது. எனவே, பல்வகையான நூலகங்களின் வளர்ச்சிக்கும், செயற்பாட்டிற்கும் உதவிகளை யும், ஒத்தாசைகளையும் வழங்கி ஊக்குவிப் பதால் நாட்டின் அனைத்து நூலகங்களுக்கும் தலையாய நூலகமாகத் தேசிய நூலகமானது செயற்படுகின்றது என்பதை மறுப்பதற்கில்லை.

"ஒரு தேசிய நூலகத்தின் முக்கியத்துவம் என்னவெனில், அந்நூலகம் எவ்வித சந்தேகத்துக்கிடமுமின்றி நாட்டிலுள்ள ஏனைய நூலகங்களுக்கெல்லாம் தலையாய

நூலகமாகத் திகழ்வதுதான். மேலும் தேசிய நூலகத்தின் உயர்தரமான நிலைமைக்குக் காரணம், அதனது அறிவேடுகளின் பரப்பும், பன்முக உள்ளடக்கமுமேயாகும். எனவே தேசிய நூலகத்துடன் இணைவதன் மூலம் ஏனைய நூலகங்களும் அதிகப்படியான நன்மைகளைப் பெற்று பயனடைவதை நிச்சயப்படுத்தலாம்.

## நூலக சேவைகளைக் கணனிமயப் படுத்தல்

தேசிய நூலகமானது அதனது சேகரிப்புகள் அனைத்தையும் கணனிமயப்படுத் தியுள்ளது. இதற்காக *Alice for Windows* எனும் நூலக மென்பொருளை உபயோகப்படுத்தி யுள்ளது. இதன் காரணமாக தேசிய நூலகத்தின் அனைத்துச் சேவைப் பிரிவுகளும் *LAN* வலையமைப்பு மூலமாக ஒருமுகப்படுத்தப் பட்டுள்ளது. அண்மைக் காலமாக தேசிய நூலகத்தின் ஒவ்வொரு சேகரிப்புகளும், படிப் படியாக கணனிமயப்படுத்தப்பட்டு வாசகருக்கு இலகுவாக தகவலை மீட்டெடுக்க ஆவன செய்யப்படுகின்றது. குறிப்பாக தேசிய நூலகத்தில் அடிக்கடி புதுப்பிக்கப்படுவதற்கான தேவைகளுடன் இணையத் தளமும் வடிவமைக்கப்பட்டுள்ளது. இணையத்தளத்தின் முகவரி : *http://www.slt.lk/nlib* ஆகும். வாசகர்களுக்கு இணையத்தளத்தை உபயோகிப்பதற்கும், சிடி-ரொம் (CD-Rom) களை பரிசீலிப்பதற்கும், கணினிமயப்படுத்தப் பட்ட பட்டியலை உபயோகிப்பதற்கும் இடவசதியளிக்கப்படுகிறது. தேசிய நூலகத்தின் சேகரிப்புகளை அறிந்துகொள்ள கணனி மயப்படுத்தல் நடவடிக்கை பாரியளவில் உதவி வருகிறது என்பதை மறுப்பதற்கில்லை.

- பிரதான இச் சேவைகளுக்குப் புறம்பாக, இலங்கைத் தேசிய நூலகம் ஆற்ற வேண்டிய ஏனைய பணிகளையும் திரு. இயன் குணத்திலக்க அவர்கள் விளக் கியுள்ளார். அவற்றில் முக்கியமானதும், தற்போது நடைமுறையில் காணப்படும் முன்னேற்றங்கள் பற்றியும் நோக்கு வோம்.

## தேசிய நூற்பட்டியலாக்கக் கட்டுப்பாடு

நடைமுறையில் உள்ள அறிவேடுகளின் விபரங்களையும், சுட்டிகளையும் தயாரித்து வழங்கி வாசகருக்கு உதவுதல். இந்த வகையில் தேசிய நூலகமானது குறிப்பிட்டதொரு காலாண்டு காலத்தில் நூலகச் சேகரிப்பில் சேர்த்துக் கொள்ளப்பட்ட அல்லது கொள்வனவு செய்யப்பட்ட அனைத்து நூல்களையும் விடய வாரியாக ஒழுங்கமைத்து வழங்குகின்றது. இவ்விபரவேடு இலங்கையின் பிரதான நூலகங் களுக்கெல்லாம் அனுப்பிவைக்கப்படுகின்றது. அத்துடன் பருவ வெளியீடுகளில் காணப்படும் கட்டுரைகளுக்கும் சுட்டி தயாரிக்கப்பட்டு வழங்கப்படுகின்றது. இப் பணி தேசிய நூதனசாலைகள் நூலகத்தினால் ஆரம்பத்தில் மேற்கொள்ளப்பட்டாலும், 1976ஆம் ஆண்டு காலப்பகுதியில் அச் செயற்பாடு தொடராத காரணத்தினால், தேசிய நூலகம் இக்கடமை யினையும் நேர்த்தியாக மேற் கொள்கின்றது. இதன் காரணமாக ஆராய்ச்சியில் ஈடுபட்டுள்ள வர்களுக்கு உரிய விபரத்துடன், ஆவணத்தை யும் பரிசீலிக்க முடிகிறது. நாட்டில் குறிப்பிட்ட காலப்பகுதியில் வெளியிடப்படும் அனைத்து ஆவணங்களின் விபரங்களை பட்டியலிட்டு வாசகருக்கு அறிவுறுத்தும் இச் செயற்பாட்டினை தேசிய நூல்பட்டியலாக்கக் கட்டுப்பாடு என அழைப்பர்.

## இலங்கை தேசிய நூற்பட்டியல்

இவ்வகையில் மாதந்தோறும் இலங்கைத் தேசிய நூலகத்தினால், சிங்களம், தமிழ், ஆங்கிலம் ஆகிய மும் மொழிகளில் வெளியிடப்படும் இலங்கைத் தேசிய நூற் பட்டியல், இலங்கையில் வெளியிடப்படும் புதிய நூல்கள், பருவ வெளியீடுகள், புதினத்தாள்கள் தொடர்பான தகவல்களைக் கொண்டுள்ளது. இது பிற நாடுகளில் வெளியிடப்படுகின்ற இலங்கை பற்றிய சில நூல்களின் விபரங்களை யும் உள்ளடக்குகின்றது. தற்போது ஆசிய நாடுகளில் வெளிவருகின்ற தரமான சிறந்த தேசிய நூற்பட்டியல்களுள் முதன்மைவாய்ந் ததாக இப்பட்டியல் கருதப்படுவதுடன், இதில் வாசகர் தேவையான தகவல்களை இலகுவாகக் கண்டுபிடிப்பதற்காக ஆசிரியர் மற்றும் நூற் தலைப்பின் கீழும், பொருளின் கீழும் சுட்டிகள் தரப்பட்டு இலகுபடுத்தப்பட்டுள்ளன.

ஆராய்ச்சியாளர்களதும், பொதுவான வாசகர்களதும் பயனுக்காக, நாட்டில் உருவாக்கப்படும் பல்வேறு வகையான வெளியீடுகளில் உள்ள தகவல்களை ஒழுங்குபடுத்தப்பட்ட முறையில் சமர்ப்பிக்கும் ஒரு செயற்பாடு என இதனை விபரிக்கலாம். நூல்கள், பருவ வெளியீடுகள், புதினத்தாள்கள், அரசாங்க வெளியீடுகள், மாநாட்டு அறிக்கைகள், கட்புல-செவிப்புல சாதனங்களை கணனி மயப்படுத்தப்பட்ட நிகழ்ச்சித் திட்டங்கள் போன்ற பல்வேறு தகவல் தொடர்பு ஊடகங்களினூடாக வெளியிட்டும், நாட்டின் புத்திஜீவிகளின் சிருஷ்டிப்புகளில் நூற்பட்டியலாக்கக் கட்டுப்பாட்டை செயற்படுத்துவது, தேசிய நூலகத்தினதும், நூலக தகவல்துறை நிபுணர்களினதும், நிறுவனங்களினதும் தலையாய கடமைகளில் ஒன்றாக உள்ளது. பொதுவாக தேசிய நூலகமானது தமது சேகரிப்பின் நூற்பட்டியலாக்கக் கட்டுப்பாட்டினை திறம்பட நடைமுறைப்படுத்துகின்றதென உறுதியாகக் கூறலாம்.

இலங்கையின் தேசிய நூலகமானது தனது பணிகள் தொடர்பாக சேவையாற்றுவதில் இதற்கு நிகராக வேறு நிறுவனங்கள் இல்லை எனலாம். ஏனெனில் இது மிகப்பாரிய அளவிலான சேவைகளையாற்றிவருகின்றது. மேலும் இதன் பணிகள் ஆதிகாலந்தொட்டு பேணிப் பாதுகாக்கப்பட்டு வரப்படும் பிரதான நீர்த் தேக்கங்களுடன் ஒப்பிடப்படுகின்றது. ஏனெனில் பிரதான நீர்த்தேக்கங்கள் வயல் நிலங்களுக்கு நேரடியாக நீர் வழங்குவதோடு, ஏனைய சிறு நீர்த்தேக்கங்களுக்கும் நீரை வழங்குகின்றது. அவ்வாறே தேசிய நூலகம் தனது சேவைகளை வாசகர்களுக்கு நேரடியாகவும், ஏனைய நூலகங்களினூடாகவும் வழங்கி வருகின்றது.

எனவே இதுகாறும் நாம் நோக்கியவற்றிலிருந்து எமது தேசிய நூலகத்தின் பாரிய பொறுப்புக்களில் முக்கிய இலக்குக்களை அது அடைந்துள்ளது என்பது மறுக்க முடியாத உண்மையாகும். இந்த இலக்குக்களைப் பற்றி நாம் சிந்திக்கும்போது இந் நூலகத்தின் சேவையினால் பயன்பெறும் மக்களைப் பற்றியும் சில முக்கியமான விடயங்களை நாம் மனதில் கொள்ள வேண்டும். ஒன்றிற்கு மேற்பட்ட சமயம், மொழி, கலாசாரம் ஆகியவற்றைக் கொண்ட எமது நாட்டில், இந்த வேற்றுமைகளும் ஒற்றுமை காணவேண்டியது எம்மனைவரதும் முன்னேற்றத்திற்கும், நாட்டின் சுபீட்சத்திற்கும் இன்றியமையாததாகும். இந்த இலட்சியத்தை அடைவதில் எமது தேசிய நூலகத்திற்கு முக்கியமானதொரு பங்கு உண்டென்பதை நாம் வலியுறுத்திக் கூறவேண்டியுள்ளது.

மேலும் 1998 ஆம் ஆண்டின் 51 ஆம் சட்டத்தின் மூலம் "தேசிய நூலகம் மற்றும் ஆவணவாக்கல் சேவைகள் சபையாக" பெயர் மாற்றம் செய்யப்பட்டு முன்னரைவிட அதிகளவு அதிகாரங்கள் வழங்கப்பட்டுள்ளமை பாராட்டத்தக்கது. இதன் காரணமாக தேசிய நூலகத்திற்கான பல்வேறு நடவடிக்கைகளை அண்மைக் காலமாக, இச்சபை சிறப்புற ஆக்கபூர்வமாக நிறைவு செய்து, தேசிய நூலகத்தின் பணியினை மேற்கொண்டு விரிவாக்கி வருவதனைக் காணலாம். எனினும் தேசிய நூலகம் அதற்கே உரித்தான பல்வேறு தகவல் சேவைகளைப் புரிவதில் முன்னணி வகிப்பதாலும், அனைத்து நூலகங்களுக்கும் தலையாய நூலகமாகத் திகழ்வதாலும், "*தேசிய நூலக மற்றும் தகவல் சேவைகள் சபை*" யாக பெயர் மாற்றம் பெறுவது மிக அவசியமானது. எனது தனிப்பட்ட கருத்தாக இது இருப்பினும், இது பற்றி சிந்திப்பது காலத்தின் தேவையாக உள்ளது.

## References :


1. **Banerjee, D.N** The National Library of India : Its glorious pass and its bright Future.- **Library News** 21(1) : 2000 p.84 – 87

2. Ranasinghe, Piyadasa Sri Lanka National Bibliography and the bibliographical traditional of Sri Lanka : a short history.- **Library News** 21(01) : 2000, p. 08-26


3. **De Silva, K. M. A.** History's of Sri Lanka. – Delhi : Oxford University press,- 1981. p. 29.

4. **Amarasiri, M. S. U** The first Decade of the National Library of Sri Lanka.-. **Library News** 21(01) : 2000, p. i-iv

# ජාතික පුස්තකාල පුවත්

## පුහුණු පාඨමාලා

දිවයිනේ පිහිටි විවිධ පුස්තකාලවල කාර්ය මණ්ඩල පුහුණු කිරීම සඳහා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මගින් පසුගිය මාස කිහිපය පුරා පාඨමාලාවන් පවත්වන ලදී.



ඒ අනුව, උතුරු නැගෙනහිර පළාතේ මහජන පුස්තකාලයාධිපතිවරු පුහුණු කිරීම 2002.10.18 සිට 21 දක්වා යාපනය මහජන පුස්තකාලයේදීත්, උතුරු මැද පළාතේ පිරිවෙන් පුස්තකාලයාධිපතිවරු පුහුණු කිරීම 2002 ඔක්තෝබර් 30 දා සිට නොවැම්බර් 02 වැනිදා දක්වා අනුරාධපුර ශ්‍රී සාරානන්ද පිරිවෙනේදීත් පැවැත්විණි.


ශ්‍රී ලංකා පුස්තකාල සංගමය මගින් පවත්වන පුස්තකාල හා තොරතුරු විද්‍යා ප්‍රථම පාඨමාලාව හදාරන දෙමළ මාධ්‍ය සිසුන් කාණ්ඩ තුනක් සඳහා ද පුහුණු පාඨමාලා පැවැත්විණි.

පොලිස් දෙපාර්තමේන්තුවේ පුස්තකාලයාධිපතිවරුන සඳහාත්, වයඹ පළාත් පිරිවෙන් පුස්තකාලයාධිපතිවරුන් සඳහාත්, දෙපාර්තමේන්තු හා ආයතන ප්‍රධානීන් සඳහාත්, Asian Aviation Centre (Private) Limited ආයතනයේ නිලධාරීන් දෙදෙනෙකු සඳහාත්, ආයතන වශයෙන් වෙන් වෙන්ව පුහුණු පාඨමාලා පැවැත්විණි.

## වැඩමුළු

✸ බස්නාහිර පළාතේ ප්‍රජා සංවර්ධන නිලධාරීන් පුස්තකාල කටයුතු පිළිබඳව දැනුවත් කිරීමේ වැඩමුළුවක් 2002.10.29 සිට 31 දක්වා ජාතික පුස්තකාල ශ්‍රවණාගාරයේදී පැවැත්විණි. මෙම වැඩමුළුව බස්නාහිර පළාත් පාලන දෙපාර්තමේන්තුව හා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය එක්ව සංවිධානය කරන ලදී.

✸ ජාත්‍යන්තර පාසල් පුස්තකාල දිනය නිමිත්තෙන් ගම්පහ දිස්ත්‍රික් සිංහල මාධ්‍ය පාසල් පුස්තකාලයාධිපතීන් හා බස්නාහිර හා මධ්‍යම පළාත්වල දෙමළ මාධ්‍ය පුස්තකාලයාධිපතීන් සඳහා සංවිධානය කළ එක් දින වැඩමුළුවක් 2002.10.28 දා ජාතික පුස්තකාල ශ්‍රවණාගාරයේ දී පැවැත්විණි. එමෙන්, ගම්පහ අධ්‍යාපන කලාපයේ පාසැල් පුස්තකාලයාධිපතීන් සඳහා සූචිකරණය හා වර්ගීකරණය පිළිබඳ වැඩමුළුවක් 2003.03.27 හා 28 දිනවල දී පැවැත්විණි.




✸ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් පවත්වාගෙන යනු ලබන සංරක්ෂණ මධ්‍යස්ථාන පිහිටුවීමේ ව්‍යාපෘතිය යටතේ පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණය හා පොත් බැඳුම්කරණය පිළිබඳ පුහුණු වැඩමුළුවක් 2002.11.27 දා සිට 29 දා දක්වා ජාතික පුස්තකාල ශ්‍රවණාගාරයේදී පැවැත්විණි. ඊට ආයතන 12 ක් නියෝජනය කරමින් පාඨමාලා ලාභීන් 12 දෙනෙකු සහභාගි වූහ.

✸ පර්යේෂණ නිබන්ධනීකරණය පිළිබඳව විශ්ව විද්‍යාල සිසුන් දැනුවත් කිරීමේ වැඩමුළුවක් 2002.12.11 දා ජාතික පුස්තකාල ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී.

## සම්මන්ත්‍රණ

මහජන පුස්තකාල, පාසැල් පුස්තකාල හා විද්‍යා පීඨ පුස්තකාල නියෝජිතයින් සඳහා පුස්තකාල ස්වයංක්‍රීයකරණය පිළිබඳව සම්මන්ත්‍රණයක් 2002.12.17 දා ජාතික පුස්තකාල ශ්‍රවණාගාරයේ දී පැවැත් වූ අතර එම පුස්තකාල නියෝජිතයින් සඳහා අන්තර්ජාලය හා විද්‍යුත් තැපැල පිළිබඳව දැනුවත් කිරීම පසුදා (18 දා) එහි දී පැවැත්විණි.

## පොත් පරිත්‍යාග

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් 2002 ඔක්තෝබර් සිට 2003 මාර්තු කාලය තුළ රු. 4,79,446.00 ක වටිනාකමින් යුත් පොත් පාසල් පුස්තකාල, මහජන පුස්තකාල, පිරිවෙන් පුස්තකාල හා වෙනත් විශේෂ පුස්තකාල 130 ක් සඳහා පරිත්‍යාග වශයෙන් ලබා දී ඇත.

මීට අතිරේකව ජාත්‍යන්තර පොත් ආධාර වශයෙන් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයට ලැබෙන පොත් 2271 ක් පුස්තකාල 75 කට පරිත්‍යාග කර ඇත.

## පුස්තකාල ශ්‍රේණිගත කිරීම

සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පුස්තකාලය I වන ශ්‍රේණියටත්, ගිරිඋල්ල හා බුත්තල මහජන පුස්තකාල II වන ශ්‍රේණියටත් ශ්‍රේණිගත කරන ලදී.

## ජාතික පුස්තකාල දේශන මාලාව

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් 2002 ඔක්තෝබර් සිට 2003 මාර්තු දක්වා පැවැත්වූ දේශන පිළිබඳ තොරතුරු පහත සඳහන් පරිද වේ.

| දේශක | දේශන මාතෘකා |
|---|---|
| Prof. Russell Bowden | IFLA 2002. Glasgow; A Report |
| පුංචි බණ්ඩා ගල්ලබ මහතා | ළමා පුස්තකාලයාධිපතිත්වය - තායිලන්ත අත්දැකීම් |
| ධනපාල ගුණසේකර මහතා | පරිවර්තන කලාව; මගේ අත්දැකීම් |
| මහාචාර්ය එම්.ඕ.ඒ. ද සොයිසා | පෙඩරල් ආණ්ඩුක්‍රමය පිළිබඳ හැඳින්වීමක් |
| ශාන්ත කේ. හේරත් මහතා | පුවත්පත් කලාව තුළ දේශපාලන කාටූනය |
| මේනකා කුමාරි මිය, නිහාල් පුෂ්පකුමාර මහතා | පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණය පිළිබඳ මැලේසියාවේ දී සහ ඉන්දියාවේ දී අප ලද අත්දැකීම් |

## පොත් ප්‍රදර්ශන

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මගින් පහත සඳහන් පරිදි පොත් ප්‍රදර්ශන පවත්වන ලදී.

මහනුවර මහාමායා බාලිකා මහා විද්‍යාලය (2002.10.18 සිට 21 දක්වා)
අනුරාධපුර මධ්‍ය මහා විද්‍යාලය (2002.10.28 සිට 29 දක්වා)
දෙහිඕවිට ජාතික පාසල (2002.11.26 සිට 28 දක්වා)
බද්දේගම මහජන පුස්තකාලය (2003.03.22 සිට 24 දක්වා)

# වෙනත් පුස්තකාල පුවත්

## පරිගණක පුහුණු පාඨමාලා

උතුරු මැද පළාතේ පළාත් පාලන ආයතන හා විශේෂ පුස්තකාලවල පුස්තකාලයාධිපතිවරු හා පුස්තකාල කාර්ය මණ්ඩල සඳහා පරිගණක පුහුණු පාඨමාලාවක් පසුගියදා 2003.02.26 දින රජරට විශ්ව විද්‍යාලයේ දී පැවැත්විණි. රජරට විශ්ව විද්‍යාලයේ පුස්තකාලයාධිපති හා උතුරු මැද පුස්තකාල සංගමයේ සභාපතිගේ මෙහෙයවීමෙන් පැවැති මෙම පාඨමාලාවේදී පරිගණකය පුස්තකාල සේවාව සඳහා උපයෝගී කර ගත යුත්තේ කෙසේ ද යන්න පිළිබඳව න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුවක් ලබා දීමට කටයුතු කරන ලදී.

## අත්කම් නිර්මාණ ප්‍රදර්ශනය හා අලෙවිහල



මීගමුව මහ නගර සභා මහජන පුස්තකාල පද්ධතියේ සාමාජික සාමාජිකාවන්ගේ අත්කම් නිර්මාණ ඇතුළත් ප්‍රදර්ශනයක් 2002.12.18 හා 19 යන දිනවල මීගමුව නගර ශාලාවේ දී පැවැත්විණි. විශේෂ කුසලතා සහිත නිර්මාණකරුවන්ගේ නිර්මාණ ප්‍රදර්ශනයක් ද සංවිධානය කොට තිබුණි.

## විශ්ව පාසල් පුස්තකාල දින ජාතික උත්සවය

විශ්ව පාසල් පුස්තකාල දිනය සැමරීමේ ජාතික උත්සවය "පොත්ගුලයි - නව ලොවයි" යන තේමාව මුල් කර ගනිමින් 2002.10.28 දා අනුරාධපුර මධ්‍ය මහා විද්‍යාලයේ දී පාසල් අධ්‍යාපන ඇමැති සුරනිමල රාජපක්ෂ, උතුරු මැද පළාත් ප්‍රධාන ඇමැති බර්ටි ප්‍රේමලාල් දිසානායක යන මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

ජාතික පුස්තකාල සතිය ජාතික මට්ටමින් ප්‍රකාශයට පත් කිරීමත්, පුස්තකාලයාධිපතිවරුන් පුහුණු කිරීමේ ජාතික වැඩසටහනක් ආරම්භ කිරීමත් මෙහි දී සිදු කෙරිණි.

## විශ්ව ළමා දිනය

විශ්ව ළමා දිනය නමින්තෙන් හොරණ මහජන පුස්තකාලය සංවිධානය කළ උත්සවයක් 2002.10.04 දින හොරණ නගර ශාලාවේ දී පැවැත්විණි.

## පුස්තකාල විද්‍යා ප්‍රායෝගික පුහුණු පාඨමාලා

පුස්තකාල විද්‍යා ප්‍රායෝගික පුහුණු පාඨමාලාවක් 2002.10.21 දින සිට 2003.03.31 දා දක්වා රුහුණු විශ්ව විද්‍යාලයේදී පැවැත්විණි.

රුහුණු විශ්ව විද්‍යාලයීය පුස්තකාලය සංවිධානය කළ මෙම සම්මන්ත්‍රණ මාලාවේ දී කැලණිය විශ්ව විද්‍යාලයීය පුස්තකාල විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාවෙහි පළමු වසර සිසුන්, ශ්‍රී ලංකා පුස්තකාල සංගමය පුස්තකාල විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාවෙහි පළමු වසර සිසුන්, දක්ෂිණ සංවර්ධන අධිකාරියේ නිලධාරීන්, රාහුල විද්‍යාලයේ හා ශාන්ත තෝමස් කුමරි විදුහල් සිසුන්, මාතර අධ්‍යාපන කලාපයේ ගුරු පුස්තකාලයාධිපතිවරුන් හා නාගල්ල අධ්‍යාපන කලාපයේ ගුරු පුස්තකාලයාධිපතිවරුන් වෙනුවෙන් වෙන් වෙන්ව මෙම පාඨමාලා පැවැත්විණි.

## පිටිපන සිරිසුමන නාහිමි ගුණානුස්මරණ පුස්තකාලය විවෘත කිරීම



පිටිපන සිරිසුමන නාහිමි ගුණානුස්මරණ පුස්තකාලය විවෘත කිරීම 2002.12.22 දා කොළඹ නව නොටමුනේ ප්‍රධාන අධිකරණ සංඝ නායක පූජ්‍ය දිවියගහ යසස්සි හිමියන්ගේ ප්‍රධානත්වයෙන් සිදු කෙරිණි. පූජ්‍ය බුටාවනනේ සරණංකර හිමියන් ප්‍රමුඛ මහා සංඝරත්නය ද මැලේසියානු දානපතියන් පිරිසක් ද දේශපාලන පක්ෂ නියෝජිතයන් කිහිප දෙනෙකු ද මෙම අවස්ථාවට සහභාගි වූහ.

මෙම පුස්තකාලය ශාස්ත්‍රවේදී පල්ලේ කුඹුරේ සෝමරතන හිමියන්ගේ අනුශාසනාව මත විහාරස්ථ කාර්ය සාධක සමිතිය මගින් පවත්වා ගෙන යනු ලබයි.

## වෘත්තියවේදීන් තිදෙනෙකුගේ සමුගැනීම

◆ ඇමරිකානු තොරතුරු සම්පත් මධ්‍යස්ථානයේ හිටපු අධ්‍යක්ෂිකා මනෝරාණි කරුණානායක මහත්මිය 2003 පෙබරවාරි 28 වැනි දා අභාවප්‍රාප්ත වූවාය. 1969 වර්ෂයේ දී පුස්තකාල සහකාරවරියක ලෙස ඇමරිකානු තොරතුරු මධ්‍යස්ථානයෙහි නුවර ශාඛාවට බැඳුණු ඇය, එහි අධ්‍යක්ෂ තනතුර ද හෙබවූවාය.

◆ කුරුණෑගල මහජන පුස්තකාලයේ ප්‍රධාන පුස්තකාලයාධිපතිවරිය වශයෙන් කටයුතු කළ එස්.සෝමබන්දු මහත්මිය 2003 අප්‍රේල් 26 වැනි දා අභාවප්‍රාප්ත වූවාය.

◆ ශ්‍රී ලංකාවේ පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රයේ කීර්තිමත් වෘත්තීය වේදියෙකු වූ ආචාර්ය එච්.ඒ.අයි. ගුණතිලක මහතා 2003.05.21 දින දැයෙන් සමුගත්තේය. ඔහු පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ප්‍රධාන පුස්තකාලයාධිපති ලෙස වසර ගණනාවක් කටයුතු කළේය.

## தேசிய நூலகச் செய்திகள்

### பயிற்சிப் பாடநெறிகள்

தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபையானது இலங்கையில் உள்ள பல்வேறு வகையான நூலகங்களினதும் பயிற்சித் தேவைகளை இனங்கண்டு, நூலகர்கள் உட்பட நூலக ஊழியர்களுக்கு பயிற்சி வழங்குவதில் முன்னின்று செயற்படுகின்றது.

இத் திட்டத்தின் கீழ் :

- வடகிழக்கு மாகாண பொது நூலகர்களைப் பயிற்றுவிப்பதற்கான தமிழ் மொழி மூல பாடநெறி ஒன்று 2002.10.18 ஆம் திகதியில் இருந்து 21 ஆம் திகதி வரை யாழ் பொது நூலகத்தில் நடைபெற்றது. பிரிவேன நூலகர்களின் பொருட்டு இரண்டு பாடநெறிகள் நடத்தப்பட்டன. முதலாவது பாடநெறி வட மத்திய மாகாண பிரிவேன நூலகர்களின் பொருட்டு 2002.10.30 ஆம் திகதியில் இருந்து 2002.11.02 ஆம் திகதி வரை அநுராதபுரம் சிறீ சாரானந்த பிரிவேனா வில் நடத்தப்பட்டது.
- இலங்கை நூலக சங்கத்தினால் நடத்தப்படும் நூலக தகவல் விஞ்ஞான ஆரம்பப் பாட நெறியைப் பின்பற்றும் தமிழ் மொழிமூல மூன்று மாணவர் குழுக்களுக்கு தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபையின் பல்வேறு பிரிவுகளில் பயிற்சி வழங்கப்பட்டது.
- பொலிஸ் திணைக்கள நூலகர்களின் பொருட்டு பயிற்சிப் பாடநெறி ஒன்று 2003.01.27 ஆம் திகதியில் இருந்து 29 ஆம் திகதி வரை சபையின் கேட்போர் கூடத்தில் நடத்தப்பட்டது.

- பங்களாதேசத்திலிருந்து வருகை தந்த அலுவலர்களுக்கு சி.டி. ரொம்களை உபயோகப்படுத்துவது தொடர்பாக ஒரு நாட் பயிற்ச்சிநெறி ஒன்று 2003.03.14 ஆம் திகதி தேசிய நூலகத்தின் கேட்போர் கூடத்தில் நடத்தப்பட்டது.
- Asian Aviation Centre (Pvt) Ltd நிறுவனத்தின் இரு அலுவலர்களின் பொருட்டு 2002.12.16 ஆம் திகதி தொடக்கம் 23 ஆம் திகதி வரை எமது நிறுவனத்தின் பல்வேறு பிரிவுகள் தொடர்பாக செயல் முறையில் பயிற்சி வழங்கப்பட்டது.

## பயிற்சிப் பட்டறைகளும் மாநாடுகளும்

- இலங்கையில் பல்வேறு மாகாணங்களைச் சார்ந்த நூலகர்களை உள்ளடக்கிய அலுவலர் குழுவைப் பயிற்றுவிக்கும் திட்டத்தின் கீழ் மேல் மாகாண பிரஜா அபிவிருத்தி அதிகாரிகளுக்கு நூலகச் செயற்பாடுகள் தொடர்பாக அறிவூட்டும் பொருட்டு இரு நாள் பயிற்சிப் பட்டறை ஒன்று 2002.10.29 மற்றும் 31 ஆம் திகதிகளில் தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபையின் கேட்போர் கூடத்தில் நடத்தப்பட்டது. இப் பயிற்சிப் பட்டறையை மேல்மாகாண மாகாணத் திணைக்களமும் சபையும் இணைந்து ஒழுங்குபடுத்தியிருந்தன.
- சர்வதேச பாடசாலை நூலக தினத்தை முன்னிட்டு கம்பஹ மாவட்டத்தைச் சேர்ந்த சிங்கள மொழிமூலப் பாடசாலை நூலகர்களுக்கும் மற்றும் மேல் மாகாண மத்திய மாகாண தமிழ் மொழி மூலப் பாடசாலை நூலகர்களுக்கும் ஒரு நாள் பயிற்சிப் பட்டறை ஒன்று 2002.10.28 ஆம் திகதி சபையின் கேட்போர் கூடத்தில் நடத்தப்பட்டது. இப் பயிற்சிப் பட்டறையின் பொருட்டு சிங்கள, தமிழ் மொழி மூல பாடசாலை நூலகர்கள் பலர் பங்குபற்றினர்.
- பேணல் மத்திய நிலையங்களை அமைக்கும் செயற்றிட்டத்துடன் தொடர்புடைய நூலக சாதனங்களை பேணுதல் மற்றும் மட்டை கட்டுதல் தொடர்பான பயிற்சிப் பட்டறை ஒன்று 2002.11.27 - 29 ஆம் திகதிகளில் சபையின் கேட்போர் கூடத்தில் நடத்தப்பட்டது. இதில் 12 நிறுவனங்களைச் சேர்ந்த 12 அங்கத்தவர்கள் பங்கு பற்றினர்.

## மாநாடுகள்

நூலகங்களுக்கு கணினி உபயோகத்தை அறிமுகப்படுத்தி அதன் மூலம் ஒழுங்குமுறையிலான துரித சேவையை வழங்கும் நோக்கத்துடன், நூலகங்களை தன்னியக்கமாக்குதல் தொடர்பான மாநாடு ஒன்று 2002.12.17 ஆம் திகதி தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபையின் கேட்போர் கூடத்தில் நடத்தப்பட்டது. இம் மாநாட்டில் பொது நூலகங்கள், பாடசாலை நூலகங்கள், மற்றும் கல்விக் கல்லூரி நூலகங்களின் பிரதிநிதிகளும் பங்குபற்றினர்.

## நூற் கண் காட்சியும் விற்பனைக் கூடமும்

தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபையானது பின்வரும் நூற் கண்காட்சிகளையும் விற்பனைக் கூடங்களையும் ஒழுங்குபடுத்தி இருந்தன.

| திகதி | இடம் |
|---|---|
| 2002.10.18-21 | - கண்டி மஹாமாயா பெண்கள் மகாவித்தியாலயம் |
| 2002.10.28-29 | - அநுராதபுரம் மத்திய மகா வித்தியாலம் |
| 2002.11.26-28 | - தெஹியோவிட்ட தேசிய பாடசாலை |
| 2003.03.20-24 | - பத்தேகம பொது நூலகம் |

## நூலகங்களைத் தர நிர்ணயம் செய்தல்

இலங்கையில் உள்ள பல்வேறு நூலகங்களின் வளங்கள் மற்றும் சேவைகள் தொடர்பில் அவற்றை தர நிர்ணயம் செய்தல் தேசிய நூலகத்தினால் நடைமுறைப்படுத்தப்படுகின்றது. இதன் பிரகாரம் கால்நடை அபிவிருத்தி மற்றும் சுகாதாரத் திணைக்களத்தின் நூலகம் முதலாம் தர நூலகமாகவும், கிரியுள்ள பொது நூலகம் மற்றும் புத்தள பொது நூலகம் என்பன இரண்டாம் தர நூலகமாகவும் தரநிர்ணயம் செய்யப்பட்டுள்ளன.

## நூல் அன்பளிப்பு

தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபையானது 2002 ஒக்ரோபர் தொடக்கம் 2003 மார்ச் மாதம் வரை இலங்கையில் உள்ள 130 பாடசாலை, பொது, பிரிவேன மற்றும் விசேட நூலகங்களுக்கு ரூ. 479446.00 பெறுமதியான நூல்ககளை அன்பளிப்புச் செய்துள்ளது.

இதற்கும் மேலால் சர்வதேச நூல் உதவி நிறுவனத்தினால் தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபைக்கு வழங்கப்பட்ட 2271 நூல்கள் 75 நூலகங்களுக்கிடையே பகிர்ந்தளிக்கப்பட்டன.

## தேசிய நூலகப் பேருரைகள்

2002 ஒக்ரோபர் தொடக்கம் 2003 மார்ச் வரையிலான காலப்பகுதியில் தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபையினால் ஆறு தலைப்புக்களில் பேருரைகள் நடத்தப்பட்டன.

# பிற நூலகச் செய்திகள்

## கணனிப் பயிற்சிப் பட்டறை

வடமத்திய மாகாணத்தின் உள்ளுராட்சி நிறுவனங்கள் மற்றும் விசேட நூலகங்களில் நூலகர்கள் மற்றும் சகல நூலக ஊழியர்களுக்கும் கணினிப் பயிற்சிப் பாடநெறி ஒன்று 2003.02.26 அம் திகதி ராஜரட்ட பல்கலைக்கழகத்தில் நடத்தப்பட்டது. இப் பாடநெறியானது ராஜரட்ட பல்கலைக்கழகத்தின் துணைவேந்தர் பேராசிரியர் விஜேரத்ன அவர்களின் தலைமையின் கீழும் பல்கலைக்கழக நூலகரும் வட மத்திய மாகாண நூலகச் சங்கத்தின் தலைவர் காமினி த சில்வா அவர்களின் மேற்பார்வையின் கீழும் நடத்தப்பட்டது.

இப் பாடநெறியின் மூலம் கணனியை எவ்விதம் நூலக சேவைகளின் பொருட்டு உபயோகப்படுத்துவது என்பது தொடர்பாக கோட்பாட்டு ரீதியிலும் செயல்முறையிலும் பயிற்சி வழங்கப்பட்டது.

## சர்வதேச பாடசாலை நூலக தினம் தொடர்பான தேசிய விழா

சர்வதேச பாடசாலை நூலக தினத்தைக் கொண்டாடு முகமாக தேசிய மட்டத்தில் நூலகமும் - புது உலகமும் என்னும் தலைப்பின் கீழ் 2002.10.28 ஆம் திகதி அநுராதபுர மத்திய மகா வித்தியாலயத்தில் விழா ஒன்று நடத்தப்பட்டது. அன்றைய தினம் மாகாண மட்டத்தில் பல பாடசாலைகள் இதில் பங்குபற்றியதுடன் வாசிப்புப் பழக்கத்தை ஊக்குவிக்கும் செயற்றிட்டத்தை பாடசாலை மட்டத்தில் வியாபிப்பதற்கும் நடவடிக்கை எடுக்கப்பட்டது. இதற்கு அமைய நூலக வாரத்தை தேசிய மட்டத்தில் பிரகடனப்படுத்தும் மற்றும் நூலகர்களை பயிற்றுவிக்கும் தேசிய செயற்றிட்டம் ஆரம்பிக்கப்பட்டது.

இத் தேசிய விழாவானது பாடசாலை கல்வி அமைச்சர் கௌரவ சுரநிமல ராஜபக்ஷ மற்றும் வட மத்திய மாகாண முதல் அமைச்சர் திரு பர்ட்டி பிரேமலால் திஸாநாயக்க அவர்களின் தலைமையின் கீழ் மனித வள அபிவிருத்தி கல்வி மற்றும் கலாசார அலுவல்கள் அமைச்சும் பாடசாலை கல்வி அமைச்சின் பாடசாலை நூலகப் பிரிவும் இணைந்து இலங்கை நூல் வெளியீட்டாளர் சங்கம் மற்றும் சமஸ்த இலங்கை நூல் விற்பனையாளர் சங்கம் ஆகியவற்றின் உதவியுடன் ஒழுங்குபடுத்தப்பட்டிருந்தது.

## பிட்டிபன சிறிசுமன ஞாபகார்த்த நூலகத்தை திறந்து வைத்தல்

தலங்கம கொஸ்வத்தையில் உள்ள சிறி நந்தாராம விகாரையில் வாசம் செய்து காலமாகிய பிட்டிபன சிறிசுமன தேரரின் ஞாபகார்த்தமாக அவருடைய சிரேஷ்ட மாணவர்களும் தற்போதைய விகாராதிபதியும் தற்போது மலேசியாவில் வாசகம் செய்யும் புட்டாவத்தை சரணங்கர தேரர் உட்பட பல மலேசிய செல்வந்தர்களினால் கட்டி முடிக்கப்பட்ட பிட்டிபன சிறிசுமன நாயக்க தேரர் ஞாபகார்த்த நூலகம் 2002.12.22 ஆம் திகதி கொழும்பு புதிய தொட்டட முனை பிரதான சங்கநாயக்க தேரர் திவியகஹ யசஸ்சி அவர்களினால் திறந்து வைக்கப்பட்டது. இச் சந்தர்ப்பத்தில் புட்டாவத்தை சரணங்கர தேரர் உட்பட மகா சங்க நாயக்கரும் மலேசியாவின் சில பிரமுகர்களுக்கு பிரதேச பாராளுமன்ற உறுப்பினர்களும் கலந்து கொண்டனர்.

# National Library News

## Training Programmes

- A four - day training programme for public librarians of the North Eastern Province was held from 18-21 Oct 2002 at the Jaffna Public Library.
- Two training programmes were held for pirivena librarians at Sri Sarananda Pirivena, Anuradhapura from 30 Oct to 2 Nov 2002 and at Weherapitiya Pirivena in Polgahawela from 5-8 February 2003
- In-service training programmes were held at the NLDSB for the students of Sri Lanka Library Association (SLLA) and for the library staff of Asian Aviation Centre (Pvt) Ltd
- Training programmes on library management were held at the NLDSB for the library staff of the Sri Lanka Police Department and the Heads of the Government Departments and Organisations
- Training programme on CD-ROM Searching was held for two Bangladesh trainees at the NLDSB.

## Workshops

- A two day workshop on Community Development was held on 29 Oct and 31 Oct 2003 at the NLDSB for the officers attached to the local government offices in the Western Province.
- Two workshops on library automation and usage of the Internet and e-mails in communication were held on 17 & 18 December 2002 at the NLDSB.
- A three-day workshop on conservation & book-binding was held from 27-29 Nov 2002 at the NLDSB.

## Seminars

- ★ Two seminars were held to mark the International School Library Day on 28 Oct 2002 at the NLDSB for school librarians in both Sinhala and Tamil medium
- ★ A seminar on research methodology was held on 11 Dec 2002 at the NLDSB for the new researchers in the field of Social Sciences & Humanities
- ★ A two-day seminar was held on 27 & 28 March 2003 for school librarians of Gampaha District

## Book Exhibitions

The following book exhibitions were organized by the NLDSB.

| Date | Venue |
|---|---|
| 18 Oct 2002 | Mahamaya Balika Vidyalaya, Kandy |
| 28-29 Oct 2002 | Central College, Anuradhapura |
| 26-28 Nov 2002 | National School, Dehiowita |
| 20-24 Mar 2003 | Baddegama Public Library |

## Grading of Libraries

Library of the Department of Animal Production and Health was upgraded to Grade I while Public Library Giriulla and Public Library Buttala were upgraded to Grade II.

## Book Donations

The NLDSB has taken action to donate books worth of Rs. 4,79,446.00 among 130 school, public & pirivena libraries. Apart from that, 2271 books received under the International Book Aid Project were donated to 75 libraries in Sri Lanka during the period from Oct 2002 to March 2003.

## National Library Lecture Series

The following lectures were conducted as National Library Monthly Lectures from Oct 2002 to March 2003.

| Lecturer | Lecture Title |
|---|---|
| Prof. Russel Bowden | IFLA 2002 Glasgow; A Report |
| Mr. Punchi Banda Gallaba | ළමා පුස්තකාලයාධිපතිත්වය - තායිලන්ත අත්දැකීම් |
| Mr. Dhanapala Gunasekara | පරිවර්තන කලාව; මගේ අත්දැකීම් |
| Prof. M.O.A. de Soysa | පෙඩරල් ආණ්ඩුක්‍රමය පිළිබඳ හැඳින්වීමක් |
| Mr. Shantha K.Herath | පුවත්පත් කලාව තුළ දේශපාලන කාටූනය |
| Ms. Menaka Kumari, Mr.Nihal Pushpakumara | පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණය පිළිබඳ මැලේසියාවේ දී සහ ඉන්දියාවේ දී අප ලද අත්දැකීම් |

# Other Library News

## Training Programme on IT

A computer training programme for librarians and all other library staff in the North-Central province was held on 26-02-2003 at the University of Rajarata . This was done under the supervision of the Librarain, University of Rajarata & the Chairman, Librarians' Association of the North Central province.

## Handicrafts Exhibition & Sale

An exhibition and sale of handicrafts made by members of the public libraries in the Negombo municipality area was organized on 18 & 19 Dec 2002 at the Town Hall, Negombo.

## National Programme on International School Library Day

The national programme on International School Library Day was held on 28 Oct 2002 at the Central College at Anuradhapura under the theme, Library : A New World, under the patronage of the Ministry of School Education. Mr. Suranimala Rajapaksha, Minister of School Education & Mr. Berty Premalal Dissanayake, Chief Minister of the North Central Provincial Council were the chief guests at this national event. The week begins from the International School Library Day was declared as the National School Library Week.

The National Institute of Library and Information Sciences (NILIS) organised two day workshop on 24 & 25 of October to celebrate the International School Library Day

## International Children's Day

The Children's Section of the Horana Public Library organised a prgramme to celebrate the International Children's Day.

## LIS Training Programme

The library of Ruhuna University has organised a training programme on Library and Information Science (LIS) from 21 - 31 Oct 2003

# ප්‍රායෝගික පුස්කොළ ලේඛන කලාවේ දුර්ලභ ශිල්ප ක්‍රම

**ජාතික කෞතුකාගාර පුස්තකාලයේ උපාලි ඕ.ප්‍රනාන්දු මහතා විසින් "ජාතික පුස්තකාල දේශන මාලාව" වෙනුවෙන් 1994.09.28 දින පවත්වන ලද දේශනයක් ඇසුරින් සකස් කරන ලදී.**

ප්‍රායෝගික පුස්කොළ ලේඛන කලාවේ දුර්ලභ ශිල්ප ක්‍රම පිළිබඳව සාකච්ඡා කරන විට ශ්‍රී ලංකාවේ පුස්කොළ පොත් ලේඛන කලාව ඉතා වැදගත්, එමෙන් ම දුර්ලභ ශිල්ප ක්‍රමයක් වේ. වර්තමානයේ ලේඛන කටයුතු සඳහා විවිධ වූ නූතන ශිල්ප ක්‍රම භාවිත කෙරෙන බැවින් මෙවැනි වූ දුර්ලභ ශිල්ප ක්‍රම අනුව ලේඛන බිහිවන්නේ ඉතාමත් අල්ප වශයෙනි. එබැවින්, මෙම ශිල්ප ක්‍රමය අද අභාවයට යමින් පවතී.

පුස්කොළ පොත සකස් කරනු ලබන්නේ තලකොළවලිනි. කිසිවක් නොලියූ කොළය "පු කොළය" වන අතර එම කොළ එකතුව "පු ගෙඩිය" වශයෙන් හඳුන්වයි. ඒ අනුව එය පුස්කොළ පොත යනුවෙන් හැඳින්වේ.

## පුස්කොළ පොතක ව්‍යුහය

පුස්කොළ පොතක පිටකවරය ලී පතුරුවලින් සකසා ඇත. මෙය "කම්බය" ලෙස හඳුන්වනු ලැබේ. අතීතයේදී ලාක්ෂා, තඹ, රිදී, ඇත් දළ ආදිය මෙම කම්බ සැදීම සඳහා යොදා ගන්නා ලදී. පුස්කොළ පොතෙහි කොළ එකිනෙක තදින් බැඳ තැබීම සඳහා බොත්තමක් සහිත නූලක් යොදාගෙන ඇත. මෙම බොත්තම තඹ, රිදී ආදී ලෝහයන්ගෙන් සාදා ඇත. පුස්කොළ පොතක පිටු, පත් ඉරු වශයෙන් හැඳින්වෙන අතර, ඒවා තල් කොළවලින් සකස් කර ඇත.

## පුස්කොළ පොතක නිෂ්පාදනය

පුස්කොළ පොතක් නිෂ්පාදනය කිරීම ප්‍රධාන අවස්ථා හතරක් යටතේ දැක්විය හැකිය.

### 1. පත්ඉරු සකස් කිරීම

තල් ගසෙහි ගොබය කපා තම්බා මැදීමෙන් පත්ඉරු සකස් කර ගැනීම සිදු වේ. මෙසේ පත් ඉරු සකස් කිරීම ඉතා සූක්ෂම ව ඉටු කළ යුතු කාර්යයක් වන අතර, එම ශිල්ප ක්‍රමය ප්‍රගුණ කරන ලද පිරිස් එම කාර්යය සඳහා යොමුව ඇති බව දක්නට ලැබේ.

### 2. පන්හිඳ භාවිත කර ලිවීම

මෙය ඉතා සූක්ෂම ව කළ යුතු ලේඛන කලාවකි. පන්හිඳ කරකවා අකුරු ලිවීම ඉතා අසීරු කාර්යයක් වන අතර, එසේ ලිවීමට නම්, කෙනෙකු විසින් එම ශිල්ප ක්‍රමය ප්‍රගුණ කළ යුතුම ය. මේ සඳහා අත් දෙක ම භාවිත කිරීමට හැකියාව තිබිය යුතුය. වර්තමානයේ මෙම හැකියාව ඇති අය ඉතා දුර්ලභය.

පළමුවෙන්ම ශිෂ්‍යයා විසින් වැලිපිල්ලේ ලිවීමට හුරුවිය යුතුය. ඉන් පසුව ගුරුවරයා විසින් ශිෂ්‍යයා හට ලබා දෙනු ලබන මුල්ම පාඩම වන්නේ උල්කටුව භාවිත කරන ආකාරය පුහුණු කිරීමයි. ගුරුවරයා විසින් අඳිනු ලබන අකුර මත තරමක් මොට වූ උල් කටුවකින් නැවත නැවත ලිවීම මගින් ශිෂ්‍යයා ඔහුගේ අත හුරු කරගත යුතුය. ඉන් අනතුරුව උල්කටුව භාවිත කිරීමටත්, අවසානයේ පන්හිඳ භාවිතයටත් ශිෂ්‍යයාට අවස්ථාව ලැබේ. ලිවීමේ දී ඇඟිලිතුඩු වෙනස් නොකළ යුතු අතර, අංශක 30 ක ආනතියකින් පන්හිඳ අල්ලා ලිවීම කරනු ලැබේ. එය අල්ලන ක්‍රමය අනුව අකුරු ලොකුවට හා හීනිවට ලිවීම සිදුවේ. බටහිර ජාතීන් අතර ද පුස්කොළවල ලිවීමේ කලාව දක්නට ලැබේ. අපගේ ශිල්ප ක්‍රමය ම ඔවුන් අනුගමනය කර ඇතත්, ඔවුහු වැලමිට භාවිතයෙන් ලිවීම සිදු කිරීම විශේෂත්වයකි.

පුස්කොළ පත් ලේඛන ක්‍රමය සඳහා යොදා ගන්නා පන්හිඳ විශේෂ උපකරණයක් වන අතර එය කොටස් පහකින් යුක්තය.

1. ඡත්‍රය
2. පත්‍රය
3. නාලය
4. ගණ්ඩය
5. ලේඛනය

පන්හිඳ සකස් කර ගන්නා ආකාරය සංස්කෘත ලේඛනවල දක්වා ඇත. ඒ අනුව සකස් කරන ලද පන්හිඳ ක්‍රමානුකූල වේ.

### 3. කළු මැදීම

පත් ඉරුවල ලියන ලද අකුරු කියවීමට පෙනෙන සේ සකස් කිරීම "කළු මැදීම" යන විශේෂ ක්‍රියාවලියෙන් සිදු වේ.

කළු මැදීම සඳහා අඟුරු හා දුම්මල තෙල් භාවිත කරනු ලැබේ. අඟුරු කුඩුකර හලාගත් පසු එයට දුම්මල තෙල් මිශ්‍ර කිරීම සිදු වේ. මෙම මිශ්‍රණය පත් ඉරුමත පිරිමැදීමෙන් පසු ලියන ලද අක්ෂර කියවීමට හැකි අයුරින්, පැහැදිලිව දිස් වේ. මෙම දුම්මල තෙල් නිසා පුස්කොළය පදම් වී නම්‍යතාවක් හට ගනී. පත්ඉරු කෘමීන්ගෙන් ආරක්ෂා කර ගැනීමට ද මෙම මිශ්‍රණය ඉවහල් වේ. මේ නිසා පුස්කොළ පොත් නිෂ්පාදනයේදී කළු මැදීම අත්‍යවශ්‍ය ක්‍රියාවලියකි. මේ ආකාරයෙන් සකස් කරන ලද පුස්කොළ පොතක් අවුරුදු දහස් ගණනක් වුව ද තබා ගැනීමට හැකියාව ඇත. කොළඹ, ජාතික කෞතුකාගාරයේ ඇති වර්ෂ 700 ක් පමණ පැරණි පුස්කොළ පොත් මීට උදාහරණ වේ.

### 4. පොත සැකසීම

ලියන ලද හා කළු මදින ලද පත් ඉරු එකට එකතු කොට නූල් යොදා බැඳ කම්බ යොදා පොතක් වශයෙන් අවසානයේ සකස් කරනු ලැබේ.

පුස්කොළ පොත් ලේඛනගත කිරීමේ ශිල්ප ක්‍රමය ගැන කතා කිරීමේ දී ඒ පිළිබඳව තොරතුරු එනම්, පොත අල්ලා ගන්නා ආකාරය, ලිවීමේ දී පන්හිඳ හැසිරවිය යුතු ආකාරය, ඒ සඳහා අසුන්ගත යුතු ආකාරය ආදී තොරතුරු රාශියක් සඳහන් වන්නේ ශ්‍රී ලංකාවේ ඓතිහාසික ග්‍රන්ථයන්හි නොව විදේශීයයන්ගේ සටහන්වලයි. මෙම ශිල්ප ක්‍රමය ශ්‍රී ලංකාවට ආවේණික වූ නමුත් විදේශිකයන්ට විශේෂිත වූ දෙයක් වීම මෙයට හේතු වන්නට ඇත.

සේද මාර්ගය නොහොත් මධ්‍යම ආසියාවේ දහසක් බුදුන්ගේ ගුහාවේ 8, 9 සියවස්වලට අයත් චිත්‍රවල පුස්කොළ පොතක් හා උලක් ඇතැතිව ලේඛන කලාවේ යෙදෙන්නෙකු දක්නට ලැබේ. මේ පිළිබඳව දැනට ඇති පැරණි ම චිත්‍රය මෙය වේ.

එසේම, ක්‍රි.ව. 1681 දී රොබට් නොක්ස් විසින් ඔහුගේ ග්‍රන්ථයන්හි පුස්කොළපත් ලේඛන කලාව පිළිබඳව සඳහන් කර ඇත. 1870 දී ජෝන් ඩේවි විසින් ද මෙම ශිල්ප ක්‍රමය පිළිබඳව හැඳින්වීමක් කර ඇත. මීට අමතරව, ශ්‍රී ලංකාවේ ලේඛන කලාව පිළිබඳව මනා අධ්‍යයනයක් කළ ප්‍රවීණයෙකු වූ ආනන්ද කුමාරස්වාමි මහතා ඔහුගේ "මධ්‍යකාලීන සිංහල කලා" නම් ග්‍රන්ථයෙහි පුස්කොළපත් ලිවීම පිළිබඳව සඳහන් කර ඇත.

පුස්කොළ ලිවීම සම්බන්ධ දේශීය චිත්‍රයක් දක්නට ඇත්තේ කැලණි විහාර සිතුවම්වලය. එය 1930-1948 අතර කාලයේ සෝලියස් මැන්දිස් මහතා විසින් අඳින ලද චිත්‍රයක් වේ. පෑනෙන් කඩදාසිවල ලියනවාට වඩා මෙය වෙනස් වූ ශිල්ප ක්‍රමයක් බව ද එහි සඳහන් වී ඇත.

1815 දී ඇහැලේපොල අධිකාරම් හා ජෝන් ඩේවි මහතා අතර සිදු වූ සාකච්ඡාව සහිත චිත්‍රයක මොහොට්ටාල කෙනෙකු පුස්කොළ පොත්වල සටහන් තබනු සිතුවම් කර ඇත.

හින්දු බ්‍රාහ්මණයෙකු විසින් අඳින ලද චිත්‍රයක ද පන්හිඳ මිට මොලවා ගත් කෙනෙකුගේ රූපයක් සිතුවම් කර තිබෙනු දක්නට ඇත. එහි සඳහන් පන්හිඳ ශ්‍රී ලංකාවෙහි භාවිත වන පන්හිඳට වඩා මදක් පැතලි ස්වරූපයක් ගෙන ඇත.

මෙම ශිල්ප ක්‍රමය ප්‍රගුණ කිරීම සඳහා මනා හික්මීමක් මෙන් ම කැපවීමක් ද තිබිය යුතුය. ශ්‍රී ලංකාවේ පුස්කොළ පොත් ලිවීමේ කලාවෙහි වෘත්තීයමය වශයෙන් යෙදී සිටින පිරිස ඉතා අල්පය. පැරණි පුස්කොළ පොත් සඳහා විදේශයන්ගෙන් ද ඉල්ලුමක් ඇති බැවින්, පුස්කොළ ලිවීමට හුරුවීමෙන් හොඳ ආදායම් මාර්ගයක් තනා ගත හැකි වේ. පුස්කොළ පොත් ලිවීමේ කලාව ඉදිරියට ද රැක ගැනීමට නම් ඒ සඳහා අනුග්‍රහයක්, පිළිගැනීමක් මෙන් ම අගය කිරීමක් ද කළ යුතුව ඇත.

**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය**
**තොරතුරු සන්නිවේදන තාක්ෂණය (ICT) පිළිබඳ වැඩමුළු**

තොරතුරු සන්නිවේදන තාක්ෂණය (ICT) පිළිබඳව ප්‍රායෝගික හා න්‍යායාත්මක වැඩමුළු ගණනාවක් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මගින් සංවිධානය කර ඇත.

**කා සඳහා ද** - පුස්තකාල හා තොරතුරු ක්ෂේත්‍රයේ රැකියාවන්හි නියුක්ත වූවන් සඳහා

**විෂය ක්ෂේත්‍රය** -
- පුස්තකාල ස්වංක්‍රියකරණය සැලසුම් කිරීම
- මෘදුකාංග තෝරා ගැනීම හා භාවිතය
- සංයුක්ත තැටි ගවේෂණය
- අන්තර්ජාලය භාවිතයෙන් තොරතුරු ගවේෂණය, දත්ත පදනම් භාවිතය හා නිර්මාණය

**කාලය** - දින 02

**වැඩමුළු ගාස්තු** - එක් අයෙකු වෙනුවෙන්
රු.2000/=
එක් ආයතනයකින් සහභාගි වන දෙදෙනෙකු වෙනුවෙන්
රු. 3500/=

**විමසීම**

අංශ ප්‍රධාන
අධ්‍යාපන හා පුහුණු අංශය
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
අංක 14, නිදහස් මාවත, කොළඹ 07
දුරකථනය : 011-2685196

National Digitization Project

*National Science Foundation*

Institute : National Library and Documentation Services Board

1. Place of Scanning : National Library and Documentation Services Board, Colombo 07

2. Date Scanned : 2017/10/11

3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara

4. Scanning Officer

Name : N.P.R. Gamage

Signature : [signature]

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

Certifying Officer

Designation : Library Documentation Officer

Name : Iromi Wijesundara

Signature : [signature]

Date : 2017/10/11

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*